ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත



නැවතත් හැරී එන විශ්වාසිකයන් පිළිගන්නට සූදානම් විය යුතු බවයි.

**ක්‍රිස්තියානි මූලධර්මවාදීනට ආරාධනා!**

3 පිටුව



**සෑම ගබ්සාවක්ම දෙවිඳු සැලැස්මට එරෙහි වීමක්**

"නූපන් දරුවාගේ දිනය" වෙනුවෙන් ශ්‍රී ලංකා රදගුරු සම්මේලනය නිකුත් කළ නිවේදනය

8 පිටුව



මහා මෙරක් වූ කුඩාමල සහ මහ මෙහෙවර ලිපි මාලාවේ අවසන් ලිපිය

**"සභා මාතාව තුළ ආදරය වෙමි මම"**

13 පිටුව



**2010 වසරේ හොඳම ආගමික පුවත්පත**

ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07



**"නූපන් දරුවාගේ දිනය" නොවැම්බර් 11 දා**

ක්‍රි.ව. 2012 ක් වූ නොවැම්බර් 04 ඉරිදා 147 වෙළුම 23 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

# ගබ්සා නීති ලිහිල් කරනවාට විරෝධය පා

# "නූපන් දරුවාගේ දිනය" නොවැම්බර් 11 ඉරිදා

## ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය නිවේදනය කරයි

**ජීවිතය ප්‍රතික්ෂේප කරන සෑම ගබ්සාවක්ම දේව සැලැස්මට එරෙහිවීමක් නිසා සාන්ත සභාව සෘජු ගබ්සාව නුසුදුසු යැයි ප්‍රකාශ කළ අතර ගබ්සා නීති ලිහිල් කිරීමට දරන වෑයම පරාජය කරමින් කතෝලික ජනතාව, පෙළගැස්වීම සඳහා 2012 නොවැම්බර් 11 ඉරුදින "නූපන් දරුවාගේ දිනය" ලෙස ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය ප්‍රකාශයට පත්කර ඇත. සියලු රදගුරු වසම්වල යාච්ඤාවේ හා නිරාහාරශීල රැකීමේ විශේෂ දිනයක් ලෙස එදින පවත්වන්නැයි ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය ඉල්ලා සිටී.**

අදාළ අමාත්‍යාංශය යෝජිත පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළහොත් එදිනම ඉරුදින දිව්‍ය පූජාවෙන් පසු දේවස්ථාන භූමියේ හෝ ඒ අසළ හෝ ඊට විරුද්ධව සාමකාමීව විරෝධය පළ කරන ලෙසත්, විරෝධය පළ කිරීමේ සංකේතයක් ලෙස ඇඳුම්වල කළු පටියක් පළඳින ලෙසත් ඉල්ලා සිටී. (සම්පූර්ණ නිවේදනය මැද පිටුවල)

## කතෝලික සභාවේ සොව පළවේ

සැන්ඩි සුළි කුණාටුවෙන් විපතට පත් කැරිබියාන සහ ඇමෙරිකාන ජාතීන් වෙත සිය සහයෝගීතාවයේ දෑත් දිගු කරන බව අති උත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ප්‍රකාශ කරයි. පීඩාවට පත්වූවන්ට ආධාර උපකාර කිරීමත් විපතට පත්වූවන්ගේ ඥාතීන්ගේ දුක් වේදනා සමනය කර ගැනීමට අවැසි ශක්තිය පතා දෙවිඳුන්ට යාච්ඤා කරන බව ද උන්වහන්සේ සහතික වූහ. මේ අතර එදා සුනාමි විපතේදී ශ්‍රී ලාංකිකයන්ගේ ආධාරයට විගස ඉදිරිපත් වූ ඇමෙරිකාන ජනතාවගේ නොමසුරු දායකත්වය හද පත්ලෙන් සිහිකරන ශ්‍රී ලාංකීය කතෝලික ජනතාව සිය යැදුම් වලදී විපත්පත් සියලු ජනතාව සිහිපත් කරති.

## නැසීගිය නි.ම.නි. පැවිදිවරුන් සැමරේ

නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ බොරැල්ල කනත්තේ මිහිදන් කළ සහ නැසීගිය සියලුම නි.ම.නි. පැවිදි පියතුමන් සහ සහෝදරතුමන් වෙනුවෙන් දිව්‍ය යාගයක් බොරැල්ල කනත්තේ රෝමානු කතෝලික දෙව්මැඳුරේදී 2012 නොවැම්බර් 05 වන සඳුදා දින සවස 4.00 ට පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. මෙම සිහි කිරීමේ දිව්‍ය යාගයට සහභාගි වන ලෙස සියලු නි.ම.නි. පැවිදි පියතුමන්ටත්, සහෝදරතුමන්ටත්, ඔවුන්ගේ පවුල්වල අයට හා නෑදෑ හිතමිතුරන්ටත් කාරුණිකව ආරාධනා කරමු.

## දැනුවත් කිරීමයි

2012 නොවැම්බර් 01 දින සිට දීප ව්‍යාප්තව එෆ්. එම්. නාලිකාවල තරංග මාලා වෙනස්වන බව දන්වා සිටී. මේ අනුව ගුවන් විදුලි සංස්ථාවෙන් ප්‍රචාරය වන කතෝලික වැඩසටහන්

- ★ ඉංග්‍රීසි වැඩසටහන් තරංග 97.4 සහ 97.6
- ★ සිංහල වැඩසටහන් තරංග 91.07(කොළඹ), 91.09 (පිට) ඔස්සේ ප්‍රචාරය වේ.

## "උපත"ට නිර්මාණ

"උපත" නත්තල් සඟරාව සඳහා නිර්මාණ භාර ගැනීම දැන් සිදුවේ. ඔබේ ගද්‍ය, පද්‍ය ලිපි, රචනා ආදිය "උපත", සංස්කාරක ප්‍රියන්ත, නිමල මරිය මාවත, වෙන්නප්පුව ලිපිනයට එවන්න. ඒ සමඟ ඔබේ ලිපිනය සහ දු.අංකයද සඳහන් කරන්න.

## මීගමුවට අත තියන්න එපා...

### කාදිනල් හිමිපාණෝ මීගමුවේදී පවසති

දරුවන් දෙවියන් වහන්සේගෙන් අපට ලැබුණු ත්‍යාගයකි. දරුවන් මීගමුවේ උතුම්ම සම්පතය. එම ළමා ජීවිතයේ පරිශුද්ධතාවය ආරක්ෂා කර දීම අප සැමගේ යුතුකමයි. ළමා ජීවිතය සඳහා දරුවන්ට අයිතියක් ඇත. තවද දෙමාපිය ආදරය ලැබීමට, අධ්‍යාපනය ලැබීමට, යහපත් ජීවිතයක් ගත කරන්නට, යහපත තෝරා ගන්නට ද දරුවන්ට අයිතියක් ඇත. පක්ෂ විපක්ෂ දේශපාලකයන්ට හෝ ධනවතුන්ට හෝ ව්‍යාපාරිකයන්ට හෝ මෙම ළමා අයිතීන් දරුවන්ගෙන් උදුරාගන්නට නොහැකිය. දරුවන්ගේ ජීවිත රැකගැනීමට එකමුතු වන්නැයි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ පැවසූහ.

15 පිටුවට ▶



මීගමුවේ සාමකාමී පා ගමනට එක්වෙමින්...

## සහභාගිශීලි සභාවක් ගොඩනැංවීමේ කාර්යය කුඩා කිතුනු සංඝ සතුයි

### අසිපා හයවැනි අන්තර්ජාතික සමුළුවේදී රැව්දේ!

✍ සිරිල් අන්ඩ්‍රාඩෝ විසිනි



කුඩා කිතුනු සංඝ (අසිපා) සයවැනි අන්තර්ජාතික සමුළුව නයිනමඩම "චින්තන" මධ්‍යස්ථානයේදී ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 16 ක සහභාගිත්වයෙන් පැවැත්විණ. තෙවසරකට වරක් පැවැත්වෙන මේ ජාත්‍යන්තර සමුළුව මීට පෙර තායිලන්තයේ දෙවරක් ද කොරියාව, ඉන්දියාව, පිලිපීනයේ ද පවත්වා ඇත.

15 පිටුවට ▶

## ලෝක රදගුරු සංසදයේදී නව ධර්මදානය වෙනුවෙන් යෝජනා මාලාවක්

**ලෝක රදගුරු සංසදයට එක්වූ රදගුරු හිමිපාණෝ ආගමික නිදහස විමර්ෂණයට කොමිසමක් පිහිටුවන ලෙසත්, ධර්මදූතවරුන් පුරුදු පුහුණු කිරීමට වඩාත් දියුණු මාර්ගෝපදේශ මාලාවක් සකස් කරන ලෙසත්, සෑම කතෝලික රදගුරු වසමක අඩු තරමින් එක් දෙව්මැඳුරක නිතිපතා පාපොච්චාරණයේ සක්‍රමේන්තුව ලබා ගැනීමට අවකාශ සලසා දෙන ලෙසත් යෝජනා කළහ.**

ලොව විවිධ රටවලින් (චීනයෙන් හැර) එක්වූ රදගුරු හිමිපාණන් 262 නමකගේ සහභාගිත්වයෙන් පුරා සති තුනක් මුළු දුන් සංසද රැස්වීම් මාලාව අවසානයේ යෝජනා 58 කින් සමන්විත ලේඛනයක් ශුද්ධෝත්තම පියතුමාට භාර දුන්නේය. රදගුරු සංසද නීතිරීති වලට අනුව ඒවා රහස්‍ය බවක් ගත්තද අති උතුම් සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා සෙනසුරාදා දිනයේම ඒවා ප්‍රකාශනයට වගකීම භාර ගත්තේය.

15 පිටුවට ▶

## මඩු පුදබිමට රජයේ අවධානය යොමුවීම වැදගත්

### සිද්ධස්ථාන පාලක පියතුමා අවධාරණය කරයි

✍ ඒන්ස්ලි ජෝශප් විසිනි

යුද්ධය අවසන් වීමෙන් පසු සෑම සති අන්තයකම සැදැහැවතුන් 4,000 සිට 7,000 දක්වා පිරිසක් මරුද මඩු කඳවුරේ වන්දනාව සඳහා පැමිණෙන අතර, ඉකුත් ඔක්තෝබර් ජපමාල මංගල්‍යයට 30,000 කට අධික පිරිසක් සහභාගි වූහ.

තිරසාර ජලසම්පාදනය හා නිරන්තර විදුලිය සැපයුම මඩු කඳවුරට බලපාන ප්‍රධාන ගැටලු බැව් මඩු සිද්ධස්ථාන පාලක ගරු එස්. එමලියානුස්පිල්ලේ පියතුමා ප්‍රදීපයට පැවසීය. රජය මෙහිලා මේ ගැටලු වලට යම් යම් පියවර ගෙන ඇතැයි පැවසූ එතුමා ඒ ගැන රජයට තුති පුදමින් අර්ථවත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පෙන්නා දුන්නේය.

15 පිටුවට ▶

## 2012 ජාතික පාසල් ශූරතාව සා. ලෝරන්ස් කණ්ඩායමට



පසුගියදා නුගේගොඩ සා. ජෝශප් බාලිකා පැසි පන්දු පිටියේදී නිමාවට පත්වුණු අධ්‍යාපන අමාත්‍යංශය විසින් සංවිධානය කරන ලද සමස්ත ලංකා ජාතික පාසල් පැසි පන්දු තරගාවලිය අපරාජිතව ජය ගැනීමට වැල්ලවත්ත සා. ලෝරන්ස් කන්‍යාරාමයේ 19 පහළ පැසිපන්දු කණ්ඩායම සමත්වූහ. **(ෂර්ලින්)**

**"නුඹේ මුළු හෘදයෙන් දෙව් ස්වාමින් වහන්සේට ප්‍රේම කළ යුතුය." (ද්.නී.ස. 6:2-6)**

පදවියෙන් පදවියට

# කාන්තා අයිතීන් රැකීමට කියා ගබ්සා කිරීම සදාචාරාත්මක නොවේ

## රත්නපුර රදගුරු හිමිපාණෝ අවධාරණය කරති

ගබ්සාව හෙවත් නූපන් කළල ඝාතනය ශ්‍රී ලංකා රජය විසින් නීතිගත කිරීමේ තර්ජනයකට දැන් අපට මුහුණ පාන්නට සිදුවී ඇත. මෙය වනාහි රටේ සිදුවී ගෙන යන අපරාධ රැල්ලට තවත් මිනීමැරුම් රැල්ලක් එකතු කිරීමකි. මෙය සාධාරණය කරන සමහරුන් නගන තර්කයක් නම් ගැබ් දැරීමක් එල ගැන්වීමට හෝ නිශ්ඵල කිරීමට. ගැබ්දැරූ කාන්තාවට පූර්ණ අයිතියක් ඇති බවයි. මව් කුස තුළ සිටින දැරු පැටියා ක්‍රෑර ලෙස මරා දැමීමෙන් කාන්තා අයිතිය රැකීම කිසිසේත් සදාචාරාත්මක නොවේ." යැයි රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා සා. බෙ. නි. රදගුරු හිමි කෑගල්ල සා. මරියා දෙව්මැඳුරේ වාර්ෂික මංගල්ල දිව්‍ය පූජාවේදී පැවසීය. එහිදී වැඩිදුරටත් කථා කළ රදගුරු හිමි මෙසේද පැවසීය. "මව් කුසයෙහි ගැබ් දැරු මොහොතෙහි පටන් දරුවාගේ ජීවිතය පූර්ණ මිනිස් ජීවිතයකි. එම දරුවාට හෝ දැරියට මිනිසකු ලෙස මෙලෝ එළිය දැකීමට පූර්ණ අයිතියක් ඇත. නූපන් දරුවාගේ ලස්සන ලෝකය මව්කුසයයි. දරුවකු ක්‍රෑර ලෙස මව්කුසයේදීම හිතා මතා ඝාතනය කිරීම සාපරාධී අපරාධයකි. එම දරුවාගේ ජීවත් වීමේ අයිතිය උල්ලංඝනය කිරීමකි.

සැම් ද සිල්වා හේවාවසම්

### විල්ලෝරාවත්ත මංගල්‍යය අදයි

විල්ලෝරාවත්ත සා. චාල්ස් බොරෝමයෝ මුනිඳුන්ගේ දෙව්මැඳුරේ 116 වැනි වාර්ෂික මංගල්‍යය ග්‍රාමයේ පූජක පුත් කොළඹ සහායක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් අද පැවැත්වීමට මීසම් සේවක ගරු ටෝනි පින්තු පියතුමා සමඟ මීසම් සභාව කටයුතු සංවිධාන කර ඇත.

ට්‍රිසිල් ඇෆ්. මැන්දිස්

# දේව සේවක කාදිනල් කුරේ හිමි අනුස්මරණය කෙරේ

දේව සේවක තෝමස් කාදිනල් කුරේ නි.ම.නි හිමිපාණන්ගේ ජීවිතය තුළ දේව දයාව, ආදරය සහ නොසැලෙන විශ්වාසය කැපී පෙනුණත් එවැන්නන් මිය නොගොස් සදහට ජීවත් වෙනවා. අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් එතුමන් වෙනුවෙන් සිහිවටන ගොඩනගනවා වෙනුවට ශුද්ධවරයට එසවීමේ කටයුතු ආරම්භ කළා.

ක තෝ ලි ක ජනසන්නිවේදන ජාතික අධ්‍යක්ෂ හා අගරදගුරු පදවි මාධ්‍ය ප්‍රකාශක ගරු බෙනඩික් ජෝශප් පියතුමා තේවත්ත ජාතික බැසිලිකා සිද්ධස්ථානයේ පැවති දෙව් සේවක කාදිනල් කුරේ හිමිපාණන් ගුණානුස්මරණ දේව මෙහෙයේදී ප්‍රකාශ කළේය. කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් හිමිපාණන් විසින් මේ දේව මෙහෙය පවත්වන ලදි.

දේව මෙහෙයෙන් අනුතුරුව අතිඋතුම් කුරේ හිමි ජීවන අලළා සංවිධානය කළ රචනා තරගයේ ජයග්‍රාහකයන්ට ජයසංකේත පිරිනැමීම හා එතුමන් පිළිබඳ චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීමත්, දේහය තැන්පත් කර ඇති දිව්‍ය සත්ප්‍රසාද දෙව්මැඳුරේදී පුෂ්පෝහාර පිදීමත් සිදුකෙරිණි.

එතුමන් භාග්‍යවරයට එසවීමේ කමිටුව, සිද්ධස්ථාන පාලක ගරු පිය ජයමාන්න හා ජනවන්දනා කටයුතු පදවි අධ්‍යක්ෂ ගරු ඉන්ද්‍රිත් පෙරේරා පියතුමන් විසින් දේව මෙහෙය සංවිධානය කරන ලදි.

සී. ආර්. ඩික්සන් ඇන්ටනි

### අගරදගුරු පදවි වාර්ෂික පූජක ධර්ම විවේකය - 5

**නොවැම්බර් 11 ඉරිදා සන්ධ්‍යාවේ සිට නොවැම්බර් 16 සිකුරාදා දක්වා**

**ස්ථානය - තේවත්ත ධර්ම විවේකාගාරය**
**දේශක - ගරු ටිරල් අලස් සා.බෙ.නි පියතුමා**

ගරු ඔස්කා අබේරත්න, කිංස්ලි අයිවන් අප්පුහාමි, ඇන්ටන් ප්‍රේමලාල්, ක්‍රිස්ටි නිකලස්, ඩැරල් කූඤ්ඤ, චමින්ද ලක්නාත් කුරේ, රොනල්ඩ් ද සිල්වා, ඇන්තනි සිරිල්, බර්ට්‍රම් රංජිත්, ජූඩ් ලක්ෂමන්, එඩ්වින් ජේ. ප්‍රනාන්දු, ශ්‍රීකාන්ත ප්‍රනාන්දු, ඉන්ද්‍රා රත්නසිරි ප්‍රනාන්දු, ඇන්තනි ජයලත් ප්‍රනාන්දු, මහේෂ් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු, මර්වින් ඒ. එස්. ප්‍රනාන්දු, ප්‍රසාද් සුරංග ප්‍රනාන්දු, ප්‍රියනාල් අසන්ත ප්‍රනාන්දු, රංජන් ප්‍රියදර්ශන ප්‍රනාන්දු, රොෂාන් ප්‍රසාද් ප්‍රනාන්දු, සමිත් රංගන ප්‍රනාන්දු, පැට්‍රික් රොෂාන් ප්‍රනාන්දු, බොනි ප්‍රනාන්දුපුල්ලේ, සුරංග නිරෝෂන් පොන්සේකා. ට්‍රැවිස් ගේබ්‍රියල්, සිසිල් කුමාර්, සාන්ත සාගර හෙට්ටිආරච්චි, ජෝන් හෙට්ටිආරච්චි, වික්ටර් ෆ්ලොරන්ස් ජයමාන්න, නුවන් බුද්ධික, ටෙරන්ස් ප්‍රසංග විරාජ්, ඉෂාන් ප්‍රමීණ, දිනේෂ් කීර්තිසිංහ, මර්වින් කුලතුංග, රංජිත් මදුරාවල, රුවන්දන මෙන්ඩිස්, නොයෙල් නෝනිස්, ඩිල්රන් පීරිස්, සුනිල් කුමාර පීරිස්, සුරංග පෙරේරා, ගයාන් ප්‍රසාන්ත පෙරේරා, කෙනඩි පෙරේරා, ක්‍රෑසන් කුමාර පෙරේරා, ලලිත් පෙරේරා, නොයෙල් සම්පත් පෙරේරා, තරංග සම්පත් පෙරේරා, ප්‍රගීත් චාමර, ජූඩ් බර්නාඩ් රුද්‍රිගු, සුමිත් රොෂාන් රුද්‍රිගු, ක්ලෙමන්ට් රොසයිරෝ, ඇතනේෂියස් සමරසිංහ. හෙන්රි සිල්වා, රූබන් ලෙස්ලි සිල්වා, කිරුල් ජයනාත් සිල්වා, ජයශාන්ත සෝවිස්, ට්‍රෙවෝ මාටින්, ක්ලෝඩ් වනසිංහ, ලෙස්ටර් විජේසූරිය යන පියවරුන්ය.

දෙවිඳුන් සමඟ ගැඹුරින් ගතකරන ධර්ම විවේකය සමයේදී නිශ්ශබ්දතාවය රකිමින් පැවරෙන වගකීම් ඉටුකිරීමට සහයවන්න.

ගරු ලලිත් එක්ස්පෙඩිටස් පියතුමා
පූජක ධර්ම විවේක සම්බන්ධීකාරක



නුවරඑළිය මීසමේ 'වැඩිහිටි දිනය' පසුගියදා පැවැත්වුනි. සහයක ගරු ජෝසප් පියතුමන් විසින් දිව්‍ය යාගය සිදුකරන ලදි. දිව්‍ය යාගයෙන් අනතුරුව සුහද හමුවක් පවත්වා දිවා ආහාරයක් ද පිරිනැමිණ. මීසම් සේවක ගරු ලෙස්ලි පෙරේරා, සහයක ගරු ජෝසප් පියතුමන් නුවරඑළිය අප ස්වාමිදුගේ ද්වීය පාසලේ අදියුරු ගරු ශිවන්ත රොඩ්‍රිගෝ පියතුමන් ඇතුළු පිරිස සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු. නුවරඑළිය මීසමේ සා. වින්සෙන්තියානු පාවුලා සංගමය විසින් මෙය සංවිධානය කරන ලදි.

සටහන - ජේ. ඒ. බානබස් සේයා - සිටිලයිට්

# ශ්‍රී කුරුසියේ ජීවිත කුරුසිය ජයගමු



කෙනෙකුව ඝාතනය කර දමන්නට යොදා ගන්නාවූ ආයුධය එම පුද්ගලයාව සිහිවීම පිණිස ගෞරවාදරයට පාත්‍ර නොවුවද, ක්‍රිස්තුන් වහන්සේට මරණය ගෙන දුන් කුරුස ගස අද අපගේ ගෞරවාදරයට පාත්‍ර වී ඇත. ක්‍රිස්තුන් වහන්සේ සිය ජීවිතය පූජා කළ කුරුස ගස එම ජීවිත පූජාව හේතුවෙන් ජයග්‍රහණයේ හා බලාපොරොත්තුවේ සංකේතයක් බවට පත් වීමයි. ස්වාමින් වහන්සේගේ ශ්‍රී කුරුසිය අපට ආරාධනා කරන්නේ, ජීවිත කුරුසියෙන් පැන යන්නට නොව, එය සතුටු සිතින් හා ඉවසීමෙන් දරා ගෙන එයම අපගේ ජයග්‍රහණය බවට පත්කර ගන්නට යැයි පොලොන්නරුව, පලුගස්දමන මීසමේ, පුලස්තිගම ශ්‍රී කුරුස දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යයේදී පලුගස්දමන මීසම් සේවක, ගරු එමාඩ් ප්‍රනාන්දු පියතුමා ප්‍රකාශ කළේය.

මංගල්‍යය සඳහා මීගමුව, කුරණ, රාවතාවත්ත, මොරටුව, බුරුල්ලපිටිය, වැලිවේරිය සහ කොළඹ - මෝදර වැනි දිවයිනේ විවිධ ප්‍රදේශවලින් විශාල පිරිසක් සහභාගි වූහ.

දූලිත් හර්ෂාන් නානායක්කාර



ගුරුගල්ල සා. ප්‍රැන්සිස් සේවියර් කොන්පරන්සය මගින් සා. වින්සන්ද පාවුලු ජාතික සභාවේ අනුග්‍රහය ඇතිව ගුරුගල්ල මීසමේ මදුරු උවදුරින් පීඩාවිඳින අඩු ආදායම්ලාභීනට මදුරු දැල් බෙදා දීමක් තත් දෙව්මැඳුරු පරිශ්‍රයේදී සිදු කෙරිණ. ඡායාරූපයෙන් දැක්වෙන්නේ ගුරුගල්ල මීසම් සේවක ගරු ක්‍රිස්ටෝපර් කුරේරා පියතුමා මදුරු දැල් ප්‍රදානය කරන අයුරුයි.

තියබෝල්ඩ්. සමරතුංග

# ශු. වින්සෙන්තිද පාවුලා බැතිය නැංවේ

කළුතර දිසා සභාවට අයත් කොන්ෆරන්සි 10 වෙත ශු. වින්සෙන්තිද පාවුලා මුනිතුමන්ගේ ප්‍රතිමාවන් ලබාදීමේ වැඩ පිළිවෙලක් පසුගියදා උතුරු පයාගල ශු. ජුසේ මුනි දෙව්මැඳුරු ශ්‍රවණාගාරයේදී පවැත්විණ.

එදින මාසික රැස්වීමෙන් අනතුරුව කොන්ෆරන්සි වෙත ප්‍රතිමාවන් ලබාදීම කළුතර දිසා සභාවේ සභාපති ඇන්ටන් සුරේශ් මහතාගේ පුද්ගලික පරිත්‍යාගයක් මත සිදුකෙරිණ.

මෙම අවස්ථාවට ශු. වින්සෙන්ති ද පාවුලා දිසා ආත්මික අධ්‍යක්ෂ ගරු තුසිත ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ද, දිසා ලේකම් ශ්‍රීමති කුරේ, භාණ්ඩාගාරික කේ. ඩී. එස්. රොඩ්රිගස් යන මහත්ම/ මහත්මීන් ඇතුළු කොන්ෆරන්සි නිලධාරින් සහභාගිවූහ.

රංජිත් නෝනිස්



කණුවන මීසමේ දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය හා එම මීසම, මීසමක් බවට පත්වී වසර 25 ක් සැමරීමේ සංවත්සර උලෙළ පසුගියදා අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙහිදී එම උත්සවය හා සමගාමීව පැවති දිව්‍ය පූජා යාගය ආරම්භ කරමින් සහයක රදගුරු හිමිපාණන් පොල්තෙල් පහන දැල්වූ අයුරු. කණුවන මීසම් සේවක ගරු ලෙස්ටර් නෝනිස් පියතුමා සමඟ හිටපු මීසම් සේවක ගරු ජෝශප් පෙරේරා හා ගරු නික්ලස් බටේපොල පියවරු ද මෙහි වෙති.

සේයා - ටී. සුනිල් ප්‍රනාන්දු

පසුගිය කලාපයේ ගංගොඩ ජයන්ති උලෙළ හා තොඩුවාව අසිපා වැඩසටහනට අදාළ ඡායාරූප දෙක ප්‍රමාද දෝෂයකින් මාරුවී පළවී ඇත. ඒ පිළිබඳව අපගේ බලවත් කණගාටුව



දියලගොඩ සා. සෙබස්තියන් දහම් පාසලේ දරු දැරියන් විසින් ගුරු උපහාර උලෙළක් පසුගියදා දියලගොඩ ප්‍රාථමික විදුහලේදී පවත්වන ලදි. මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන් ඇතුළු දහම් ගුරුවරුන්, එම උලෙළේදී දරු දැරියන්ගේ දස්කම් නැරඹූ අයුරුයි මේ.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු

# දෙවියන්ගේ කැමැත්ත පරිදි හරිදේ පමණක් කරන්න

"අප කොතරම් ඉගෙන ගත්තද නොදන්නා දේවල් එමට තියෙනවා. අප හරියයි කියා සිතන බොහෝ දේවල් වැරදියි. යමක් කරන්න කලින් දෙවියන් වෙත හැරෙන්න. දෙවියන්ගේ කැමැත්ත පරිදි හරිදේ කරන්න පුරුදු වෙන්න. යහපත් දේ නික්මෙන්නේ දෙවියන්ගෙන් පමණයි."

කුරුණෑගල පදවි අනුනායක අතිගරු ඔස්ටින් මාකස් පියතුමා එසේ ප්‍රකාශ කළේ නාලවලාන අග්‍රදූත මිඛායෙල් තුමාගේ දේවස්ථානයේ පැවති වාර්ෂික මංගල දේව මෙහෙයේදීය.

නාලවලාන මීසම් සේවක ගරු ලීනස් මැක්ලවුඩ් පියතුමාගේ මෙහෙය වීමෙන් මංගල මෙහෙය උත්සවාකාරයෙන් සිදුවිය. කට්ටිමහන මීසම් සේවක ගරු ටෙරන්ස් කන්නන්ගර හාල්දඬුවන මීසම් සේවක ගරු ප්‍රැන්සිස් ලාවුස් ඇතුලු කලාපයේ ගරු පියවරුන් කිහිප නමක් මෙහෙයට සහභාගි වූහ.

ජේ. විල්ප්‍රඩ් සමරසිංහ

ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk
ක්‍රිස්තු වර්ෂ 2012 නොවැම්බර් 04 ඉරිදා

# අනෙකා නොතකා හැරීම

එක් කතෝලික බාලිකා පාසලක පැවති නර්තන ප්‍රසංගයක් නැරඹීමට ගිය අවස්ථාවේදී යළිත් වරක් අපේ පොදු බේදවාචකයේ දරුණු බව හොඳින්ම පැහැදිලි වුනු අත්දැකීමක් තමන්ට ලබන්නට හැකිවුණ බව 'රාවය' පුවත් පතට තීරු ලිපියක් ලියන නුවන් උදය වික්‍රමසිංහ සඳහන් කරයි. "හයවැනි මහලේ සිට" තීරු ලිපිය සතිපතා 'රාවය' පුවත් පතට ලියන ඔහු මෙවර එකී කොලම නම් කොට ඇත්තේත් එකී බේදවාචකය පැහැදිළිවම පසක් කරන්නට තමන්ට ලැබුණ නිමිත්තද සියුම්ව විග්‍රහයකට ලක් කරමිනි.

ඉතා උසස් මට්ටමක පැවති එකී නර්තන ප්‍රසංගය එහි බාලිකාවන් ඉදිරිපත් කළ සංයමය හා ගැඹුරින් සමාජය දැකීමට දැරූ උත්සහය අගයන තීරු රචකයා ඉනික්බිතිව සිදුවූ ක්‍රියාදාමය හුවා දක්වන්නේ පෙර කී කම්පනයේ සිදුවීම් ජාලාව නැවතත් ආවර්ජනය කරමිනි.

ඔහු සඳහන් කරන පරිදි ඒ ප්‍රසංගය සඳහා විශේෂ ආරාධිත අමුත්තා ලෙස සහභාගි වී ඇත්තේ සංගීතඥයකු ලෙස දිවයිනේ නමක් දරා සිටින අයෙකි. ඔහු එදින එම නර්තන ප්‍රසංගයට ඇරයුම් ලබා ඇත්තේද දැරියන්ගේ නර්තනයන් පිළිබඳ විචාරාත්මක ඇගයුමක් කරනු ඇතැයි යන බලාපොරොත්තුවෙනි. එකී ඇගයුම කෙලෙස වූවාද යන්න පෙරළා ප්‍රශ්න කිරීම මේ තීරුව තුළින් කිසිසේත් අපේක්ෂා නොකරමු. නමුත් නුවන් උදය වික්‍රමසිංහ තමන්ගේ තීරු ලිපියෙන්ද පෙන්වා දෙන පරිදි සිදුවූ බරපතලම දේ ලෙස සඳහන් කරන දෙය පිළිබඳ අපිදු පෙරළා ප්‍රශ්න කරන්නෙමු. ඒ ඔහු සභාව ආමන්ත්‍රණය කිරීම ඇරඹීමේදී අවසර ගත් ආකාරය පිළිබඳවයි. තීරු ලිපියෙන් පෙන්වා දෙන අයුරින්ම තමන් අධිපති ආධ්‍යාත්මයේ නියෝජිතයෙකු ලෙස සභාවට ඇඟවෙන අයුරින් වදන් භාවිතා කරමින් සිය අමන්ත්‍රණයේදී පළමු කොටම පෙන්නුම් කොට ඇත්තේ අන් ආගම් අදහන්නන්, අන්‍ය සංස්කෘතීන් කෙරේ තමන් තුළ වන නොදැනුවත් බව හා නොසැලකිල්ලයි.

එකී ආරාධිතයා එම පාසලේ විදුහල්පතිනිය ලෙස කටයුතු කරන පැවිදි සොයුරියට ආමන්ත්‍රණය කොට ඇත්තේ සිස්ටර්...... මහත්මිය යනුවෙනි. ඔහුගේ මුවින් පිටවූ එවදන් ප්‍රේක්ෂකාගාරයේ සිටි දැරියන්ගේ සිනහවට මෙන්ම වැඩිහිටියන්ගේ අන්ද මන්ද බවටද හේතු වූ බව පැහැදිලි වුන බව නුවන් උදය තවදුරටත් සඳහන් කරයි. දෙතුන් වරක් සිස්ටර් මහත්මිය යන ආමන්ත්‍රණය පළවෙද්දි සභාව තුළ ඔහු හාස්‍යයට ලක්වූ අයුරක් මෙන්ම තම රටේ ප්‍රධානම ආගමක පැවිදි පාර්ශවයට අමතන්නේ කෙසේ දැයි නොදැනීම පිලිබඳ ඔහු කෙරේ ප්‍රේක්ෂකයා නොපහන් වූ බවක් දක්නට ලැබුණු බවද සැලයි.

සිදුවීම සරල වුවද එකී සිද්ධිය සරල බවින්ම සිතන්නට ඉඩ නොහැරීමට නුවන් උදය වික්‍රමසිංහ 'හයවැනි මහලේ සිට" ප්‍රශංසනීය උත්සහයක් දරයි. ඔහු පවසන්නේ මෙය හුදෙක් එක් පුද්ගලයෙකුගේ ගැටලුවක් සේ සැලකිය නොහැකි බවයි. නුවන්ට අනුව ඒ ආරධිතයා තුළින් එදා නිරූපණය වූයේ අපේ සමාජය පුරාම නොඅඩුව දක්නට ලැබෙනා බරපතළ බේදවාචකයක ප්‍රකාශනයකි. ඉතා කෙටියෙන් එය හඳුන්වා දිය හැක්කේ 'අනෙකා නොතකා හැරීම' යනුවෙනි. මෙය වර්තමාන ලංකාවේ සෑම ස්ථරයක් තුළම හොඳ හැටි දක්නට ලැබෙන බරපතළ අඩුපාඩුවක් බව නුවන් උදය පැහැදිළිවම සඳහනක්ද කරයි. විශේෂයෙන්ම මෙය ප්‍රබලව දක්නට ලැබෙනුයේම අධිපති ආධ්‍යාත්මය නියෝජනය වන සමාජය තුළයි. මෙහි උපරිමය අපට දක්නට ලැබෙන්නේ යුධ ජයග්‍රහණය සමඟම ද්‍රවිඩ ප්‍රජාව කෙරේ දක්වනු ලබන සැලකිල්ලේ තරම තුළිනි.

සමාජයක පවත්නා දියුණුවේ තරම වටහා ගතහැකි හොඳම දර්ශනයක් වනුයේ අදාළ සමාජය තුළ එහි සාමාජිකයන් එකිනෙකා වෙත දක්වනු ලබන ගෞරවය හා සැලකිල්ලයි. දැනට දශක කිහිපයකට පෙර ලාංකික සමාජය හඳුන්වන ලද්දේ සියලු ජාතීන් සහජීවනයෙන් දිවිගෙවන රටක් යනුවෙනි. එහෙත් පසුගිය යුද්ධය මේ තත්ත්වය බරපතළ වෙනසකට ලක් කළේය. යුද්ධය හරහා එකිනෙකාට වෛර කරනා මානසිකත්වයක් ගොඩනංවන ලද බව සැබෑවකි. එහෙත් යුද්ධය නිමාවෙන් පසුව අද වන විට එකී වෛරය, භේදය සිංහල අධිපතිවාදි ආධ්‍යාත්මික උත්තමකමක දවටා පවත්වාගෙන යාම බරපතළ බේදයක් බව තීරු රචකයා පැහැදිලිව විග්‍රහයක් කරමින් පවසයි. එහිදී අධිපති ජනවර්ගය හා අධිපති ආධ්‍යාත්මය ඉදිරිපත් කරනා මතවාදය හමුවේ අපේ සමාජය දිනෙන් දින තල්ලු වෙමින් පවතිනුයේ අනෙකා නොතකා හැරීම හා පිරිහෙළීමට ලක් කිරීමේ මාවතටය. මුලින් කී සංගීතඥයාට තමන් අන්‍යාගමික පාසලක උත්සවයකට යන විට ඊට පූර්ණ සූදානමක් තිබිය යුතු යැයි නොසිතෙන්නේ එහෙයිනි. එසේම පැවිදි සොයුරියනට මහත්මිය යනුවෙන් ඇමතීම මගින් තමන් අතින් වරදක් වූයේ යැයි, නොතකා හැරීමක් වූයේ යැයි ඔහුට නොදැනෙන්නේත්, ඔහු එය වගකට නොගන්නෙත් එහෙයිනි.

සිතා හෝ නොසිතා අනෙකා නොතකා හැරීමට තරම් ප්‍රබල මනසක් හා ආධ්‍යාත්මයක් ගොඩනැංවීමේ අධිපති වාදී මත වාදයන් හා හේතු පාඨ තුළින් සිදුවන සෙතක් නම් නොමැත්තේය. සිදුවන්නේ එක් මූලධර්මවාදයක් වෙනුවට තවත් මූලධර්මවාදයක් කැන්දන් එන තැනට සියලු වැඩ සිද්ධවීමයි. ඒ මූලධර්මවාදය තුළ හිරවුණු මනුෂ්‍යත්වයේ දියාරු වීම දැන් දැන් ශීඝ්‍රව අනෙක්තලයන් තුළද සිදු වන බව නුවන් උදය වික්‍රමසිංහ හේතුකාරණ ඇතිව පවසයි. අනෙකා නොතකා හැරීමේ භයංකර බව ඉස්මතු කළ යුත්තේත් ඒ නිසාම නොවේද?

විශ්වාසයේ වසර
දහම් චින්තා 4

# ක්‍රිස්තියානි මූලධර්මවාදීනට ආරාධනා

ක්‍රිස්තියානි මූලධර්මවාදීන්ගේ රැවැටිලි මායම් වලින් මුලාවේ නොවැටෙන ලෙස අප කතෝලික බැතිමතුනට සභා ශ්‍රේෂ්ඨයින් වෙතින් නිතර නිතර අවවාදානුශාසනා ලැබීම අද සුලබ කාරණයක්ව ඇත. මේ පිළිබඳව කතෝලික සභාව අවදියෙන් සිටිය යුතු බවද, එකී උවදුරෙන් අප බැතිමතුන් මුදා ගැනීමට සංවිධානාත්මක, අඛණ්ඩ ක්‍රියා මාර්ගයනට අවතීර්ණ විය යුතු බව ද අවධාරණය කළ යුතුය. තැන තැනින් ඒ උවදුරු පිළිබඳව අසන්නට ලැබෙන තොරතුරු සුබදායක නොවීම ඊට හේතුවයි.

ක්‍රිස්තියානි මූලධර්මවාදීන් වැඩි වශයෙන්ම සැරිසරන්නේ වැඩි කතෝලික පිරිස් ජීවත් වන ගම් දනව්වලය. අප බැතිමතුන් ඔවුන්ගේ දර්ශනයට නතු කැරගන්නට ඔවුන් විවිධ ක්‍රමෝපායයන් යොදනු ද සැබෑවකි. මිල මුදල් ද ඊට යොදා ගන්නා බවට තොරතුරුත් ලැබේ. ඔවුන්ගේ ඒ උත්සාහයන් යම්තාක් දුරට ඵල දරා ඇති බව ද බොරු නොවන බවත් පෙනේ.

ක්‍රිස්තියානි මූලධර්මවාදීන් එහි දී ශුද්ධ බයිබලය පිළිබඳව ලබා ඇති දැනුමට තම චතුර කථිකත්වය ද උදව් කර ගනිමින් කතෝලික සභාවේ උගැන්වීම් සහ වත්පිළිවෙත් බයිබලීය උගැන්වීම්වලට බොහෝ පටහැනි බව පෙන්වා දෙන්නේ නොයෙකුත් උදාහරණ ද ඉදිරිපත් කරමිනි.

එහිදී ඔවුහු බොහෝ ඉවසිලිවන්තයෝ ය, පසු නො බසින්නෝ ය, ඇනුම් බැනුම් ගැරහුම් සිනා මුසු මුහුණින් උසුලන්නෝ ය.

මේ සියලු හැසිරීම් තුළින් කතෝලිකයිනට ඔවුන් ඒත්තු ගන්වන්නට උත්සාහ කරන්නේ ක්‍රිස්තුස් වහන්සේ නමින්, ඒ ඕනෑ ම තත්ත්වයකට ඉතාම සතුටින් මුහුණ දෙන්නට තමන් මුළු ජීවිතයෙන් ම සූදානම් බව ය. අප කතෝලික ජනතාව අතරින් ඉතා වැඩි දෙනෙක් ශුද්ධ බයිබලය පිළිබඳ දැනුමෙන් හීනයෝ ය. මේ තත්ත්වය මූලධර්මවාදීන්ගේ අරමුණු බල ගන්වන්නට සපයන්නේ ඉහළ ම වාසියකි.

කතෝලික ජනතාව ශුද්ධ බයිබලීය දැනුමෙන් වඩාත් පෝෂණය කරනට සුබදායී, ඵලදායී වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම යුගයේ අවශ්‍යතාවක් බව කිව යුතු ම ය. අද කතෝලික නිවෙස් හැමෙකකම පාහේ ශුද්ධ බයිබලයක් තිබෙනු දක්නට ලැබේ. ඒත් ඒ හැදෑරීමක් හා එහි උගැන්වීම් විමසා දැන මැන ගැනීමේ නැඹුරුවක් නම් නැති තරම් ය. ඒ කෙරෙහි ඔවුන් යොමු කිරීමක් සභාව මඟින් නො කෙරෙනවාත් නො වේ. එහෙත් එය ප්‍රමාණවත් මට්ටමකින් කෙරේ ද යන්න නම් ප්‍රශ්නයකි.

ශුද්ධ බයිබලීය උගැන්වීම් පිළිබඳව හරබර දැනුමකින් අප සවිමත් ව සැරසී සිටින්නේ නම් මූලධර්මවාදීන්ගේ තර්ක බිඳලන්නට එය අපට විශ්වාසනීය වූ ද, හරවත් වූ ද, බලසම්පන්න වූ ද මඟක් වනු නිරනුමානය.

අවශ්‍ය වන්නේ වඩාත් අවබෝධාත්මක, අරුත් බර, ඵලදායක, කල්පවතින, සංවිධානාත්මක, සදාචාර සම්පන්න, ආදර්ශවත්, ප්‍රේමනීය වූ පිළිවෙතකට අවතීර්ණ ව මේ අභියෝගයට මුහුණ දීමයි. ඒ පිළිවෙත හා පිළිවෙල සදා ක්‍රියාත්මක වලංගුභාවයකින් ද යුක්තවීම අගනේ ය.

මීසම් සේවක ගරු පියතුමන්ලා මෙහි දී පෙරමුණ ගත යුතු ම ය. කුඩා කිතුනු සංඝ උදව් කර ගනිමින්, මීසම්වල වෙසෙන දැනුමෙන් අවබෝධයෙන් යුතු වැඩිහිටියන්ගේ ද, අප උගත් තරුණ කොටස්වල ද සක්‍රීය දායකත්වය ලබා ගැනීම සුබ ඵලදායක ය. අප දේවස්ථානවල පැවැත්වෙන උත්සව ද බොහෝ කොට බාහිර සාටෝපය තැවරුණ සිලි සිලි සැරසිල්ලක සිරි උසුලනු දක්නට ලැබේ. ඒ තුළින් බැතිමතුනට සැදැහැ සිත් වඩවා ගනිමින්, ආධ්‍යාත්මික පෝෂණයට ලැබෙන අනුබලය කෙතරම් දැයි විමසා බැලීම වටී. මංගල්‍යයට පෙර සතියක පමණ කාලයක් පුරාවට, ඥානකාන්ති, ශුද්ධ වූ පැය, පශ්චාත්තාපික මෙහෙයයන්. තරුණ කොටස් වෙනුවෙන් විශේෂ දේශන, භක්ති අභ්‍යාස ආදිය සංවිධානය වෙයි. ඒ මගින් යම් ප්‍රමාණයක ආධ්‍යාත්මික වෙනසක් ලබන බව ද කෘතවේදීව සඳහන් කළ යුතුය. එහෙත් ඒ අවසනැ සංගීත සංදර්ශන වැනි හරසුන්, විසුක දසුනින් සපිරි කටයුතුවලින් පෙර භක්ති අභ්‍යාසයන් ගෙන් ලබාගත් අගනා වටිනාකම් බිඳී හැලී සුන් වී නො යන්නේ ද?

එක්වරම නැතත් ක්‍රමානුකූල ව හෝ මේ නිස්සාර දිසාවන් ගෙන් අප ජනතාව විශේෂයෙන් තරුණ දූ පුතුන් පසෙකට ගන්නට සුබ පලදායී පියවරකට යා යුතු ම ය.

කෙසේ වෙතත් දේවස්ථාන මධ්‍ය කොට ගනිමින් ආගමික උත්සව නො පැවැත්විය යුතුය යන්න අප අදහස නො වේ. එවන් කටයුතු අඩු ලන්සුවක තබා කතා කරනවා ද නොවේ. ඒවා සැලසුම් කිරීමේ අරමුණු, පරමාර්ථයන්, අපේක්ෂිත ප්‍රතිඵල දෙන අන්දමින් ක්‍රියාත්මක කිරිමට කල්පනාකාරී විය යුතුය. ක්‍රිස්තියානි මූලධර්මවාදියෝ මෙකී කරුණු ගැන පුන පුනා කතා කරති. මේ කටයුතු හා මේ තත්ත්වයන් ක්‍රිස්තු දර්ශනය හා කෙසේ ගැලපේදැයි ප්‍රශ්න කරති. මේ අරුත් සුන් තත්ත්වයනට අනුගත වූ වන් නිසි මං ගැන්වීමේ පින් බර කටයුත්තට, මෙහෙවරට දෙවියන් වහන්සේ තමන් යොමු කර ඇති බව ඔවුහු කියති. මේ තත්ත්වයනට කවර හෝ පිළිතුරක් දී අපට ඇඟ බේරා ගත හැකි ය. එහෙත් ඒ පිළිතුරත් සමඟ අපේ ම හෘදය සාක්ෂිය එකඟත්වය දක්වන්නේ ද යන්න තවත් ප්‍රශ්නයකි.

ක්‍රිස්තියානි මූලධර්මවාදියෝ කතෝලික ඇදහිල්ල සහ ක්‍රියාකාරකම් දෙස නෙත නොපියා, අවදි ව බලා හිඳිති. එහි අඩුපාඩුකම් අහුලා ගනිති. ඔවුනගේ අභිලාශයන් සපුරා ගන්නට ඒවා ඉතා සියුම් ලෙස හා ආකර්ෂණීය ලෙස ආයුධ කොට ගනිති.

කතෝලික අපි, අපගේ ඇදහිල්ලේ දී විචාරවත් ද, පිළිවෙත් ගරුක ද, ආදර්ශවත් ද විය යුතු වෙමු. ඒ තුළින් සරල දිවි පැවැතුමකට අනුගතවීම සඳහා නිවැරදි හා පිරිපුන් අවබෝධයෙන් ක්‍රියා කළ යුතු වෙමු. එවන් වූ ප්‍රවිෂ්ටයක් සඳහා අපි කඩිනම් විය යුතු

15 පිටුවට »



**"කතෝලික සභාවේ ප්‍රමාදය. උදාසීනත්වය, මන්දෝත්සාහය මූලධර්මවාදීන්ගේ කුමන්ත්‍රණකාරී, ප්‍රයෝගකාරී ප්‍රයත්නයකට සවි බල දෙන දිරි උත්තේජනයක් ම වනු සිකුරු ය. ක්‍රිස්තියානි මූලධර්මවාදීන්ගේ ප්‍රයත්නයන්ගෙන් අපි අවදි වෙමු. අප සිටිනා තැන, අප යන මඟ නිවැරදි දැයි සිතමු. අඩු තැන්. වැරැදි තැන් විමසා දැන ගනිමු. ඒවා පිරිපුන් කර ගැනුමට, නිවැරැදි කර ගන්නට නිසිම නිසි පිළියම් සොයා ක්‍රියාත්මක කරමු."**

ඩබ්ලිව්. ඒ. පීරිස්
අංගම්පිටිය

කැමිලස්ගේ — තිත්ත ඇත්ත



මීසමෙන් මීසමට

# දේව වචනය අපගේ දිවියට සවියක් කර ගනිමු

## ගාලු රදගුරු හිමිපාණෝ මග්ගොනදී පවසති

දෙවියන් වහන්සේගේ ආදරය කරුණාව අප ජීවිත තුළට සම්බන්ධ කර නොගන්නවා නම්, අප කරන මොනයම් වැඩක් වුවද, සාර්ථකත්වයට පත්නොවනු ඇත. අද අපගේ පවුල් අතර, අඩදබරකම් වර්ධනය වෙමින් සාමය, ප්‍රේමය, පවුල් තුළින් ගිලිහී යන තත්ත්වයකට පත්වී තිබෙන්නේ දෙවිඳුන් කෙරෙහි අචල විශ්වාසයක් නොමැතිකමය. ජීවිතයේ අප අත්දකින නොයෙකුත් ප්‍රශ්න වලට හෙතුවී ඇත්තේ, අපි තව කෙනෙකුව පිළිගන්නට සූදානම් නොමැතිකමය. දේව වචනයට සවන් දෙමින් ඒ තුළ ජීවත්වන්නට හැකි නම්, අපගේ පවුල් සංස්ථාව නිසි ලෙස ගොඩනගා ගැනීමට එය දිරියක් වනු ඇත. අද ඇතැම් මූලධර්මවාදීන්ගේ ක්‍රියාකාරකම් අපගේ සමහර සැදැහැවතුන්ගේ විශ්වාසය බිඳ වැටීමට හේතුවක් වී තිබීම, අතිශයින් කණගාටුදායකය. විශ්වාසය පිළිබඳ ඇතිවන ඇතැම් අනවබෝධයන් නිසා, ඔවුන් ඇතැම් විට සභාව අත්හැර යෑමට පවා බිය නොවන තත්ත්වයකට පත්වී සිටිති. දෙවිඳුන් වෙත අප තුළ පවතින විශ්වාසය පලුදුවන්නට ඉඩ නොතබා, සැබෑ කිතුනුවන් ලෙස ශක්තිමත් වන්නට දේව වචනය අපට පන්නරයක් විය යුතුය. ඒ සඳහා සභා මාතාව විශ්වාසයේ වසරක් ප්‍රකාශයට පත්කර ඇති බැවින්, දේව රාජ්‍ය කරා යන ගමනට එමගින් අවතීර්ණ වෙමු යයි ගාලු රදගුරු අතිඋතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණෝ පැවසූහ.



රදගුරු හිමි එසේ පැවසුවේ මග්ගොන ප්‍රැන්සිස්කන් නිවාසයේ පැවති අසීසියේ සා. ප්‍රැන්සිස් මුනිඳුන්ගේ වාර්ෂික මංගල සන්ධ්‍යා මෙහෙයේදීය. මග්ගොන ප්‍රැන්සිස්කන් නිවාසයේ අධ්‍යක්ෂ ගරු ජූඩ් අසංක පැ.තු.නි පියතුමන්ගේ මූලිකත්වයෙන් ගරු සහෝදර තුමන්ගේ සහයෝගයෙන් මෙම මංගල උලෙළ අර්ථවත් අන්දමින් පැවැත්වුනි.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු

## කමාව කිතුනු ජීවිතයේ වැදගත් අංගයක්

'ගහක මුලක් වතුර සොයනවා වගේ මිනිසා මොනවාදෝ සොයනවා. පල්ලි යනවා. ශාස්ත්‍ර අහනවා. කිසිම දේකින් සැනසිල්ලක් නෑ. සතුරාට සමාව දී බලන්න. සිතේ ඇතිවෙන සැනසිල්ල. ඒ තමා දහම ඒ තමා ක්‍රිස්තියානි ජීවිතය." එසේ පවසා සිටියේ ගරු රංජිත් ද මැල් පියතුමාය.

හාල්දඬුවන මීසම් සේවක ගරු ප්‍රන්සිස් ලාවුස් පියතුමාගේ ආරාධනයෙන් ප්‍රදේශ වාසින් දැනුවත් කළ ගරු පියතුමා එසේ කීය.

ජේ. විල්ප්‍රඩ් සමරසිංහ



කටාන දිසාවේ දිව්‍ය හෘදය වාර්ෂික මංගල්‍යය පසුගියදා හල්පේ මීසමේ කළුවාරිප්පුව ශු. ජුසේ මුනිඳුන්ගේ දෙව්විමනේදී පැවැත්විනි. මෙදින මංගල දිව්‍ය පූජා යාගය කටාන දිසාවේ දිව්‍ය හෘදය සංගම් අධ්‍යක්ෂ ගරු බර්නාඩ් කුරේරා පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා හල්පෙ මීසම් සේවක ගරු අමිල ගෝමස් පියතුමන්ගේ සහභාගිත්වයෙන් සිදුකෙරිණ. කටාන දිසාවේ දිව්‍ය හෘදය සමිති සාමාජික සාමාජිකාවන් දිව්‍ය යාගයට පෙර දිව්‍ය හෘදය ප්‍රතිමාව රැගෙන දේවස්ථානය වටා පෙරහරින් ගමන් කළ අයුරු.

ටී. සුනිල් ප්‍රනාන්දු

## කම්කරු ජනතාව නංවාලීමට කිතුනු කම්කරුවෝ සැදී පැහැදී සිටිති

ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය මගින් ආරම්භ කරන ලද විදේශ සේවා නියුක්ති සහයෝගිතා සංවිධානයට ලබන වසර වන විට විසිපස් වසරක් සම්පූර්ණ වෙනවා. ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ ආගම්, ජාති, භාෂා හා කුල හෝ වෙනත් කිසිදු භේදයක් නොසලකා ඔවුනොවුන්ගේ පවුල් පසුබිම් සහ අවශ්‍යතාවයන් පමණක් සැලකිල්ලට ගෙන හැකි පමණින් ආධාර උපකාර මෙන්ම විවිධ වෘත්තීන් සඳහා පුහුණුව ද ලබාදෙමින් එම පවුල් ආර්ථික මෙන්ම සමාජීය වශයෙන් නගා සිටුවීමට කටයුතු කරමින් සිටින බව විදේශ සේවා නියුක්ති සහයෝගිතා සංවිධානයේ සභාපති, ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ සම්බන්ධීකාරක ඇන්තනි මංචනායක මහතා පැවසිය.

එම සංවිධානයේ අනුග්‍රහයෙන් තිර රෙදි සහ ළමා ඇඳුම් මැසීම පිළිබඳ මාස පහක පුහුණුවක් නිම කළ 20 දෙනෙකුගෙන් සමන්විත ඇල්දෙනිය කාන්තා කණ්ඩායමට සහතික පත් බෙදාදීමේ උත්සවයේදී ඒ මහතා මෙම අදහස් පළ කරන ලදි. ඇල්දෙනිය ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය මගින් සංවිධානය කළ මෙය ඇල්දෙනිය දේවස්ථාන දහම් පාසල් ගොඩනැගිල්ලේදී පැවැත්වුනි. සංවිධානයේ ලේකම් සුධර්මා පෙරේරා, ජාත්‍යන්තර කටයුතු සම්බන්ධීකාරක



ඥානාර්ථ ප්‍රදීපය සහකාර සංස්කාරක ශිරාන් මෛත්‍රී, ජාතික භාණ්ඩාගාරික ඩේමියන් ප්‍රනාන්දු, උප ලේකම් අයිරින් ප්‍රනාන්දු යන සොයුරු සොයුරියෝ මීට සහභාගි වූහ. ඇල්දෙනිය ශාඛා සභාපති එම්මානුවෙල් පෙරේරා, ලේකම් දේවිකා ලියනගේ, විදේශ සේවා ශාඛාවේ සභාපති දම්මි බංඩරගොඩ යන අයද මෙම රැස්වීම ඇමතූ අතර පාඨමාලාව හැදෑරූ සාමාජිකාවන් කීප දෙනෙක් පුහුණුව අගයමින් මේ වනවිටත් ඔවුනට මෙගින් ආදායමක් උපයාගත හැකි වූ බව ප්‍රකාශ කළහ. පුහුණුව නිමකළ සාමාජිකාවක් තමන්ට හිමි සහතික පත ලබාගන්නා අයුරු.

ලක්ෂ්මන් රත්නායක

## වැඋඩ ශු. ජපමාල මාතාවන්ගේ දේවස්ථානය



කුරුණෑගල පදවියේ වැඋඩ ප්‍රදේශයද, මහගල්ගමුව මෙන් භාග්‍යවත් ජුසේවාස් මුනිඳුන්ගේ පාද ස්පර්ශය ලැබීමට වාසනාවත් වූ ප්‍රදේශයකි. මාවතගම සිට නුවර දෙසට ගමන් කරද්දි සැතපුම් 3 ක් පමණ දුරින් දකුනු පස තරමක් උස් බිමක දේවස්ථානය දක්නට ලැබේ.

ශු. ජපමාල මාතාවන්ට කැපකරන ලදුව, කතෝලික බැතිමතුන්ගේ ආකර්ෂණයට ලක් වූ මේ දේවස්ථානය පසුබිම් කරගත් වැඋඩ ගම්මානයට ඉතා දීර්ඝ ඉතිහාසයක් හිමිය. 1617 එහි කතෝලික ජනාවාස තිබූ බවට ලිඛිත සාක්ෂි ඇත. දඹදෙණියට නුදුරු මැටියාගම (දැනට මැටියාගනේ) සිට ධර්මදූතවරුන් වැඋඩ ප්‍රදේශයෙ සේවයට පැමිණි බව මෙහි සඳහන් වේ. 1692 දී ඔරතෝරියානු ධර්මදූත පියවරු ද එහි සේවය කළ බව පැහැදිලි වේ. ජුසේවාස් පියතුමා වැඋඩ ප්‍රදේශයේ දහම් සේවා කළ බව සඳහන් වීමෙනුත් පැහැදිලි වන්නේ එහි දියුණු කතෝලික සංඝයක් වාසය කළ බවයි. ජපමාල මාතාවන්ට කැපකළ දේවස්ථානයක් ද, එහි තිබෙන්නට ඇත. ජුසේවාස් පියතුමා දෙවන විමලධර්මසූරිය රජුගේ භට පිරිසක් විසින්, සිර භාරයට ගනු ලැබුවේ වැඋඩ ප්‍රදේශයදීය.

1746 ආගම් පීඩන සමයේ නායක්කර් වංශික ශ්‍රී විජය රාජසිංහ රජු විසින් කතෝලික දේවස්ථාන විනාශකර ඔරතෝරියානු ධර්මදූතවරුන් නෙරපා හරින ලදි. ඒ අවස්ථාවේ වැඋඩ දේවස්ථානය ද, විනාශවන්නට ඇතැයි සිතිය හැක. එහි විසූ කිතුනු ජනතාවද, වහකෝට්ටේ සහ වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වූ බවට සාධක ඇත.

වැඋඩ දේවස්ථානය ඉදිකිරීමට ඉඩම 1879 ජූනි මස 08 දා ලබාගත්තේ කුරක්කන් කුරුණි හයක වපසරිය සහිත බිම් කොටසකි. එය හඳුන්වන්නේ "වැඋඩ විල්ලි හත්පත්තුවේ තිරගන්දහය කෝරළේ, වැඋඩ ග්‍රාමයේ ගොරකාගහමුල වත්ත" නමිනි. ඉන්පසුව එනම් 1897 දී පල්ලේගම ග්‍රාමයේ 'අලවැල්ලේ මුල්ල' වත්තෙන් බිම් කොටස් කීපයක් ගේබ්‍රියල් ජයතිලක ඇතුළු තවත් අයගෙන්, කොළඹ අගරදගුරු අතිඅතුම් ඇන්ඩෲ මෙලිසන් හිමිපාණන් විසින් ලබාගෙන ඇත. 1890 වන විට එහි දේවස්ථානයක් ඉදිකර තිබූ බවට සාධක ඇත. 1892 පෙබරවාරි මස 20 දින ක්‍රිස්තියානි කිරීමක් කර තිබේ. එසේම 1897 අගෝස්තු මස 11 දින විවාහ සිදු කිරීම සඳහා රජයේ ලියාපදිංචි වී ඇති බව සඳහන් වේ.

මෙම දේවස්ථානය ආරම්භයේදි කුරුණෑගල මීසමෙන් හා පසුව ස්ථාපිත වු පිට මීසම් යටතේ පාලනය වු අතර 1948 දී මාවතගම, නව මිසමක් වූ පසු එමගින් පාලනය විය. 1987 දී අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන් පදවිය භරගනු ලැබීමෙන් පසු, වැඋඩ දේවස්ථානය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කර, භාග්‍යවත් ජුසේවාස් පියතුමාගේ ප්‍රතිමාවක් දේවස්ථානයේ ස්ථාපිත කෙරිණි. 1992 වසරේ දී කතෝලික පවුල් 08 ක් දේවස්ථාන ඉඩමේ පදිංචි කර නව දේවස්ථාන සංඝයක් ගොඩනැගීමටද, උන්වහන්සේ කටයුතු කළහ. ඔවුන්ට නිවාස තනා දීමද සභා අනුග්‍රහයෙන් සිදුවිය.

බොහෝ කලක සිට ස්වභාවික විපත්වලට ගොදුරුව පැවති මේ දේවස්ථානය වත්මන්. ඇතුගල්පුර රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි රදගුරු හිමිපාණන්ගේ අනුදැනුම මත මීසම් සේවක ගරු ලයනල් ප්‍රනාන්දු පියතුමා ජාතික ජුසේවාස් ලේකම් කාර්යාංශය හරහා අලුත්වැඩියා කිරීමට මුල පිරූ අතර අලුත් වැඩියා කළ අභිනව දේවස්ථානය නොවැම්බර් 04 වන ඉරුදින ඇතුගල්පුර රදගුරු හිමිපාණන්ගේද, විශ්‍රාමික රදගුරු හිමිපාණන්ගේද, මහනුවර රදගුරු හිමිපාණන්ගේ ද, ප්‍රධානත්වයෙන් පැවැත්වෙන දිව්‍ය යාගයේදී ආසිරි ගන්වනු ලබන්නේය.

අසේල දසනායක

## ජීවිතයක් විනාශ කිරීමට කිසිවකුට අයිතියක් නෑ

මිනිසා පියාණන් වහන්සේගේ සුවිශේෂ සැලැස්මකි. මෙලොව අප ගත කරන කෙටි කාලය තුළ උන්වහන්සේට ප්‍රසන්න ජීවිතයක් ගතකිරීම ඒකායන අපේක්ෂාවයි. එමෙන්ම අපගේ ජීවිත විනාශ කිරීමටද කිසිවෙකුට නුපුළුවන. විවිධ පුද්ගලයන් කුමන මතයක් ප්‍රකාශ කළත් කතෝලික සභාව විරුද්ධ වන්නේ ඒ නිසාය. නූපන් දරුවාට සමාජයේ උසස් තැනක් හිමිවන්නට ඉඩ ඇත. සමහර විට කාදිනල් වරයෙක්, රදගුරු තුමෙක්, පූජක තුමෙක් වීමටද බොහෝදුරට අවකාශ ඇත. එසේ තිබියදී එවන් ජීවිතයක් විනාශ කිරීම මොනතරම් අපරාධයක්ද. මෙලොව අප ගත කරන කාලය තුළ අපගේම ශක්තියෙන් සියළුම දේ කළ නොහැකියි. එසේම ඔබට විරුද්ධව සමාජයේ ගොඩනැගී ඇති විෂම බලවේග ජයගන්නට උන්වහන්සේගේ ශක්තිය ඔබට ලැබෙනු නොඅනුමානය.

ජාඇල කලාපීය නාහිමි අතිගරු ශාන්ති කුමාර වැලිවිට පියතුමා එසේ ප්‍රකාශ කළේ මිදෙල්ලවිට මීසමේ සා. මිඛායෙල් අග්‍රදූත තුමන්ගේ වාර්ෂික මංගල්‍යයේ ප්‍රධාන දේශනය පවත්වමිනි. මීසම් සේවක ගරු ටෙරන්ස් කිත්සිරි පෙරේරා පියතුමා මංගල්‍ය කටයුතු සංවිධානය කළේය.

ආර්. එල්. හෙක්ටර් ජයතිලක



දුන්ගාල්පිටිය දෙව්හද සමිතියේ වාර්ෂික වන්දනා ගමන මෙවර යෙදුනේ කලාවැව දෙව්මැඳුරටය. එහිදී එහි මීසම් සේවක ගරු රංජිත් මැල් පියතුමා සමඟ සේයාරුවකට පෙනී සිටි අයුරු.

ස්විනීතා



# කැපවීම නිසා මරණය සමඟ දිවි ගෙවූ මරිය මාතාවෝ

**මරිය මාතාවෝ මෙලොව ගත කළ කාල පරාසය පුරාම පැවැති ප්‍රධානම ගති ලක්ෂණය තමයි එතුමියගේ කැපවූ ජීවිතය. එතුමිය තරම් කැපවූ චරිතයක් මානව ඉතිහාසයේ මෙතෙක් බිහි වෙළා නැහැ. කැපවීම ගැන විවිධ අර්ථකථන සපයන්න පුළුවන්. ඒ වුනාට කැපවීමෙන් ජීවත්වන විට මරණය සමඟ ජීවත් වෙන්න සිදුවෙනවා. ඒ හින්දා තමයි අද බොහෝ දෙනෙක් කැපවීම වචනයට පමණක් සීමා කරලා එයින් බැහැර වෙනවා. නමුත් දේව අම්මා මරණයේ සේයාවන්ට බියෙන් කැපවීමෙන් බැහැර වුණේ නැහැ.**

ළදරු වියේ ඉඳලම අසමසම චරිතයක් වූ මරිය මාතාවෝ හය හතර දැනගත්දා පටන් දෙවිඳුන් වෙත කැපවූ ළදැරියක් වුණා. එතුමිය යොවුන් වියට පත්වන විට කැපවීම එතුමිය ගේ ජීවිතයේ ප්‍රධාන ගුණාංග යක් බවට පත් වෙලා තිබුණා. එතුමියගේ කුස තුළ ශුද්ධාත්ම වරමින් ගැළවුම්කාරයාණන් පිළිසිඳගෙන ඇතැයි ගාබ්‍රියෙල් දේව දූතයා දැන්නුවා. එතුමියට ලොකු කැපවීමක් කරන්න සිදුවුණා. ඒ වෙනකොට ඇය විවාහ ගිවිසගෙන සිටියට විවාහ වී සිටියේ නැහැ. ජුදා සිරිත් අනුව විවාහ වීමට පෙර ගැබ් ගැනීම ප්‍රසිද්ධියේ දඬුවම් දිය යුතු වරදක්. තම කුස තුළ ශුද්ධාත්ම වරමින් දිව්‍යමය පුත්‍රයා ගැබ් ගැනීම සත්‍යයක් වුණත් එතුමිය විවාහ වීමට පෙර මෙය සිදුවීම නිසා ජීවිත කැප කිරීමක් කිරීමට සිදුවුණා.

එතුමියට මේ දිව්‍යමය දරුවා බිහිකිරීමට සිදුවුණේ ගවලෙනකයි. එතුමිය එය කිසිම මොහොතක බලාපොරොත්තු වුණේ නැහැ. ඒ වගේ දෙයක් මේ ලෝකේ කිසිම කාන්තාවක් පතන්නේ නැහැ. එහෙම සිදුවුණොත් ඒ අය තුළ ඇතිවන කලකිරීම වචන වලින් කියන්න බැහැ. ඇත්තට ඒකත් මරණයට මුහුණ දීමක්. මරිය අම්මාගේ පූර්ණ කැපවීම නිසා එතුමියට මරණය වුණත් ප්‍රශ්නයක් වුණේ නැහැ. දරුවා ලැබුණට පසසෙ පුදුම කැපවීමක් කරන්න මරිය මාතාවන්ට සිදුවුණා. දිව්‍යමය ළදරුවා මරා දැමීමට කුමන්ත්‍රණය කරන විට, ළදරුවාද රැගෙන මිසර දේශයට පලා යන ලෙස ස්වාමින් වහන්සේ දැන්වූ වහා එතුමිය එය ඉටු කළා. එය ඉතා දුර ගමනක් වූවත් ඒ ගැන කළකිරුණෙත් නැහැ. හිත හිත හිටියෙත් නැහැ.

තම පුත්‍රයාණන් සමඟ කානා නුවර විවාහ මංගල්ලයට ගිය වෙලාවෙ එතුමියගේ කැපවීම ඇයට වේදනාවක් ගෙනදුන්නා. කිසිම මිනිස් අම්මෙක් තම දරුවකුගෙන් බලාපොරොත්තු නොවන වචනයක් දේව පුත්‍රයාගෙන් අහන්න ලැබුණා. මඟුල් ගෙදර තිබුණු මිදිරස අඩුපාඩු, එතුමිය ජේසු ස්වාමින් වහන්සේට පැවසූ විට උන්වහන්සේ එතුමිය ඇමතුවේ “ස්ත්‍රිය” යන නමින්ය. එතුමා මිනිසෙක් ලෙස සිටියත් දේව පුත්‍රයා බැවින් එලෙස අමතන්නට ඇති. එසේ වූවත් මරිය අම්මා ඒ වෙනකොට මිනිස් මවක් නිසා ඒ වචනය වේදනා ගෙන දුන්නාට කිසිම සැකයක් නැහැ. එතුමිය තුළ පැවැති කැපවීම තුළ එය දරාගත හැකිවුණා.

ජේසු සමිඳුන්ගේ කරට කුරුසයක් තියා වද දිදී කුරුසයේ ඇණ ගැසීමට රැගෙන යද්දී එතුමියට හමුවෙනවා. එය අම්ම කෙනෙකුට තම මරණය කරා ගමන් කිරීමක්. ඒ කියන්නෙ ඒ දරා ගන්න පුළුවන් වේදනාවක් නොවේ. මේ පෙම්බර මාතාව තුළ තිබුණු තිර කැපවීම නිසාම එතුමිය එය දරාගෙන ජේසු සමිඳුන් සමඟ කුරුසිය කරා පියමං කළාය. එය ජේසුස් වහන්සේට දිරියක් වුණා. කිසිම දෙමාපියෙක් තම දරුවාගේ මළ සිරුර තුරුළට ගන්නවා තියා ඇස ගැටෙන්නවත් කැමැති නැහැ. නමුත් මරිය මාතාවන්ට ඒ වේදනාවත් හිමිවුණා. කෙතරම් මාරාන්තික අත්දැකීම් වලට මුහුණ දීමට සිදු වූවත් විශාල කැපවීමකින් ඒවා දරා ගත්තා. අපට ගැළවීම ලැබුණෙ මරිය අම්මාගේ මේ උත්තරීතර කැපවීම නිසයි.

අදට වඩා හොඳ හෙටක් පතන හැම දෙනාටම ආදර්ශයක්. හොඳ මඟ පෙන්වීමක්. මේ කැපවීම හරියාකාරව ඉටුකළොත් අපේ පවුල්, ගම, රට විතරක් නොව ලෝකෙම දිනුම් හෙට දවස ගැන භය වෙන්න හේතුවක් නැහැ.

✍ **වැලිගම්පිටියේ වෝල්ටර් රත්නායක**

# මරණයෙන් පසු මා කොතැනද?

**ලොව පුරා කිතු බැතිමතුන් මළවුන්ගේ මංගල්ලය නොවැම්බර් මස 02 සිහිපත් කරනු ලබයි. ආත්මය, ශරීරයෙන් වෙන් වූ පසු ඉන් ඔබ්බට කුමක් වේ දැයි කිසිවකු නොදනී.**



එය හමා යන මද නළ ඔස්සේ මහත් ආශාවෙන් ඉල්ලා සිටිනුයේ දෙවියන් වහන්සේගේ ආධ්‍යාත්මික හැඬරුවයි. ඒ ආත්මය තුළ ඒකායන බලාපොරොත්තුව උන්වහන්සේ වෙත ළඟා වීමයි. එහෙත් ඊට ඉඩකඩක් නොමැති කල සංතෘෂ්ටියට පත් නොවන ඒ ආත්මයන් ගැන අති ශෝචනීයයි.

මේ ලෝකයේ දිවි ගෙවන මිනිසාගේ ජීවිතය, තාවකාලික වන්දනා ගමනකි. මෙම වන්දනා ගමනේ ගමනාන්තය ස්වර්ග රාජ්‍යයට සමීප වීමයි. එය අවසාන මොහොත එළඹෙන තුරු ශුද්ධගිනිස්ථානයේ ආත්මයන් විඳින දුක මිනිසාට තේරුම් ගැනීමට අපහසු කාර්යයකි. සමහර කතෝලික පිරිස් බොහෝ බැතිබර වුවත් ශුද්ධගිනි ස්ථානයේ දිළිඳු ආත්මයන් නොතකා හරිමින් කටයුතු කිරීම කිතුනු අපට ලජ්ජා සහගත ක්‍රියාවකි. මේ ශුද්ධවූ ආත්මය වෙනුවෙන් මරණයෙන් පසු යාච්ඤාවක් හෝ දිව්‍ය පූජාවක් නොමැතිව දින, සති, මාස, අවුරුදු ගෙවී යයි. කලාතුරකින් හෝ එම ආත්මයන් උදෙසා දිව්‍ය පූජාවක් හෝ යාච්ඤාවක් පවත්වන්නට අදහස් කරන්නේ වසරකට වරක් එළඹෙන මළවුන්ගේ දිනයේ දී පමණයි.

මෙම තාවකාලික වන්දනා ගමන තුළ යාච්ඤාවේ ජීවිතය ප්‍රතික්ෂේප කරමින්, ලෞකිකත්වය මුදුන් පත්කර, මරණීය පාපයන්ගෙන් ආත්මය විනාශ කරගෙන මරණ මංචකයේ දී පාපොච්චාරණය කර පසුතැවිලි වුවද ඔවුනට ශුද්ධ ගිනිස්ථානයේ රැඳෙන්නට සිදුවන බව වන්දනීය බීඩ් තුමා අවධාරණය කරයි. අපගේ පොළොවේ ගින්දර ශුද්ධ ගිනිස්ථානයේ ගින්දර සමඟ සංසන්දනය කරද්දි ගත සනසන සිසිල් සුළඟක් බව තවත් සාන්තුවරයකු පවසයි.

එය ගින්නේ බන්ධනාගාරයකි. ලෞකික ජීවිතයේ වරදකරුවන් බන්ධනාගාරගත වී, අධිකරණ තීන්දුවෙන් නිදහස් වන පරිදි, ආධ්‍යාත්මික ජීවිතයේ වරදකරුවන් ස්වාමින් වහන්සේගේ නඩු තීන්දු දිනයේ දි නිදහස ලබයි. එය ලෝක අවසානයේ ජාතීන්ගේ විනිශ්චය දිනයයි.

ජාතින්ගේ විනිශ්චය දිනය භයංකාර දිනයකි. මනුෂ්‍ය පුත්‍රයාණන් සියළු දේවදූතයන් පිරිවරාගෙන තේජශ්‍රීයෙන් පැමිණි කල එතුමාණෝ තමන්ගේ මහිමාන්විත සිංහාසනයේ වැඩහිඳින සේක. එවිට සියළු ජාතිහු උන්වහන්සේ ඉදිරියෙහි රැස්කරනු ලබන්නෝ ය. එඬේරකු එළුවන්ගෙන් බැටළුවන් වෙන්කර ගන්නාක් මෙන් උන්වහන්සේ ඔවුන් වෙන් කොට, බැටළුවන් සිය දකුණු පැත්තෙහි ද, එළුවන් වම් පැත්තෙහි ද සිටුවනු සේක.

එවිට රජ්ජුරුවන් වහන්සේ (ස්වාමින් වහන්සේ) සිය දකුණු පසේ සිටින්නන්ට කතාකොට මාගේ පියාණන් ගෙන් ආශිර්වාද ලද්දෙනි, එන්න ලෝකය පටන් ගැන්මේ සිට ඔබට සූදානම් කර තිබෙන රාජ්‍ය උරුම කර ගන්න. ඉන් අනතුරුව වම් පසෙහි සිටින්නන්ට කතා කොට, ශාප ලද්දෙනි, මා වෙතින් ඉවත් වී යක්ෂයාට ද, ඔවුන්ගේ දූතයන්ට ද, සූදානම් කර තිබෙන සදාකාල ගින්නට යන්නයි වදාරන සේක.

“යමෙක් මුළු ලෝකය ලබාගත්තත් සිය ජීවිතය නැති කරගත හොත් ඔහුට කුමන ලාබයක් ද?” (ලූක් 9:25). මෙම තාවකාලික වන්දනා ගමනේ තීරණාත්මක මොහොත මෙදිනයි. ස්වාමින් වහන්සේගේ මේ වදනට පිළිතුරු සෙවිය යුත්තේ අප විසින්මයි. මරණයෙන් පසු මා කොතැනද? යන පැනයට විසඳුම් සෙවීමට ස්වාමින් වහන්සේගේ නීති පොත වන ශුද්ධවූ බයිබලය අපට මතක් කර දෙයි. “සිතුවිලි සියල්ල මිනිසා සතුය. අවසන් තීරණය සමිඳුන් වෙතය.” (හිතෝපදේශය 16:1-3)

✍ **මයිකල් සෙබස්තියන් සෝමරත්න - රන්පොකුණුගම**

ධර්ම සංග්‍රහය

# “මරියා” නම් වූ ඇඈ...



**“බලන්න, මම සමිඳාණන් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙසම මට ඉටු වේවා!”**

මෙසේ පැවසූ ඇ අන් කවරෙකුවත් නොව අප ගැලවුම්කරුවාණන්ගේ මෑණියන්ය. දේව වචනයට අවනත වූ එතුමිය අප ස්වාමින් වහන්සේගේ අභිරහස්මක පිළිසිඳ ගැනීමෙන් එනම් දේවත්වය පසෙකලා මිනිසත් බව ගත් දෙව් බිළිඳුන්ගේ ශ්‍රී වත මඬල පළමු වරට දැකීමට තරම් භාග්‍යවන්ත වූවාය. පිළිසිඳ ගැනීමේ දී ම ජම්ම පාපයෙන් නිර්දෝෂ වූ මෑණියෝ දෙව් පුතුව උපතේ සිට අවසානය දක්වා ආදරයෙන් රැකබලා ගත්තාය. සියල්ල සිත්හි නිදන් කර ගනිමින් තම එකම පුතනුවන්ව, දේව පුත්‍රයාණන්ව නීච ලෙස දඬුවම් දී මරා දමන අයුරු, කුරුස පත් කරන අයුරු තම දෑසින්ම දුටුවාය. මිනිස් සංහතියේ ගැලවීම වෙනුවෙන් සියල්ල නිහඬව දරාගත් ඒ උතුම් නිර්මල මෑණියෝ එදා කුරුස පාමුල අප සැමගේ අම්මා වීම අප ලද උතුම්ම තිළිණයකි. කීකරුකම, බැහැපත්කම, පිරිසිදුකම, දේව අභිමතයට අවනත වීම තුළ ලොව පාරිශුද්ධ කිරීමේ කාර්යයට දායක වූ ඕ තුමිය නිහඬව අද අපට පවසන දෑ බොහෝ ය. නූතන සමාජයට ඇ නිහඬ අභියෝගයකි. පූර්වාදර්ශයකි.


වත්සුණු තවරා, ස්වභාවිකත්වය විකෘති කරමින් බටහිරකරණය තුළ මනුෂ්‍යත්වය පාවා දෙමින් මුදලට විකිණෙන මෙවන් පාපතර යුගයක පිරිසිදු මෑණියෝ සැබවින්ම ආදර්ශයකි. ශුද්ධාත්මයාණන්ගේ මහානුබලයෙන් හා පරමෝත්තමයාණන්ගේ ආනුභාවයෙන් කන්‍යාවකව සිටියදීම ගැබ් ගත්තද දෙව් අණට හිස නැමූ ඇ තම කුළුඳුල් පුත්‍රයාව ගව මඩුවක බිහි කළාය. මෙලොව එළිය දැකීමට පෙරුම් පුරන, මිනිසත් බව ජීවයේ උපතේදීම නැතිකර දමන හා ඉපදුන මොළකැටි බිළිඳුන් අතර මඟ දමා යන, දරුවන් ගැන හැඟීමකින් තොරව වගකීම් හා යුතුකම් පැහැර හරිමින්, මාතෘත්වය දෙදරවා හරින කාන්තාවන්හට සැබෑ බිරිඳක හා මවක ලෙස තම දිවිය ගත කරන්නට දේව මාතාවෝ මාර්ගෝපදේශයකි.

ලොව පුරා විසිරී සිටින කතෝලික බැතිමතුන් පමණක් නොව අන්‍ය විශ්වාසකයින් පවා දේව මාතාවන්ගේ මැදහත්කමින් ලද වරප්‍රසාදයන් බොහෝ ය. ජාති, කුල, ආගම්, වර්ණ භේද නොතකා සැමට මව් සෙනේ උණුසුම ලබා දෙන මෙම සදාසරණ මෑණියෝ අපගෙන් අයදිනුයේ එදා කානාහි සරණ මංගල්‍යයෙහි දී මෙන් “මෙතුමාණන් ඔබට කියන කොයි දෙයක් වුවද කරන්නැ”යි යනුවෙනි. දෙවිඳුන්ගේ හඬට සංවේදී වීමට අවැසි අවනත සිතක් දුර්වල අප තුළ මවා වදාරණ මෙන් මරිය තුමියගේ මැදහත්කමින් දෙවිඳුන්ගෙන් යදිමු.

ජපමාල බැතිය, මරිය උත්තමාවන්ට දැක්වූ ගෞරවාදරය මැයි මාසයට පමණක් සීමා නොකරමු. දිනපතා ජපමාලය උච්චාරණය කරමින්, පිරිසිදු දිවි පෙවෙතකින් එතුමියගේ සළු සෙවණේ රැකවරණය තුළ බැහැපත්, පිරිසිදු සිතකින් සමිඳු වෙතට පිය නඟමු.

✍ **ගරු මේරි රංගිකා පැවදි සොයුරිය (ඒ. සී)**

# ණයගැතියි සැමදා ඔබ හට



ආයාචනා කළා
සමිඳුන් හට
වරක් දෙවරක්
ඇදහිල්ලෙන් සිට
විවර කළා දීප්තිමත්
දැස් යුවළ
සිසිලසක් දැනුණා
ගිනිදැල් නිවී ගොස්

විමසුවා කරුණු කාරණා
ඇසුවා සාවධානව
සිප ගත්තා ආදරයෙන් මුසපත්ව
ඉටු කළා බලාපොරොත්තු නොමසුරුව

සමිඳුනි, මාගේ ස්වාමිනී!
ණයගැතියි සැමදු ඔබ හට
පැසසුම් වේවා!

✍ **වසන්ත පී. ඒ. රත්නායක**

## ජන වන්දනාව

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

### දෙවන සතිය ඉරිදා උදා යාම යැදුම

### 118 වැනි ගීය

පසුගිය සතිය හා සබැඳේ

සමිඳුන්ට ස්තුති කරන්න :
සාමුහික ස්තෝත්‍ර ගායනය පුරාණ ගිවිසුම් යාච්ඤා සම්ප්‍රදායේ ඉස්මතුවන ලක්ෂණයකි (ගිතා 106:1, 107:1, 136:1). එලෙස තුති පිදීම සිදු කළේ ඔවුන් තම දිවිය තුළ අත්දුටු දෙවි සමිඳාණන්ගේ "යහපත්කම" (හෙබ්‍රෙව් බසින් "ටෝබ්") සහ තිර පෙම (හෙබ්‍රෙව් බසින් "හෙසෙද්") නිසාය.

ඊශ්‍රායෙල් දැන් කියත්වා:
සාමුහික දේව වන්දනා පසුබිම තුළ ජනතාව කණ්ඩායම් වශයෙන් එක්ව යාච්ඤා කළ බැව් නිරීක්ෂණය කළ හැකිය. විවිධ ජනකොටස්, එනම්, ඊශ්‍රායෙල් ජනතාව, පූජකවරු සහ දෙවියන් වහන්සේ වෙත ගරු බිය දැක්වූ අන් අය ආදි වශයෙනි (උදා: ගීතා 115:9-11, 135:19-20, ජෙරමි 31:7,10).

(ආ) වගන්ති 5-9
මෙහි දැක්වෙන අන්දමට තුති පිදීමේ නිතර පුද්ගලයා රජකු විය හැකි බව විශාරදයෝ පවසති. අතීතයේ පීඩිත, බෙලහීන හා අභියෝගදායක අවස්ථාවලදී දෙවි සමිඳාණන් වහන්සේ ඔහුගේ යැදුම්වලට සවන් දී පිළිතුරු දුන් අන්දම මින් විස්තර වේ.

මා නිදහස් කළ සේක :
හෙබ්‍රෙව් පිටපතට අනුව එය "මා ඉඩකඩ ඇති තැනක සිටින්නට සැලසූ සේක" ලෙස දැක්වේ. මෙය දෙවියන් වහන්සේගේ ගැලවීමේ ක්‍රියාවේ ස්වභාවය හා ප්‍රතිඵලය සංකේතාත්මකව දක්වන්නේ ය. (ගීතා 18:20).

මම බිය නොවන්නෙමි:
දෙවියන් වහන්සේ තමන්ගේ පැත්තේ සිටින හෙයින් ඇතිවන සුරැකිබවේ හැඟීමයි මින් දැක්වෙන්නේ. මෙම ප්‍රකාශය පුරාණ ගිවිසුම් ලේඛනවල දෙවි සමිඳුන්ගේ රැකවරණය තහවුරු කිරීමේ විශේෂ යෙදුමක් සිහිපත් කරවයි: "බිය නොවන්න, දෙවිඳුනි ඔබ සමඟය" (යෙසායා 40:9, ජෙරමි 1:8).

(ඇ) වගන්ති 10 - 18
සතුරු උපද්‍රව වලට මැදිව සිටින මොහොතක දෙවි සමිඳාණන් මඟින් හිමිවන රැකවරණය ජයග්‍රහණයට තුති පිදීම ප්‍රබල සාහිත්‍යමය ශෛලියකින් ගීතිකා

### ගීතාවලිය



ශුද්ධ ලියැවිලි වසර

**(33)**

**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

කතුවරයා ඉදිරිපත් කරයි.

සතුරෝ මා වටකර ගත්හ:
සතුරු බලවේගවලින් එළඹෙන තර්ජන හා අනතුරුදායක බව බොහෝ විට යුද පසුබිමක් සිහිපත් කරන භාෂා ශෛලියකින් බයිබලීය ලේඛනවල දැක්වේ. (ගීතා 2:12, 18:5-6).

සමිඳුන්ගේ බලයෙන්:
හෙබ්‍රෙව් පිටපතට අනුව "සමිඳුන්ගේ නාමයෙන්" යනුවෙන් පරිවර්තනය කළ හැකිය. අනතුරු අවස්ථාවලදී යුද තත්ත්ව වලදී දෙවි සමිඳුන්ගේ සරණ පැතීම පුරාණ ගිවිසුමෙහි ගැඹුරු සැදැහැ ආකල්පයක් විණි. (1 සාමුවෙල් 17:45, ගීතා 20:7).

මාගේ සවියද ගීයද වෙති :
විජයග්‍රහණයේ ගීත පෙන්නුම් කරන්නේ දෙවියන් වහන්සේගේ විශේෂ මැදිහත්වීමයි. එය පීඩිත, දුඃඛිත දේව ජනතාවට දෙවිඳුන් දක්වන ආදරය හා රැකවරණය හඬගා ප්‍රකාශ කිරීමක් වන්නේය. (නික්ම 15:2, යෙසායා 12:2).

දැඩි ලෙස මට දඬුවම් දුන් සේක :
මෙයින් දිවැසිවර සහ ප්‍රඥා සාහිත්‍යයේ ශෛලියක් පිළිබිඹු වේ. එහි අරමුණ වන්නේ දුෂ්කර අත්දැකීම් තුළින් හික්මීමක් ලබා දීම දෙවි සමිඳාණන්ගේ අභිමතය බවයි (හිතෝප. 3:11-12, ජෙරමි 10:24, ගීතා 6:1-2).

(ඇ) වගන්ති 19:29
මෙම කොටස තුළ තුති පිදීමේ දේව වන්දනා පිළිවෙත සරල සැකැස්මක් දිස්වේ: ආයාචනය, පිළිතුරු තුති පිදීම යනුවෙනි.

දම්ටුකමේ දොරටු:
දේව වන්දනාව සඳහා දෙව්මැඳුරට ඇතුළුවීම සඳහා සුදුසුකම දැහැමි බවය (ව. 20, ගීතා. 15:2). එවැනි අය දෙවියන් වන්සේගේ ගැලවීමදායක දම්ටුකමෙහි පංගුකාරයෝ වන්නෝය.

ගෘහ ශිල්පීන් ඉවතලූ ගලම :
මෙම උපමා රූපී ප්‍රකාශය යම් අතිශයින් වැදගත් දෙයක් නොසලකා හැරීමේ යථාර්ථය පිළිබිඹු කරයි. එහෙත් දේව සැලැස්ම තුළ මිනිස් මිනුම් දඬු ඉක්මවා යන දෙවිඳුන්ගේ ක්‍රියාකාරිත්වය ඉන් හැඟවේ. (යෙසායා 28:167. නව ගිවිසුමේ ජේසුස් ස්වාමින් වහන්සේ සඳහා මෙම වැකිය යොදාගෙන ඇත. (මතෙව් 21:42, ක්‍රියා 4:11).

සමිඳුනි අප ගැළැවුව මැනව:
දෙවියන් වහන්සේගේ ගැලවීමදායක මැදහත්කම වෙනුවෙන් කෙරෙන ප්‍රබල ආයාචන ගීතාවලියෙහි කැපී පෙනෙන ලක්ෂණයකි. හෙබ්‍රෙව් බසින් "හෝසන්නා" යන වදනින් එය දැක්වේ (ගීතා 12:1, 20:10). නව ගිවිසුමෙහි ජේසු සමිඳුන් ජෙරුසලමට ජයග්‍රාහී පිවිසීමේ කතා පුවතෙහි මෙය සඳහන් කෙරේ (මතෙව් 21:9).

**යැදුම**

මිනිස් අපව ආදරයෙන් සුරකින දෙව්පියාණන් වහන්ස, ඔබවහන්සේගේ අසීමිත යහපත්කම හා දයා කරුණාව වෙනුවෙන් නිරන්තරයෙන් අපි ඔබවහන්සේට තුති පුදමු. මෙලොව දිවි ගමනේ අප මුහුණ දෙන අනතුරු, විපත්ති අභියෝග මැද ඔබවහන්සේගේ රැකවරණය කෙරෙහි විශ්වාසය තබා ජීවත්වීමට වරම් දුන මැනව.

ලබන සතියට..

## මළවුන් නැගිටියි....



පණවුන් නිදියයි
අසාධාරණ ලොව
විලම්භීත දේ
ඇහින් දැක දැක
දෑස් තද කරගෙන...

මළවුන් නැගිටියි
අසාධාරණ ලොව
සිදුවන විලම්භීත දේ
ඇසින් දකින්නට...
දුකින් පිරි දෑසින්
කඳුළු කැට වගුරවමින්....

**එස්. පී. වසන්ත මාලා**
**කොටරූපේ - රද්දොළුගම**

## අදහමි දිව්‍ය සත්ප්‍රසාදෙනි

*එදා අන්තිම රාත්‍රි භෝජනය අවස්ථාවේ අප සමිඳාණන් විසින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කරන ලදි. උන්වහන්සේ මෙම පූපය තමන් වහන්සේගේ ශ්‍රී ශරීරයත්, ශ්‍රී රුධිරයත් බවට පත් කළ සේක. සුදෝ සුදු පූපයක් ආකාරයෙන් අප සමිඳාණෝ සැමවිටම දිවා රෑ නොබලා දේවස්ථානවල ජීවමානව වැඩ සිටින්නාහ. එය අපේ ඇදහිල්ලයි. විශ්වාසයයි. සමස්ත සාන්තුවරුන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට මහත් ඇල්මක් දක්වන ලදි. දැන් අපි සත්ප්‍රසාද වහන්සේට ඉමහත් ඇල්මක් හා ආදරයක් දැක්වූ සාන්තුවරුන් කිහිපදෙනෙක් විමසා බලමු.*

දිව්‍ය හෘදයේ ප්‍රේමවන්ත දාසිය වූ මර්ගරීතා මරිය අලකොක්තුමී දවසක් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ යාච්ඤා කරන විට ජේසුස් වහන්සේ එතුමියට දර්ශනය වුණා. ජේසුස් වහන්සේ ඇයට එතුමන්ගේ දිව්‍ය හෘදය පෙන්වූ අතර දිව්‍ය හෘදය තුළින් ගිනි ජාලාවන් පිටවෙමින් තිබුණි. එය වටේ කටු ඔටුන්නක් ද එය මත්තෙන් කුරුසියක් ද ඇතිවිය. ජේසුස් වහන්සේ ඇයට කතා කරමින් පැවසුවේ මිනිසුන්ට ඇති ප්‍රේමයෙන් තම හෘදය ඇවිලී යන බවයි. නමුත් මනුෂ්‍යයන් මා හට කෙලෙහිගුණ නොසලකන බවත්, දිව්‍ය සත්ප්‍රසාදය වන උන්වහන්සේට අගෞරවය දක්වන බවත් ය. මෙම දර්ශනය අවස්ථාවේ දී ජේසු සමිඳාණෝ තමන් වහන්සේට ගෞරවයක් පිණිස සත්ප්‍රසාද මංගල්‍යයේ අෂ්ටාංගයට පසු පැමිණෙන සිකුරාදා දින විශේෂ මංගල්‍යයක් පැවැත්වීමට කටයුතු කරන ලෙස මර්ගරීතා මරියතුමියට පැවසුවා. ඇත්තෙන්ම අපගේ දේවස්ථානයන් තුළ ආහාරපාන ගැනීමෙන්, ඒ මේ අත දුවමින්, සත්ප්‍රසාද වහන්සේට වැඳ නමස්කාර නොකරමින් යාම උන්වහන්සේට අගෞරව කිරීමක් ය.

ජේසු ස්වාමිදරුවන් ශු. මරිය මග්දලේනාට හා පසි තුමියට ද දර්ශනය වී දිනකට තිස්තුන් වරක් තමන් වහන්සේව දිව්‍ය සත්ප්‍රසාදයෙහි බැහැදකිනවාට ආශා වන බව දැන්වූහ. එතුමිය විශ්වාස පක්ෂකමින් එයට කීකරු වූ බව ඇගේ ජීවිත කතාවේ සඳහන් වේ. තවද සිසිලියාවේ සත්‍ය විශ්වාසය පතළ කළාවූ ලුවිස් ලා නූසා නමැති පියතුමා ගිහියෙක්ව සිටි කාලයේ දී පවා, ජේසුස් වහන්සේට ප්‍රේමයෙන් බැඳී සිටියා. එතුමා කෙතරම් ප්‍රේමයෙන් සිටියාද කිවහොත් එතුමාගේ ශ්‍රේෂ්ඨයින්ගේ අණ ප්‍රකාර කීකරුකම නිසා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියෙන් බැහැරව ගියේ ඉතා අමාරුවෙනි. එම අවස්ථාවලින් තමාව බලෙන් ඇදගෙන යන්නාක් බව එතුමාට හැඟුණි.

සත්ප්‍රසාද වහන්සේට භක්ති ප්‍රේමයක් දැක්වූ තවත් ශුද්ධවන්තයෙකි, සා. ඇලෝසියස් ගොන්සාගා තුමා. මෙතුමා තරුණ සාන්තුවරයෙකි. එතුමාත් පෙර කී පරිදි දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ළඟින් ඈත් වූයේ බොහෝමත් අමාරුවෙනි.

සා. ප්‍රැන්සිස් සාවියර් තුමා දිවා කාලය තුළ මිනිසුන්ගේ යහපත පිණිසත් රාත්‍රි කාලයේ දී සත්ප්‍රසාද වහන්සේ ළඟ සිටිමින් රැය පහන් කළා. දේවස්ථානය වසා ඇති අවස්ථාවලදීත් අව්ව - වැස්ස නොබලා දෙව්මැඳුරෙන් පිටත දණින් වැටී යාච්ඤා කළ අතර ඉන්දියාවේ තමාට සිදුකිරීමට තිබුනු වැඩකටයුතු වලට ශක්තිය, ධෛර්යය වූයේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගේ මාර්ග යෙන් බව එතුමාගේ ජීවිත කතාව අධ්‍යයන කළ විට මොනවට පැහැදිලි වේ.

ඉදිරියට

**බී. ඒ. මනෝජ් දිවන්ක - බණ්ඩාරවෙල**

සතියේ මෙනෙහි කිරීම

# "ආදරය වීම සහ ආදරය කිරීම"

## නොවැම්බර් 04 - සාමාන්‍ය සමයේ තිස්එක්වන ඉරුදින

**අද ශුද්ධවු සුවිශේෂයෙන් අපට අසන්නට ලැබෙන්නේ පනත් වලිනුත් අති ශ්‍රේෂ්ඨතම පනත ගැනය. මෝසෙස්ට අනුව පරණ ගිවිසුමේ පනත් දහයක් තිබේ. ජේසු සමිඳුන් මේ පනත් දහයම එක පනතකට හකුලයි. එහි නම "ප්‍රේමයේ පනත"ය. ප්‍රේමයේ පනත එකක්මය. එනම් දෙවියන් වහන්සේට ආදරය කිරීම හා සහෝදර සහෝදරියන්ට ආදරය කිරීමය. මෙහි තේරුම ආදරය තිබේ නම් හැමදේම අන්තිමයේ දී එක් ලස්සන දෙයක් බවට පත්වන බවය. අප අතර ඇති ප්‍රශ්න වලට හේතුව අප අතර ඇති පරතරය ය. මේ පරතරය නැත්තටම නැතිවන තුරු අපට අන් හැම දේම තිබුණද ආදරය නොලැබෙයි.**

බැලූ බැල්මට සරළ යයි සිතෙන මේ පනත දෙස අපි හොඳ කල්පනාවෙන් බැලිය යුතුයි. ජේසු සමිඳුන් කියන්නේ ආදරය කිරීම මුළු හදවතින්ම පමණක් කළ යුතු දෙයක් නොවන බවයි. සාමාන්‍යයෙන් ආදරය සංකේතවත් කිරීමට අපි අඳින්නේ අනංගයාගේ ඊතලයකින් සිදුරු වූ හෘද වස්තුවකි. එහෙත් ජේසු සමිඳුන් කියන්නේ ආදරය හෘද වස්තුවට පමණක් සීමා කිරීම වැරදි බවය. උන්වහන්සේ කියන ආදරයට මුළු ශරීරයම අයිති වෙයි. තවද එය උන්වහන්සේ කියන්නේ මුළු



හෘදයෙන් ද, මුළු සිතින්ද, මුළු බුද්ධියෙන් ද, මුළු වීර්යයෙන් ද කළ යුතු ආදරයක් ගැනය. එනම් ආදරය කරන විට මුළු ශරීරයම ඊට උපරිමයෙන් සහභාගි විය යුතු බවය. එනම් ආදරය කරන විට වෙන කිසිදෙයක් කිරීමට නොව වෙන කිසි දෙයක් ගැන සිතීමටවත් අපට නොහැකි බවය.

දැන් අපට අප කරන ආදරය ඇත්තටම ආදරයක් දැ යි සිතා ගැනීමට පහසුය. අප අද හැම දේම කරන්නේ තවත් දේවල් කරන අතරතුරය. වාහනය පදවන විට දුරකථනයෙන් කතා කිරීම අඩුම තරමේ පොලීසිය දකින විට හෝ නැවැත්වීමට අපි පෙළඹෙමු. එහෙත් ආදරය කරනවා කියමින් අප ඒ ආදරයටම පටහැනිව කරන අනිත් හැමදේම නතර කිරීමට පොලිසියක් කොයි රටේවත් නැත. අද අපේ පවුල් අවුල් ජාලයක් වී ඇත්තේ බිරිඳ සහ දරුවන් ගැන අපේ හිතේ ආදරයක් නැති නිසා නොව ඔවුන්ට මුළු සිතින්, මුළු හදවතින්, මුළු බුද්ධියෙන් සහ මුළු වීර්යයෙන් ආදරය කිරීමට අතපසු කිරීමය. ජේසු සමිඳුන්ට අනුව ආදරය කිරීම අනිත් දේවල් මෙන් කළ නොහැකිය. ආදරය කිරීමට අනිත් හැමදේම කැප කළ යුතුය. නතර කළ යුතුය. ආදරය ආදරයක් වන්නේ ආදරයට පළමු තැන දීමෙන් සහ අන් හැමදේම දෙවෙනි තැන තැබීමෙන් ය. හැම බිරිඳකටම ඇත්තේ එක ස්වාමිපුරුෂයකු පමණි. හැම ස්වාමිපුරුෂයකුටම ඇත්තේ එකම එක බිරිඳකි. ආදරය යනු අන් හැම දෙයක්ම පමණක් නොව අන් හැම කෙනෙක්වම පවා කැප කරන්නට වන බැඳීමකි.

ආදරය කිරීම අන් හැමදෙයම හෝ අන් හැම දෙනෙක්වම පමණක් නොව ඔබට ඔබව පවා කැප කර ගනිමින් කිරීමට සිදුවන දෙයකි. මුළු හෘදයෙන් ද, මුළු සිතින්ද, මුළු බුද්ධියෙන් ද, මුළු වීර්යයෙන්ද යනුවෙන් අදහස් කරන්නේ ඔබේ මුළු ජීවිතයමය. ආදරය වීමට ආදරය කිරීමට වඩා අමාරුය. ආදරය වීමට නම් ඔබේ මුළු ජීවිතයම වියදම් විය යුතුය. ඔබ නැත්තටම නැති විය යුතුය.

ජනතා හඬ

# ජීවතුන් වැඩිහිටි නිවාස වල ගාල්කර මළවුන් සැමරීම

**කතුතුමනි,**

බොරැල්ල සුසාන භූමිය අගනුවර ප්‍රසිද්ධ ස්ථානයකි. එහි ආරම්භය මීට ශත වර්ෂ කිහිපයකට පෙර වසූරිය, ක්ෂය රෝගය, ලාදුරු වැනි රෝග් සඳහා නිවාරණ ඖෂද සොයා ගෙන නොතිබු යුගයක එම බෝවන රෝග වලට ගොදුරු වූවන් ගෙනවිත් දැමු හුදකලා නවාතැන් පලක් වූ බවට මතයකි. ඒ සමාජයේ ප්‍රජාව අතර පැතිරීම වැලැක්වීම අරමුන කර ගෙනය. එම රෝගින් මිය යාමත් සමඟ එහිම වළලා හෝ පුලුස්සා දැමිය. කාලයාගේ ඇවෑමෙන් එය සුසාන භූමියක් විය.

එහි සත්‍ය, අසත්‍යතාව කෙසේ වුවද තමන් ලොවට බිහිකර තමන් ඇති දැඩි කර, අධ්‍යාපනය ලබාදුන් දෙමාපියන් වයස් ගත වූවිට මානසිකව හෝ ශාරීරිකව දුබල වුවිට, විදේශ ගත වීමේ තීරණය මත හෝ තමන් වැජඹෙන සමාජය මෙම දුබල දෙමාපියන් දැකීම තම පෞරුෂයට වන කැළලක් යයි සිතා හෝ තම ලේලියගේ හෝ බෑණුනුවන්ගේ පෙළඹවීම මත හෝ කලබලකාරි සමාජ රටාවට මුහුණ දීමට අපේක්ෂාවෙන් හෝ දෙමාපිය දේපල පිළිබඳව තෘප්තියට පත් නොවීම නිසා හෝ විවාහ ජීවිතයේ අසාර්ථක බව නිසා හෝ නිවස අපවිත්‍ර වන නිසා යන මතය නිසා හෝ මොනයම් හෝ කරුණක් මුල්කර ගෙන - වැඩිහිටි නිවාස කරා ගාල් කිරීමේ ප්‍රවනතාවයක් සමාජයේ දක්නට ලැබේ. සමහර උදවිය මේ සඳහා පදිංචි ස්ථානයේ සිට සැතපුම් ගණනාවක් දුරින් පිහිටි - පහසුවෙන් ලඟාවිය නොහැකි ස්ථාන ද තෝරා ගනිති. එම තෝරාගත් ස්ථාන ද මහලු දෙමාපියන් සේම ශාරීරිකව, මානසිකව, සමාජියව ගරා වැටුනු ස්ථාන බවට පත්ව ඇත. ඇතැම් ස්ථාන පහසුකම් අතින් ඉතා පහත් තත්ත්වයක පවති. මුලුතැන් ගෙය, වැසිකිලිය, සහ පිටුපස කානු පරීක්ෂා කළවිට මෙය ඉතා පැහැදිලිය. ඉතා දුර්වලව සිටින ඔවුන්ට අපේක්ෂා කරන ආධ්‍යාත්මික ජීවිතයේ තෘප්තියද ලැබීමට ඇතැම් වැඩිහිටි නිවාස වල ඉඩ නොලැබේ.

සමාජ විද්‍යාවේ හඳුන්වා දෙන විස්තෘත පවුල අද න්‍යෂ්ටික පවුල බවට පත්ව ඇත. මෙම න්‍යෂ්ටික පවුල තුළ දරුවා. ආච්චි, සීයා, දකින්නේ වැඩිහිටි නිවාස වලය. එම දරුවා වැඩිහිටියකු වූ විට තම මවට පියාට සැලකීමට නිරායාසයෙන්ම වැඩිහිටි නිවස මනසට නැංවේ. ඉපැරණි සමාජයේ සිදු වූ මහලු අයට නිවසේදි ඇප - උපස්ථාන කිරීම එම දරුවා දැක නැති නිසා ඔහුට ඒ පිළිබඳව අත්දැකීම් ද ලැබී නැත. මෙවැනි සුසාන භූමිවල භූමදානය හෝ ආදාහනය පිණිස ගෙනෙනු ලබන මෘත දේහවල විශේෂයෙන් වැඩිහිටි නිවාස වලින් ගෙනෙනු ලබන ඒවායේ ඥාති සම්බන්ධතාවයක් නොමැති ඒවා බොහෝය. ඒවා මල්ශාලා සේවක මහතුන් හෝ වැඩිහිටි නිවාසවල සේවක මහතුන් එම වගකීම බාර ගනි. හැරත් කිසිදු ආගමික වතාවත් සිදු නොවි සතකු සේ පසට යට වේ. තවත් සමහර වැඩිහිටි නිවාස වල මළ සිරුර බාර ගත් පුතා හෝ දියණිය තම හෘද සාක්ෂිය කථා කරන නිසාදෝ කිසිම තොරතුරක් දීමට මැලි බවක් දක්වයි. ඒ අතරම දුර බැහැරින් තෝරා ගත් මෙම සුසාන භූමිය හි සිදු කරන අවසාන කටයුතු අධික මුදල් සම්භාරයක් වැය කොට ප්‍රසිද්ධ මල් ශාලා තෝරා ගෙන ප්‍රභූවරුන් ඉදිරියේ කරන රඟපෑම් ද දක්නට ලැබේ. මියගිය ප්‍රභූ පුද්ගලයකුගේ සොහොන අසලම වල දැමීමට හෝ ආදාහනය කළ අළු තැන්පත් කිරීමට සොයන අයද මේ අතර සිටිති.

දූවිල්ලෙන් සෑදුනු සිරුර - දූවිල්ලට හැරී යන බව සිහිපත් කරදෙන මේ මාසයේ කිතු තුමන් වදාළ දකුණු අතින් දෙන දෙය වමතට නොදැනේවා යන්නට අර්ථ කථනයක් දෙමින් දස පනතේ හතරවන පනතට අවනත වීම තුළින් වැඩිහිටි නිවාස ද නැතහොත් දෙමාපියන් අප හැදු - වැඩු නිවසේ සිට ඔවුන්ට ඇප උපස්ථාන කිරීමද උතුම් යන්නට කතෝලික අපගේ හෘද සාක්ෂිය විවෘත වේවා.

**එන්. ජයන්ත පෙරේරා**
මහජන සෞඛ්‍ය පරීක්ෂක
බොරැල්ල

# ශ්‍රී ලාංකික වැඩිහිටියා කොයිබටද ?



**කතුතුමනි,**

ශ්‍රී ලාංකික වැඩිහිටියා කොයිබටද? යනුවෙන් 2012.10.07 ඉරුදින ඥානාර්ථ ප්‍රදීප පුවත් පතේ ජනතා හඬ කොටසින් පලවු වීරහේන, ඩබ්. එල්. බැසිල් ප්‍රනාන්දු මහතාගේ ඒ ලිපිය කියවූ මාහට මෙය ලිවීමට සිත් විය. ඒ මහතා ලියා ඇති කරුණු කාරණා ඇත්තෙන්ම ඉතාමත් සත්‍යවුත් අගය කළ යුතු වුත් කාරණා බැව් මෙහිලා පළමුවෙන් සඳහන් කරනු ලැබීමට කැමැත්තෙමි. එදා අතීතයේ මෙම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සැම දෙනාම පාහේ වගකිව යුතු උසස් රැකියාවල නිරත වී අවංකව තම රාජකාරි කාර්යයන් හරිහැටි ඉටුකරමින් වත්මන් බාල පරපුරට ආදර්ශයක් වන ලෙසින් දිවිගෙවා අවසානයේදී නියමිත වයස් සීමාව සම්පූර්ණ වූ පසුව තම රැකියාවෙන් විශ්‍රාම ගත් පුද්ගලයන්ය.

ඇත්තෙන්ම එම පුද්ගලයින් විශ්‍රාම ගියායින් පසුව ඔවුනට සලකනුයේ කුමන ආකාරයකටද? ඔහු තමන් රැකියාව කරන තුරු අප්‍රතිහත ධෛර්යෙන් යුතුව තම රාජකාරි කාර්යයන් නොපිරිහෙලා ඉටුකර එම සේවය සඳහා ලැබෙන මාසික වැටුප ලබාගෙන ඔහුට හැකි අන්දමට තම තමන් වෙසෙන ගම් නියම්වල සමිති සමාගම් වල ද නිලතල දරා කටයුතු කරනු ලැබුවන්ය. ඉන්පසු තම තමන්ගේ රාජකාරි කටයුතු නිසියාකාරව ඉටු කළද විශ්‍රාම ගිය පසු අවලංගු කාසියක් ලෙස ඔවුන්ව ගණන් ගැනීම ද කළයුතු නොවේ. සමහර බොහෝ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට තම රැකියාවෙන් ලැබෙන විශ්‍රාම වැටුපට අමතරව කිසිම වෙනත් ආදායම් මාර්ග යක් නොතිබීමට පුලුවනි. එමනිසා රජය මැදිහත්වී මෙම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් හට තම මුදල් බැංකුවල ස්ථාවර ගිණුම් ආරම්භ කර ඒවායේ යොදවා ඇත. එමනිසා මෙම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් හට එම ගිණුම්වලට ලැබෙන සුලු පොලියට වඩා වැඩි උපරිම පොලියක් ලබාදීමට කටයුතු කරන ලෙස රජයෙන් ඉල්ලා සිටිමි.

**වෝල්ටර් නික්ලස් පෙරේරා**
නැගෙනහිර නයිනමඩම

# දුවන්නන් වාලේ දිවීම

**කතුතුමනි,**

මෑතක සිට අප රටේ බොහෝ කතෝලිකයන් හට බෝවී ඇති රෝගයකි. එනම් අප සාන්තුවරයන්ගේ විශාල ප්‍රමාණයේ ප්‍රතිමා නිර්මාණය කර ප්‍රසිද්ධ ස්ථානවල ස්ථාපනය කිරීම. මෙම බොහෝ ප්‍රතිමා දෙස බැලීමේදී ඇතිවන්නේ ශ්‍රද්ධාවක්, භක්තියක් නොව බියකි. තවද මෙය එම සාන්තුවරයන්ට කරන මදිපුංචිකමක් බව මගේ හැඟීමයි.

මෙම සාන්තුවරයන්ද අප මෙන් කාලයක් මනුෂ්‍යයන්ව මෙලොව යහපත් ජීවිතයක් ගතකර ශුද්ධාත්ම ලබාගත් පිරිසකි. ඉතින් මේ අයගේ ජීවමාන ප්‍රමාණයේ ප්‍රතිමාවක් මිස මනුෂ්‍යත්වයට නොගැලපෙන ප්‍රතිමා නිර්මාණය කිරීම නොසුදුසුය. බොහෝ අන්‍යාග මිකයන් නවරියන්, දහඅට රියන් ප්‍රතිමා නිර්මාණයකර ලංකාවේ උසම ප්‍රතිමාව, ලෝකයේ මහතම ප්‍රතිමාව කියා ප්‍රතිමා නිර්මාණය කළාට අප ඔවුන් සමඟ තරගයට ඉදිරිපත්වීම කතෝලික අපට සුදුසු නැත. යම් දිනක ජේසුස් වහන්සේ ඇණ ගැසීමේ ප්‍රතිමාවක් මේ ලෙස උසට මහතට නිර්මාණය කළොත් කුමක්වේද? මෙයට අපේ සභානායකයන්ගේ අවධානයට යොමුවේවායි පතමි.

**ප්‍රැන්සිස් කබ්රාල්**
කඳවල

# මරණයේ යථාර්ථය හඳුනාගෙන දිවිගෙවමු

**කතුතුමනි,**

දෙවියන්වහන්සේ අපට දී ඇති මේ උතුම් මිනිස් ජීවිතයට අප ගෞරව කළ යුතුය. අන් අයගේ ජීවිත වලටද ගරු කළ යුතුය. අන් අයගේ ජීවිත නැති කිරීමට අපට අයිතියක් නැත. එසේ වුවහොත් දේව විනාශයෙන් ගැලවීමක් නොලබන බවද දෙවිසමිඳාණෝ අපට පහදා දුන් සේක.

අප හැමවිටම දෙවියන්ට ප්‍රසන්නවන ලෙස ජීවත් විය යුතුය. අන් අයටද කිසිම කරදරයක් හිරිහැරයක් නොවන සේ අප ජීවත් විය යුතුය. මෙලොව ජීවත්වන සියල්ලන්ටම මරණය උරුමය අප තනිවම මරණයට මුහුණ දිය යුතුය. එය වැළැක්වීමට කල්දැමීමට හෝ සැඟවී පලායාමට නොහැකිය. නෑ හිතවතුන් මළ තැනැත්තා සොහොන් පිටියේ වළදමා ගිය පසු කිසිවකු එහි තනියට රැඳෙන්නේ නැත. සොහොන් පිටියේ වැළලී සිටින සියලු දෙනා එක සමානය. එහි දුප්පත් පොහොසත්, උගත් නූගත්, ජාති කුල භේද කිසිවක් නැත. ලොකු කුඩා කවුරුත් එක සමානය.

අපගේ අවසාන දිනයේදී ගැලවීම ලබනු පිණිස මෙලොව ජීවිතයේදී අප සූදානම් විය යුතුය. අප යම් දිනකදී ස්වාමින්වහන්සේ ඉදිරියේ පෙනී සිටිය යුතුය. අපගේ ශරීරය පොළවට පස්වන නමුත් අපගේ ආත්මය දෙවියන් ඉදිරියට යන්නේය. මෙලොවදි අප කළ සැම ක්‍රියාවක්ම, සිතින්, වචනයෙන්, රහසින් කළ සැම දේට දෙවිඳුන් ඉදිරියේ අප ගණන් දිය යුතුය. අප වෙනුවෙන් පෙනී සිටින්නට කතා කරන්නට එදිනට කිසිවකු නොමැත. අපගේ මෙලෝ ජීවිතය පාපි අයහපත් එකක් නම් විනිශ්චයද දරුණු වනු ඇත. එක මනුෂ්‍යයකු එනම් ආදම් නිසා පාපයත් පාපය නිසා මරණයත් ලොවට පැමිණියේය. මනුෂ්‍යයන් පව් කරනා බැවින් මරණය මුළු මිනිස් සංහතියටම පොදුය. ආදම් තුළ සියල්ලන් මරණයට පත්වන නමුත් ක්‍රිස්තුස් වහන්සේ තුළ අප උත්ථාන විය යුතුය.

**ඩොරින් පෙරේරා**
මොරටුව



# ජාඇලට සුසාන භූමියක් ඕනෑ !



**කතුතුමනි,**


සියක් වසරකටත් අධික දුරාතීතයක සිට තුඩැල්ල කණුවන සහ ජාඇල කතෝලික ජනතාව භාවිත කරනුයේ කණුවන සුසාන භූමියයි. වර්තමානයේ මෙහි ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින්, දුම්රිය පාර අද්දර දක්වා තිබූ හිස් බිම් ප්‍රමාණයද ගොඩකර, එම ඉඩම් ප්‍රමාණයද භාවිතයට ගැනේ. සම්පූර්ණ සුසාන භූමියම මළවුන් අත්පත් කරගෙන ඇති බව නොරහසකි.

මේ ප්‍රදේශයේ ජනතාව විශාල පිරිසක් වෙසෙන නිසා මරණ සංඛ්‍යාවේද අඩුවක් නොමැත. එහෙත් ඉඩම් ප්‍රමාණයේ වර්ධනයක් නොදකී. එබැවින්, ජාඇල මීසම් ජනතාවට වෙනම සුසාන භූමියක අවැසිතාවය මෝදු වෙමින් පවතී.

මේ අවශ්‍යතාවය සාක්ෂාත් කර ගැන්ම සඳහා ජාඇල හිටපු මීසම් සේවක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමන් විසින් සුසාන භූමියකට භූමි භාගයක් ලබාගැනීමට බලවත් ප්‍රයත්නයක් දැරූ බව නොරහසකි. එහෙත් පූජක මාරුවෙන් පසු එහි ක්‍රියාකාරීත්වය පසු බෑමකට ලක්විය.

මේ පිළිබඳව වර්තමාන මීසම් සේවක ගරු ග්‍රෙගරි ජයන්ත ප්‍රනාන්දු පියනමගේ සහ දහම් සේවා කමිටු සාමාජික සාමාජිකාවන්ගේ අවධානයට යොමුකොට සුදුසු පියවර ගන්නා ලෙසට අපි ආයාචනා කර සිටිමු.

**එල්. එස්. නෙල්සන් ප්‍රනාන්දු**
ජාඇල



ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව නිකුත් කළ විශේ

# ජීවිත ප්‍රතික්ෂේප කරන සෑම ගබ්සාවක්ම සැලැස්මට එරෙහිව කැරෙන බාධා කිරීමක්! එ

මිනිස් ජීවිතයේ ආරම්භයේදීම එයට ගෞරව කිරීම පිළිබඳව සහ ප්‍රජනනයෙහි ගරුත්වය පිළිබඳව 1987 පෙබරවාරි 22 දින නිකුත් කරන ලද Donum Vitae නැමැති ශුද්ධාසනීය අනුශාසනා පත්‍රයේ මෙසේ සඳහන් වෙයි : " මිනිස් ජීවිතය ශුද්ධවත්ය ඒ, එහි ආරම්භයේ සිටම එය 'දෙවියන් වහන්සේගේ මැවීමේ ක්‍රියාවට' සම්බන්ධ නිසා සහ එය එකම අවසානය වන මැවුම්කරුවාණන් සමඟ එය සදාකාලයටම විශේෂ සබඳතාවයක් තුළ රැඳී තිබෙන නිසාය. ජීවිතයේ ආරම්භයේ සිට එහි අවසානය දක්වාම ජීවිතයේ ස්වාමියාණන් වන්නේ දෙවියන් වහන්සේ පමණකි: කිසිදු තත්ත්වයක් යටතේ අහිංසක මනුෂ්‍යයකුව සෘජුව විනාශ කිරීමට තමන්ට අයිතියක් ඇතැයි කීමට කිසිවකුට නොහැකිය." (හැඳින්වීම අංක 5)

දෙවන වතිකාන කතිකාව ද Gaudium et Spe නමැති, නූතන ලෝකයෙහි සාන්ත සභාව පිළිබඳ එඬේරික ව්‍යවස්ථාවෙහි, විවාහය, පවුල සහ ජීවිතයේ සේවයට ඒවායේ ඇති නිසග සබඳතාවය පිළිබඳව සඳහන් කරමින් මෙසේ පවසයි: "විවාහය සහ විවාහික ප්‍රේමය, ඒවායේ ස්වභාවයෙන්ම, දරුවන් ජනිත කිරීමට සහ ඔවුන් වැඩිහිටි ජීවිතය වෙත සූදානම් කිරීමටද කැපවී තිබේ. දූ දරුවෝ ඇත්ත වශයෙන්ම විවාහයේ උත්තරීතර තිළිණයක් වන්නෝය. එසේම ඔවුහු මාපියන්ගේ සුබ සාධනය වෙනුවෙන් ඉතා හරවත් ලෙස දායක වෙති." [GS 50] ස්වකීය දූ දරුවන් වෙත ජීවිතයේ තිළිණය දානය කිරීම මගින් මිනිස් සංහතිය අලුත් කරමින් දෙවියන් වහන්සේගේ ප්‍රේමයෙහි අනෝන්‍ය උපකාරකයන් බවට පත්වන දෙමාපියන්ගේ යෝග්‍ය දූත සේවාව වන්නේ මිනිස් ජීවිතය විකාශනය කිරීම බව මෙම ලේඛණය තවදුරටත් සඳහන් කරයි. එහෙයින්, ඉපදුන සහ උපදින්නට සිටින තම දූ දරුවන්ගේ ජීවිතද, මානව ගරුත්වයට ඔබින ආකාරයෙන් ආරක්ෂා කිරීම දෙමාපියන්ගේ යුතුකම වෙයි. මෙම ලේඛණය තවදුරටත් මෙසේ ද සඳහන් කරයි: "ජීවිතය, එය පිළිසිඳ ගන්නා මොහොතේ සිට මහත් සැලකිල්ලෙන් යුතුව ආරක්ෂා කළ යුතු අතර, ගබ්සාව සහ බිළිඳු ඝාතනය කිව නොහැකි තරමේ අපරාධ වන්නෝය" (එම 51).

## ගරුත්වයෙන් අපරිමිත , ජීවිතය

කුමන පාඩුවක් සිදු වුවත් ජීවිතය ආරක්ෂා කිරීමේ යුතුකම සම්බන්ධයෙන් වන මෙම සාන්ත සභා ඉගැන්වීමට සහ විනයට හේතුන් පැන නගින්නේ, මවගේ කුසයේ සිට සොහොන් ගෙය දක්වා සෑම මනුෂ්‍යයකුගේම ගණනය කළ නොහැකි තරමට වටිනා ගරුත්වය කිසිදු සංස්කෘතික, සමාජයීය, කායික හෝ මානසික බේදයකින් තොරව සෑම විටකම ස්ථිර කළ සාන්ත සභා ඉගැන්වීමෙනි. භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා Evangelium Vitae නමැති ස්වකීය විශ්ව ලේඛණයේ මෙසේ සඳහන් කළ සේක: "ජීවිතයේ ගරුත්වය සම්බන්ධවී ඇත්තේ එහි ආරම්භයට සහ එය නික්මෙන්නේ දෙවියන් වහන්සේගෙන්ය යන සත්‍යතාවයට පමණක් නොවේ. එය, එහි අවසාන අනන්තයට සහ දෙවියන් වහන්සේ පිළිබඳ දැනුම සහ උන්වහන්සේට ඇති ප්‍රේමය තුළින් උන්වහන්සේ සමඟ පොදු සහභාගිත්වය වන එහි ඉරණමට ද සම්බන්ධය" [EV 38] එම නිසා සියලු මැවිල්ලේ මස්තකය ලෙස මිනිසාව නිර්මාණය කළ (උත්පත්ති 1); තමන් වහන්සේගේම ස්වරූපයට සහ සමානකමට (උත්පත්ති 1) ස්ත්‍රිය සහ පුරුෂයා ලෙස ඔහුව තැනූ සහ උන්වහන්සේගේම හුස්ම ඔහුට ලබා දුන් දෙවියන් වහන්සේ, මිනිස් ජීවිතයේ කර්තෘවරයාණන් පමණක් නොව මිනිස් සංහතිය සඳහා වන තමන්වහන්සේගේ ප්‍රේමයෙහි උත්තරීතර ප්‍රකාශනය වූ තම එකම සහ ඒක ජාතක පුත්‍රයාණන්ගේ ජීවිත පූජාව මගින් ගැළවීම බලගැන්වූවා වූ ගැළවුම්කරුවාණන් ද වන සේක. දෙවියන් වහන්සේ මිනිස් සංහතියට ලබා දුන් සුවිශේෂ සැලකිල්ල එවැනිය. ඒ හැර උන්වහන්සේ මුළු මහත් මැවිල්ලේ භාරකාරත්වය මිනිසාට බාරදුන් සේක. "නුඹලා දරු සම්පත් ලබා, වැඩි වර්ධනය වී, පොළොව පුරා පැතිර එය යටත් කර ගන්න. මුහුදේ මසුන් කෙරෙහි ද, අහසේ පක්ෂීන් කෙරෙහි ද, පොළොවේ සැරිසරන සියලු සතුන් කෙරෙහි ද බලය පවත්වන්න" (උත්පත්ති 1:28). ඒ හා සමානවම පාපයෙන් සහ මරණයෙන් මිනිස් සංහතිය ගලවා ගැනීම සඳහා සහ දෙවියන් වහන්සේගේම සදාතනිකත්වය, ජීවිතයේ පූර්ණත්වය, ප්‍රීතියෙන් භුක්ති විඳීමට සැලැස්වීම සඳහා ද උන්වහන්සේ ස්වකීය පුත්‍රයාණන්ගේ වටිනා ජීවිතය පුද දුන් සේක. ඇත්ත වශයෙන්ම, ජේසුන් වහන්සේ ජීවිතයේ සදාකාලික පූර්ණත්වය කරායන මාර්ගය ලෙස තම ජීවිතය ඉදිරිපත් කළ සේක: "මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි" (ජොහාන් 14:6). ලාසරස්ව මරණයෙන් නැගිටවූ අවස්ථාවේ ජේසුන් වහන්සේ මාර්තාට මෙසේ කී සේක: " පුනර්ජීවනය ද, ජීවනය ද මම වෙමි; මා අදහන්නා මැරුණත් ජීවත් වන්නේය; ජීවත්ව සිටින මා අදහාග න්න කිසිවෙක් කිසි කලෙක නොමැරෙන්නේය". ඇත්ත වශයෙන්ම, තමන් මේ ලෝකයට වැඩම කළේ අපට " ජීවනය ලැබෙන පිණිසත්, සපුරාම එය ලැබෙන පිණිසත්" (ජොහාන් 10:10) බව උන්වහන්සේ ස්ථිර කළ සේක. භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන් ප්‍රකාශ කළා සේ, මනුෂ්‍ය ජීවිතය, ජේසුන් වහන්සේ තුළ ,වෙනත් කිසිවකට සමාන කළ නොහැකි පූර්ණත්වයක් ලබා ගත් බව මේ සියලු දෙයින් පැහැදිලිය. ශුද්ධෝත්තම පියතුමෝ මෙසේ කීහ: "ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවනයේ සුවිශේෂය නිශ්චිතවම ප්‍රකාශයට පත් වූ අතර සම්පූර්ණයෙන්ම එය දානය කොට තිබේ"[EV 29]. ඒ හැර, ශුද්ධ ලියැවිල්ල සහ ජේසුන් වහන්සේ, ජීවිතය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය. සමිඳාණන් වහන්සේගේ ඇස් ඉදිරියෙහි මනුෂ්‍ය ජීවිතය කෙතරම් සුවිශේෂී දැයි මේ සියලු දේ පෙන්වා දෙයි.

මෙම හේතුව නිසා 1987 පෙබරවාරි මස නිකුත් වූ Donum Vitae නමැති ශුද්ධාශනීය අනුශාසනා පත්‍රය උපුටා දක්වමින් කතෝලික සභාවේ ධර්මෝපදේශය ස්ථිර කරන්නේ "මනුෂ්‍යයකුගේ පැවැත්මේ පළමු මොහොතේ සිටම ඔහු පුද්ගලයකුගේ අයිතිවාසිකම් ඇති අයකු ලෙස හඳුනාගත යුතුය. ඒ අයිතිවාසිකම් අතර, ජීවත්වීමට සෑම මනුෂ්‍යයකුටම කඩකළ නො හැකි අයිතිවාසිකමක් ද වෙයි"[DV1,1]. "මා නුඹ කුසයෙහි පිළිසිඳගැනීම ඇති කරන්නටත් පෙර පටන් හඳුනාගතිමි. නුඹේ උපතට පෙර, මම නුඹ කැප කළෙමි" යි (ජෙරමියා 1:5) දිවැසිවරයා පිළිබඳව සඳහන් කිරීමේ දී මානව ජීවිතයේ අපිරිමිත වටිනාකමට හේතුව ජෙරමියාගේ පොත අපට ඉදිරිපත් කරයි. ජීවිතය අනගි වන්නේ හුදෙක් දෙවියන් වහන්සේ මිනිසාව මවා ඇති නිසා පමණක් නොව, උන්වහන්සේ, ස්වකීය පුත්‍රයාණන් මගින් ඔහුව ගලවාගෙන සෑම සියලු දෙනා සඳහාම අසමසම වූ සැලැස්මක් නිර්මාණය කර තිබෙන නිසාත් ය. ආබ්‍රහම්, මෝසෙස් සහ දිවැසිවරුන් හෝ භාග්‍යවත් මාතාවන් වූ මරියාවන් හෝ ශු. ජුසේතුමන්, ශු. පේදුරු හා පාවුලු මුනිවරුන් සහ උන්වහන්සේගේ සේවය සඳහා කැඳවනු ලැබූ සියල්ලන් අරබයාත් එය එසේම වෙයි.

## ගබ්සාව මිනිමැරීමකි.

එනිසා, ජීවිතය ප්‍රතික්ෂේප කරන සෑම ගබ්සාවක්ම, කිසියම් මනුෂ්‍යයකු සඳහා වන දෙවියන් වහන්සේගේ සැලැස්මට එරෙහිව කෙරෙන සාපරාධී බාධාකිරීමක් සහ එය උල්ලංඝනය කිරීමක් වන අතර, එය නිසර්ග යෙන්ම නපුරක් වන්නේය. මුල් කාලයේ සිටම සාන්ත සභාව සෑම විටකම සෘජු ගබ්සාව, එනම් අවසානයක් ලෙස හෝ උපක්‍රමයක් ලෙස හෝ ගබ්සාව තෝරා ගැනීම, නුසුදුසු යැයි ප්‍රකාශ කළේය. දෙවන ශතවර්ෂයට අයත් ඩිඩාකේ (Didache) නම් අනුශාසනා ග්‍රන්ථයෙහි මෙම ඉගැන්වීම සඳහන් වන්නේ මෙසේය; "ඔබ ගබ්සාව මගින් කලලය මරා නොදැමිය යුතුය. එසේම, අලුත උපන් දරුවා විනාශ වීමට සැලැස්විය නොයුතුය"[Didache 2:2: SCKL 248, 148, cf.Ep]. ඒ අනුව කෙසේ සාධාරණීකරණය කළත්, ගබ්සාව, ඒ තුළම බරපතළාකාරයෙන් පවුකාර සහ නපුරු ක්‍රියාවක් ලෙස සැලකිය යුතු අතර, එය කිසිදු රාජ්‍ය හෝ වෙනත් ආයතනයක් විසින් හෝ පුද්ගලයකු විසින් හෝ රැකිය නො හැකිය. භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන් හිතාමතා සිදුකරන ගබ්සාව හැඳින්වූයේ "කුමන උපක්‍රමයක් මගින් එය සිදු කරනු ලැබුවත් මිනිසකු ඔහුගේ හෝ ඇයගේ පැවැත්මේ මුල් අදියරයේ දී හිතාමතා සහ සෘජුව ඝාතනය කිරීමක්" ලෙසය [EV. 58]. උන්වහන්සේ එය "මිනිමැරීමක්" ලෙස හැඳින්වූ අතර, එම අපරාධය සිදුකරන ඕනෑම කතෝලිකයකු "සාන්ත සභාවෙන් ස්වයංක්‍රීයව නෙරපා හැරීම [Latae Sententiae] අත්විඳින" බව (සාන්ත සභා නීති 1398) ප්‍රකාශ කළහ. මෙහි අර්ථය වන්නේ, තමන්ගේම නිදහස් තෝරාගැනීම මත දරුවකු ගබ්සා කරන පුද්ගලයා බරපතළ පාපයක් සිදු කර ගන්නා බවත් සාන්ත සභාවෙන් ස්වයංක්‍රීය නෙරපා හැරීමකට, එනම් ඒ මගින් සාන්ත සභාවෙන් ඉවත්ව යාමකට, ලක්වන බවත්ය. එසේම එවැනි ක්‍රියාවකට සැබවින්ම සහය දෙන හෝ දිරිමත් කරන හෝ ඕනෑම පුද්ගලයෙකුට ද මෙම නෙරපා හැරීම අදාල වෙයි. එහෙයින්, ස්වර්ගයට මොරග සන (උත්පත්ති 4:10) මෙම පිළිකුල් සහගත අපරාධයට සහය වීමට, උපදෙස් දීමට, තීරණය කිරීමට හෝ ක්‍රියාකාරීව සහභාගි වීමට හෝ කිසිදු කතෝලිකයකුට අවසර නැත. මේ අරබයා ඔවුනට වෙනත් කිසිදු තෝරාගැනීමක් නැත.

## සාන්ත සභා විනය

අපගේ එඬේරික යුතුකම සම්පූර්ණ කරමින්, මෙම අපරාධයේ, එනම් ගබ්සාවේ, බරපතලකම පිළිබඳව අපගේ කතෝලික සැදැවතුන් දැනුම්වත් කිරීමට ද, එය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීමට දරන ඕනෑම උත්සහයක් පිළිගත නොහැකි දෙයක් ලෙස ප්‍රතික්ෂේප කිරීමට ඔවුන් පෙළ ගැස්වීමට ද අපි කැමැත්තෙමු. මෙය අවශ්‍යතාවයක් බවට පත්ව ඇත්තේ, විශේෂයෙන්ම ව්‍යභිචාරය හෝ දූෂණයට ලක්වීම පිළිබඳව හෝ තාක්ෂණය තුළින් බිහිවන්නට කලින් දැකිය හැකි විකල කලලයක් පිළිබඳව හෝ කාන්තාවන්ට එවැනි තෝරා ගැනීමේ නිදහසක් ලබා දෙමින්, ගබ්සාව පිළිබඳව දැනට රටේ පවතින නීති ලිහිල් කරන බවට ඇතැම් වගකිවයුතු රාජ්‍ය තාන්ත්‍රිකයන් විසින් සිදු කළේයැයි



කියන ඇතැම් ප්‍රකාශ නිසාය.

මෙම විශේෂ අවස්ථාව කුමක් වුවද, දූෂණයට ලක්වීම, ව්‍යභිචාරයක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන කලලයක් හෝ අඩුපාඩු සහිත කලලයක් හෝ ගබ්සා කිරීම සාන්ත සභාවට අනුව නිහඬ සහ අනාරක්ෂිත අහිංසක මනුෂ්‍යයකු අසැබි ලෙස ඝාතනය කිරීමකි. එය ශීලධාර්මිකව වරදකි. කතෝලික සැදැහැවතුන් පසෙක තිබියේවා, හොඳ සිහි බුද්ධියෙන් යුතු කිසිදු මනුෂ්‍යයකුට ජීවිතය එවැනි ආකාරයෙන් මුලිනුපුටා දැමීම සාධාරණීකරණය කිරීමේ ස්ථාවරයක් දැරිය නොහැකිය. එවැනි අවස්ථාවක දී වුවද ගබ්සාව ක්‍රියාත්මක කිරීම බරපතළ පාපයක් වන අතර කතෝලිකයන් සාන්ත සභාවෙන් නෙරපා හැරීම ද සිදුවේ. මෙම අදහසින් ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුවේ සාමාජිකයින් ලෙස අප, ඉහත සඳහන් කර තිබෙන විශේෂිත තත්ත්වයන් යටතේ, අනුකම්පාවේ හැඟීමක් ඇතිකළ හැකි අවස්ථාවන් සඳහා වුව ද ගබ්සාව නීතිගත කිරීමේ ක්‍රියාවලිය හැකි උපරිමයෙන් ප්‍රතික්ෂේප කරමු. මෙම යෝජනාවේ බරපතලකම අවබෝධකර ගන්නා ලෙසත්, අදාල පුද්ගලයින්ට මේ පිළිබඳව තම විරෝධය ප්‍රකාශකරන ලෙසත්, අහිංසකයන් මෙසේ ඝාතනය කිරීම අපගේ ආදරණීය මාතෘ භූමිය තුළ වසංගතයක් බවට පත් නොවන පිණි යාච්ඤා කරන ලෙස සහ මර්ධන ක්‍රියා සහ පශ්චත්තාපයේ ක්‍රියා ඔප්පු කරන ලෙසත් අපි සි කතෝලික සැදැහැවතුන්ගෙන් , විශේෂයෙන්ම යොවුන් වියේ පසුවන සියල්ලන්ගෙන්, තරුණ තරුණියන්ගෙන් සහ පවුල්වලින් ඉල්ලා සිටිමු.

## ස්ථාවරයක් ගැනීම.

එබැවින් , අපගේ සියලු පූජාප්‍රසාදි තුමන්ගෙන් ද පැවිදි නිකායන්ගෙන් සහ සංවිධාන වලින් ද, ගිහි ජනතාවගෙන් ද, උදක්ම මෙසේ ආයාචනා කරමු

අ) **නූපන් දරුවාගේ දිනය** ලෙස අප විසින් ප්‍රකාශ පත් කරනු ලබන 2012 නොවැම්බර් 11 වන ඉරුදින අපගේ සියලු රදගුරු පදවිවල යාච්ඤාවේ සහ නිරාහාරශීල රැකීමේ විශේෂිත දිනයක් ලෙස පවත්වන්න.

ආ) අදාළ අමාත්‍යංශය විසින් යෝජිත පණත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළහොත්, එදිනම ඉරුදින දිව්‍ය පූජාවෙන් පසුව දේවස්ථාන භූමියේ හෝ ඒ අසල හෝ ඊට විරුද්ධව සාමකාමී විරෝධය පළ කරන්න.

ඇ) විරෝධය පළකිරීමේ සංකේතයක් ලෙස එම සතිය තුළ තම කමිස හෝ ඇඳුම් මත කළු පටියක පළඳින්න.

ඈ) මෙම යෝජනාවට සහයෝගය දක්වන්නන්ගේ හෝ එය දිරිමත් කරන්නන්ගේ හෝ සිත් හැරීම උදෙසා එම ඉරුදින දී ශුද්ධවූ පැය සහ විශේෂ යාච්ඤා මෙහෙයයන් සංවිධානය කරන්න.

ඉ) අනවශ්‍ය පිළිසිඳගැනීමක් නිසා හෝ දුප්පත් ක නිසා හෝ එවැනි ක්‍රියාවන් සිදු කිරීමට සිතා සිටින මව්වරුන්ට හා පවුල්වලට එයින් වැලකීම පිණිස උදව් කිරීම සඳහා මීසම් මට්ටමින් මුදල් රැස් කර

ඊ) මෙම යෝජනාවේ කොටස් කරුවන් නොවන ලෙස හෝ පාර්ලිමේන්තුවට එවැනි පණත් කෙටුම්පතක් ඉදිරිපත් වූවොත් එයට එරෙහිව චන්දය පාවිච්චි කරන ලෙස හෝ දිරිමත් කරමින් පාර්ලිමේන්තු නියෝජිතයින්ට සහ ඔවුන් දන්නා රාජ්‍ය ප්‍රතිපත්ති සකසන්නන්ට බල කරමින් ලිපි ලියන්න.

එ) සෑම විටම ජීවිතය, විශේෂයෙන්ම නූපන් දරුවාගේ ජීවිතය, ආරක්ෂා කිරීමෙහි ලා ක්‍රියාකාරීව සහභාගි වන්න.

ඒ) මෙවැනි ආකාරයේ ක්‍රියාවන්හි නෛසර්ගික පාපිෂ්ඨ බව පිළිබඳව කතෝලිකයන් දැනුවත් කරන්න. ඔවුන්ට උගන්වන්න. එසේම, ඔවුන්ගේ හෘදය සාක්ෂිය ඊට එරෙහිව හැඩගස්වන

...ෂ නිවේදනය

# ...දෙවියන් වහන්සේගේ ...ය නිසර්ගයෙන්ම නපුරක්

පවුල් අපෝස්තලික සේවාව බාරව සිටින්නන්ගෙන් අපි මෙසේ ඉල්ලා සිටිමු.

අ) ගබ්සාවේ සහ දෙවියන් වහන්සේගේ ජීවිතයේ තිළිණය ඕනෑකමින් වලක්වාලන සියලු ආකාරයේ ක්‍රියාවන්ගේ ශීලධාර්මික සහ අධ්‍යාත්මික අගුණ බලපෑම් පිළිබඳව සහ කුමන පාඩුවක් සිදු වුවත් ඒවායින් ඉවත්ව සිටිය යුත්තේ කුමක් නිසාද යන්න පිළිබඳවත් වැඩි වැඩියෙන් තොරතුරු ඇතුලත් විවාහයට පෙර සහ විවාහයට පසු පවත්වන වැඩසටහන් තීව්‍ර කරන්න.

ආ) සාන්ත සභා ඉගැන්වීම විස්තර කරන පරිදි ගබ්සාවේ අගුණ බලපෑම් සහ එහි නෛසර්ගිකව පාපිෂ්ට සහ නපුරු ස්වභාවය පිළිබඳව මීසම්වල ක්‍රියාකාරී යුවල මාර්ගයෙන් තරුණ තරුණියන් සහ වැඩිහිටියන් සඳහා අධ්‍යාත්මික සහ පුහුණු වැඩසටහන් සංවිධානය කරන්න.

ඇ) මෙම කාරණය පිළිබඳව සහ ජීවිතයේ වටිනාකම සහ ගරුත්වය පිලිබඳව ද, විශේෂයෙන්ම බොහෝවිට නොදන්නා නමුත් බොහෝ ජීවිත තුළ ප්‍රබලව පෙනෙන්නට ඇති සෑම මනුෂ්‍යයකු සඳහාම වන මැවුම් කරුවාණන්ගේ සැලසුම පිළිබඳව මීසම් සේවක පියතුමන්ගේ සහාය ඇති ව මීසම් වාසීන් අතර වැඩි හැඟීමක් උත්තේජනය කරන්න.

ඈ) අධ්‍යාපනය පිලිබඳව පදවි අධ්‍යක්ෂක පියවරුන්ගේ, සුබෝධි වැනි ආයතනයන්ගේ සහ අදාල විදුහල්පති වරුන්ගේ සහාය ඇතිව, පාසල් හැරගිය අය සඳහා විවාහ ජීවිතයේ ශුද්ධවන්ත බව සහ ලෝකය තුළ ප්‍රේමය සහ ජීවිතය ජනිත කිරීමට එහි ඇති සම්බන්ධතාවය සහ ජීවිතය විකාශනය කිරීම සඳහා සහ සැබෑ එක්සත්කමක් සඳහා දෙවියන් වහන්සේ ලබා දී ඇති උපක්‍රමයක් ලෙස ලිංගිකත්වයේ වටිනාකම අවධාරණය කෙරෙන ජීවිත අධ්‍යාපනික වැඩසටහන් මෙහෙය වන්න. මීසම්වල සහ පාසල්වල නව යොවුන් තරුණ තරුණියන් සහ තරුණ වියේ පසුවන්නන්ගෙන් අපි මෙසේ ඉල්ලා සිටිමු.

අ) ඔබේ ජීවිතය සහ අන්‍යයන්ගේ ජීවිත මෙන්ම නූපන් දරුවන්ගේ ජීවිත වුව ද අගය කරන්න. එවිට සෑම පුද්ගලයකු සඳහාම වන දෙවියන් වහන්සේගේ සදාතනික සැලසුම පූර්ණ ලෙස සාක්ෂාත් කරගැනීමට සහාය වීමට ඔබට හැකියාව ලැබෙනු ඇත.

ආ) දෙවියන් වහන්සේ ඔබට දී ඇති ගරුත්වයට සහ නිදහසට අනුකූල නොවන සෑම දෙයින් ඉවත්ව සිටීමට හැකිවනු පිණිස, ක්‍රිස්තුන් වහන්සේගේ සහ සාන්ත සභාවේ ඉගැන්වීම් මත ශක්තිමත්ව පදනම් වූ දැහැමි සහ පිරිසිදු ජීවිතයක් සොයා යන ව්‍යායාමයෙහි ඉදිරියෙන් සිටින්න.

ඇ) ආත්මාර්ථය මුලිනුපුටා දැමෙන, සාදරයෙන් පිළිගන්නා, සාධාරණ සහ සාමකාමී සමාජයක් ගොඩනැගෙන, වඩා යහපත් ලෝකයක් නිර්මාණය කිරීමෙහි ලා ප්‍රේමයේ සහ කුරුස මගේ පූර්ණ ස්වත්‍යාජය පිළිබඳව ක්‍රිස්තුන් වහන්සේ අපට උගන්වා වදාළ දහමෙහි අලංකාරය අනෙක් අය සමග බෙදා හදා ගන්න.



ගබ්සාව සිදු කිරීමේ ද එය සිදු කිරීමට තරුණියන්ට හෝ යුවලවලට හෝ උපදෙස් දීමේ ද නිරත නොවන ලෙස වෛද්‍ය වෘත්තියේ නියැලෙන කතෝලිකයන්ට විශේෂ ආයාචනයක් කිරීමට අපි කැමැත්තෙමු. හිපොක්‍රැටික දිවුරුමේද සඳහන් වන පරිදි වෛද්‍ය වෘත්තියේ උදාර අරමුණ වන්නේ ජීවිතය ආරක්ෂා කිරීම වන අතර, කතෝලිකයකුට සෑම විටකම තම ණය යුක්තිය වන්නේ දෙවියන් වහන්සේ මවා ඇති දේ ආරක්ෂා කිරීමයි. අපගේ සමාජයට පූජනීය වන වටිනාකම් පිළිබඳව, විශේෂයෙන් ම, ලිංගිකත්වයේ ගරුත්වය, ඇඳුම් පැළඳුම් සහ භාෂාවේ විනීත බව අරබයා වන වටිනාකම් පිලිබඳව, අවධානයෙන් කටයුතු කරන ලෙස ද, තම වැඩසටහන් සහ ප්‍රචාරණ ද්‍රව්‍ය සූදානම් කිරීමේ දී කල්පනාකාරීව කටයුතු කරන ලෙසද අපි මාධ්‍ය ආයතනවලින් ඉල්ලා සිටිමු. දූෂිත වූ යොවුන් පරපුරකට දිගු කාලීනව ශීලාධාර්මිකව දැහැමි සහ ආදර්ශවත් සමාජයක් ගොඩනැගීමට නොහැකිබව අමුතුවෙන් කිවයුතු නොවේ.

අවසාන වශයෙන් තම දේශනා මාර්ගයෙන් ගබ්සාවේ පාපිෂ්ඨ බව පිළිබඳව තම ජනතාව දැනුම්වත් කරන ලෙස ද, වෙනත් වැඩසටහන් සංවිධානය කරමින් තම සැදැහැවතුන් අතර ජීවිතයට මිත්‍රශීලී ආකල්පයක් නිර්මාණය කිරීමට සහාය වන ලෙස ද අපගේ සියලු පූජාප්‍රසාදිතුමන්ගෙන් සහ පැවිදිවරුන්ගෙන් ඉල්ලා සිටිමු. විසඳුමක් ලෙස ගබ්සාව භාවිතා කිරීමේ පරික්ෂාවට යුවල් පොළඹවන දුෂ්කරතා ජය ගන්නේ කෙසේ ද යන්න පිළිබඳව ඔවුන්ට උපදෙස් දෙන උපදේශන ඒකක දිසා හෝ මීසම් මට්ටමින් ස්ථාපිත කිරීම ද යහපත්ය. පෞද්ගලික අධ්‍යාත්මික පිරිසිදුකම සහ ජීවිතයේ හා විවාහයේ ශුද්ධවන්තකම පිළිබඳව තම ජ්‍යෙෂ්ඨ සිසු සිසුවියන් දැනුම්වත් කරන ලෙස ද දේව රාජ්‍යය වෙත පූර්ණ කැපවීමක් පිලිබඳව තමන් වහන්සේගේ ජීවිතයෙන් ආදර්ශය සැපයූ අපගේ ස්වාමියාණන් ද ගුරු දේවයාණන් ද වන ජේසුන් වහන්සේගේ පූර්වාදර්ශය අනුගමනය කිරීමට ඔවුන් දිරිගන්වන ලෙස ද අපි අපගේ විදුහල්පති වරුන්ගෙන් ඉල්ලා සිටිමු.

ආදරණීය සහෝදර සහෝදරියනි, භාග්‍යවත් දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන් කළා සේ, " දෙවියන් වහන්සේ විසින් සෑම කාන්තාවක වෙතම දානය කළා වූ මාතෘත්වයේ කැඳවීම, උසස්ම මට්ටම වෙත ඔසවා තැබූ" [EV 103] සහ මිනිස් සංහතියේ සහ සියලු මැවිල්ලේ ගැලවීම සඳහා වූ දෙවියන් වහන්සේගේ මහා සැලැස්ම, ජේසුන් වහන්සේ තුළ යථාවක් බවට පත්වීමට, මංගලම් කී අවස්ථාවේ දී ලබා දුන් කැමැත්ත මගින් ඉඩකඩ සැලසූ අපගේ ස්වර්ගයීය මාතාවන් වන මරියාවන් වෙත අපගේ සිතිවිලි ඔසවමු.

පාපයෙන් ද, දූෂිත බවින් සහ මරණයෙන් ද පාපිෂ්ඨ මිනිස් සංහතිය මුදා ගැනීමට මඟ පෑදූයේ මාතෘත්වයට ඉඩකඩ සලසමින් එතුමිය පැවසූ "එසේම වේවා" යන්නයි. එය සැමවිටකම අපගේ ආදර්ශය වේවා !

අපගේ සදාදරණීය මාතාවන් වූ ශ්‍රී ලංකා අප ස්වාමිදුව අප වෙනුවෙන් යාච්ඤා කරත්වා !

✠ අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ
කොළඹ පදවි අගරදගුරු හිමි
ශ්‍රී ලංකා රදගුරු සමුළුවේ සභාපති සහ

✠ අති උතුම් නෝබට් අන්ද්‍රාදි හිමිපාණෝ
ශ්‍රී ලංකා රදගුරු සමුළුවේ මහ ලේකම් සහ
අනුරාධපුර පදවියේ රදගුරු හිමි

✠ අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු හිමිපාණෝ
බදුල්ල පදවියේ රදගුරු හිමි

✠ අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ
හලාවත පදවියේ රදගුරු හිමි

✠ අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ
කුරුණෑගල පදවියේ රදගුරු හිමි

✠ අති උතුම් තෝමස් සෞන්දනායගම් හිමිපාණෝ
යාපනය පදවියේ රදගුරු හිමි

✠ අති උතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණෝ
මහනුවර පදවියේ රදගුරු හිමි

✠ අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණෝ
ගාල්ල පදවියේ රදගුරු හිමි

✠ අති උතුම් කිංස්ලි ස්වාමිපිල්ලේ හිමිපාණෝ
ත්‍රිකුනාමලය පදවියේ රදගුරු හිමි

✠ අති උතුම් පොන්නයියා ජෝසප් හිමිපාණෝ
මඩකලපුව පදවියේ රදගුරු හිමි

✠ අති උතුම් රායප්පු ජෝශප් හිමිපාණෝ
මන්නාරම පදවියේ රදගුරු හිමි

✠ අති උතුම් ක්ලීටස් හිමිපාණෝ
රත්නපුර පදවියේ රදගුරු හිමි

✠ අති උතුම් මේරියස් පීරිස් හිමිපාණෝ
කොළඹ පදවියේ සහයක රදගුරු හිමි

✠ අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණෝ
කොළඹ පදවියේ සහයක රදගුරු හිමි

✠ අති උතුම් මැක්ස්වල් ග්‍රෙන්විල් සිල්වා හිමිපාණෝ කොළඹ පදවියේ සහයක රදගුරු හිමි

***2012 ඔක්තෝබර් 30 වෙනිදා***


# ලක් සබය යුරෝපීය බලපෑමට ලක්වීම

පෘතුගීසින් අප රටට පැමිණීම හේතුවෙන් කිතු දහම ප්‍රචාරය වූ බව රහසක් නො වේ. එහෙත් ඔවුන් ගෙන් දහමට යහපත මෙන් ම අයහපත ද එක සේ සිදු වූ බව නොරහසකි. ආරම්භයේ සිට විටින් විට කිතු දහම දිවයිනට හඳුන්වා දීම සිදු වී ඇත්තේ ඉන්දියාව ඔස්සේ මෙහි පැමිණි පෙරදිග පිරිස් විසිනි. එහෙත් සොළොස් වැනි සත වසරේ ධර්මදූතවරුන් මෙහි පැමිණියේ බටහිරින් ය. පෘතුගීසින් මෙන් ම අයර්ලන්තය, බෙල්ජියම, ඉතාලිය, ප්‍රංසය වැනි රටවල් කිතු දහම තමන්ගේ ම සංස්කෘතික හා දේශපාලන රටාවනට අනුකූලව සකස් කැරගෙන තිබිණි.

දහම නිර්මලව පැවැතියත් එය ඉදිරිපත් කිරීම මෙන් ම දූත මෙහෙවර ද සකස් වී තිබුණේ බටහිර රටාව අනුව යි. තව ද මේ කාලය "රෙපරමාදු විප්ලව" විපාක මැඩලීම සඳහා ප්‍රති විප්ලවය ආරම්භ කරන ලද අවධිය ද වූ හෙයින් එහි ලක්ෂණ ද මෙයට ඇතුළු විය. මේ අනුව කිතු දහම සේවක මුහුණුවරක් වෙනුවට වඩාත් පාලක
මුහුණුවරක් ගත්තේ ය. ගිහි - පැවදි ඒකාබද්ධ ස්වරූපයකට වඩා පැවදි පාලනය රජ කරන ස්වරූපයක් දිස්විණි. පෘතුගීසි ආභාසය ලද පැවදි නිකායන් ද ක්‍රියා කැර ඇත්තේ මේ ආකාරයට යි.

කිසිදු දේශීය පූජකවරයකු (රජ පවුලක් හැර) පෘතුගීසින් මේ රටේ බිහි නොකළේ මේ නිසාම ය. එම අදූරදර්ශී ක්‍රියා පිළිවෙතේ ආදීනවය අප හට විඳින්න සිදුවූයේ ඕලන්ද පීඩනයේ දී ය. තිස් වසරක පමණ කාලයක් කිසිදු පූජක - පැවදි සහයක් නැතිව දහමේ පවතින්නට අප ජනතාවට එයින් සිදුවිය.

ක්‍රි.ව. 1686 දිවයිනට සැපත් වූ ජුසේ වාස් පියතුමා එ කල පැවැති වාතාවරණය හා පූජක - පැවදි අහේනිය මකාලීම සඳහා ගිහි ජනතාව ගේ සහයෝගය ලබා ගත්තේ ය. එය ඉතා දක්ෂ ලෙසත් අර්ථවත් ලෙසත් ගිහි ජනතාවට හඳුන්වා දුන්නේ සභාවේ අනාගත අභිවෘද්ධිය සඳහාය. එහෙත් පසු කල යළිත් වරක් බටහිර ධර්මදූත නිකායන් ගේ පැමිණීමත් සමඟ ක්‍රමයෙන් අඩපණ විය.



යටගිය දවස

විශ්‍රාමික අගරදගුරු
අති උතුම්
ඔස්වල්ඩ්
ගෝමිස්
හිමිපාණෝ

128

පෘතුගීසි සමය තුළ ගිහි පිරිස වඩාත් නිරතව සිටියේ රාජ්‍ය සේවකයන් වශයෙන් විනා ධර්මදූත කටයුතු සම්බන්ධව නො වේ. එහෙත් මේ ක්ෂේත්‍රය තුළ ඔවුන් ගෙන ගිය ක්‍රියාදාමය අප රැටියනට ඉතා පිළිකුල් විය. වියත් පෘතුගීසි ඉතිහාසඥ කුවෙරෝස් පියතුමා ම සඳහන් කැර ඇත්තේ මෙසේ ය. "සෑම පෘතුගීසි වැසියකු ම තමන් විසූ ගම තුළ අපෝස්තුළුවරයකු වූයේ නම්, ඉතා කෙටි කාලයක් තුළ එහි ජනතාව කිතු දහම වැළඳ ගන්නට ඉඩ තිබුණි." (කුවෙරෝස් 1084 පිටුව බලන්න.)

පෘතුගීසි ගිහි පිරිස ධර්මදූත කටයුතුවල යෙදුන බවට සාක්ෂි නැත. පෘතුගීසි හේවායින් නම් ඊට හාත්පසින් විරුද්ධව ධර්මදූත කටයුතු වලට බාධාවක් ම වූ අවස්ථාවන් වාර්තා වේ. මොවුන් ඇතැම් ගම්මානවලට වැදී ගෙන ගිය දූෂිත හා දුරාචාර කටයුතු නිසා කතෝලික පියවරුන් එහි පැමිණීම වළකන පිණිස ක්‍රියා කැර ඇත. මෙයින් දෙව්මැඳුරු ඉදිකිරීම් පවා අසාර්ථක වූ අවස්ථා ගැන ඉතිහාසයේ සඳහන් ය. මේවා ගැන ලිස්බන් නුවර රාජ්‍ය පාලකයිනට කතෝලික පියවරුන් පැමිණිලි කළ ලිපි බොහෝමයක් තිබේ.

ජුසේ වාස් පියතුමා දේශීය ස්වරූපයකින් යුත් ගිහි පැවදි සහයෝගය ඇතිව කෙරෙන කතෝලික ප්‍රජාවක් දිවයිනේ ඇති කළේ ය. එහෙත් පියතුමා ගේ නෙස්ටෝරියාන නිකාය ද කලක දී පෘතුගීසි රජය කළ "ෆ්‍රී මේසන්"වරුන් ගේ තහංචි වලට හසුවීම නිසා ඒ පිළිවෙත අහෝසි වන්නට හේතු විය. ගෝවේ සිට තවදුරටත් ධර්මදූතවරුන් එවීමට අපොහොසත් වීම නිසා දිවයිනේ නව සභා පාලකයිනට සිදුවූයේ යළි යුරෝප සරණ පැතීම යි.

මේ කා ලයේ දී යුරෝපය හුදෙක් කිතුනු මහාද්වීපයක්ම විය. මේ අනුව ප්‍රංශය, බෙල්ජියම, අයර්ලන්තය, ඉතාලිය, පෝලන්තය ආදි රටවලින් ධර්මදූත පිරිස් මෙහි බහුලව පැමිණියහ. ප්‍රංශය, "කතෝලික සභා මාතාවගේ වැඩිමහල් දියණිය" යන විරුදාවලිය ලබා සිටියේ ය.

එහෙත් තව දශකයකින් පමණ එය ඉස්ලමීය රටක් බවට පත්විය හැකි යැයි මෙ දිනවල රෝමයේ පැවැත්වෙන රදගුරු කතිකාවතේ දී රදගුරුතුමකු පවසා ආන්දෝලනයක් ඇති විය. මීට හේතු වී ඇත්තේ එහි නිදහස්ව සංක්‍රමණය කළ මේ පිරිස ගේ ජන සංඛ්‍යාව සීඝ්‍රයෙන් වර්ධනය වීම යි.

එ කල මෙහි වැඩම කළ යුරෝපීයයන් බොහෝ දෙනෙක් අප ගේ හැදියාව මෙන් ම දැනුම ද අවතක්සේරු කළ බව නොරහසකි. යුරෝපයේ අධ්‍යාපනය, භාෂාවන් සහ සංස්කෘතික ලක්ෂණ හැර වටිනා යමක් අන් කිසි රටක නැතැයි යනුවෙන් ඔවුන් ගේ යටිහිත් තුළ රැඳී තිබිණි. සත්‍යය දැන සිටියේ ඉතා ස්වල්ප දෙනෙකි.

කොළඹ ප්‍රථම අගරදගුරු තැන්පත් අති උතුම් ක්‍රිස්ටෝෆර් බොන්ජීන් හිමිපාණන් මෙය හොඳින් වටහාගෙන සිටි වියතෙකි. එතුමෝ මේ ගැන ඉතා නැණවත් උපදෙස් රැසක් ඉදිරිපත් කළහ. මේ අතර ප්‍රධාන වූයේ, "කරුණාකර ඔබ මෙහි එන විට කිතු දහම ගෙනෙන්න, නමුත් යුරෝපා සංස්කෘතිය එහි ම තබා එන්න." යනු අවවාදය යි. එසේ වූවත් අප පැරැණි කියමනකි එනම් "මිනිහා රටෙන් පිට කළාට රට මිනිහගෙන් පිට කළ නොහැකිය" කියා ය. ඒ අනුව ජුසේ වාස් ස්වර්ණමය යුගයෙන් ඉක්බිති යුරෝපීය බලපෑමක් හෙළ සබය කෙරෙහි ඇති වූ බව කිව යුතුයි. මෙහි ඉතා යහපත් ප්‍රතිඵල ද ඇති වූ අතර සභා ස්වරූපය බොහෝ දුරට බටහිර වෙස් වලා ගත්තේ ය. මේ නිසා කලක් ගත වන තුරුම කතෝලික සභාව විදේශීය යටත් විජිතවාදීන් ගේ දායාදයක් ම ලෙස සළකන ලදි.

දිවයිනට දේශපාලන නිදහස ලැබීමත් සමඟ ව්‍යාප්ත වූ දේශීය පූජක හා පැවදි පිරිස සභා නායකත්වයට පත්වීම හේතුවෙන් ඒ තත්ත්වය බොහෝ දුරට වෙනස් වී තිබේ.

ඇතැම් කාන්තා පැවදි නිකායන් එකක් දෙකක් පමණක් යුරෝපීය සම්ප්‍රදායනට තවමත් ආ වඩමින් "ගත මෙහේය සිත එහේය" යන ප්‍රතිපදාව අනුගමනය කළත්, පොදුවේ සලකා බලන කල දිවයිනේ පමණක් නො ව මුළු ආසියාවේ ම දේශානුනුරූප වෙමින් පවතින බව කිය යුතුයි.

යුරෝපීයයෝ ම අද තමන් ගේ දුබලකම් දනිති. එහෙත් ඒ බව තවමත් නො පිළිගනිති.

පැදි නදිය



## අමරණීය රුක්මණී

හෙළසිනමාවේ මුල්නිළි රුක්මණී දේවි
හෙළ සංගීත් රසකළ ගී මිහිරාවි
සමුගෙන අපෙන් වසරක තිස්හතරක් වේවී
එනමුදු නාමේ අමරයි රුක්මණී දේවි

ආවත් නොයෙක් නිළියන් ඔබගෙන් පසුව
නැකිය කෙනෙක් සිටියේ දිගු නෙත් සතුව
ගයමින් ගීත නැටුමෙන් රංගන පෑව
නැත පිරවුනේ තවමත් ඔබගේ අඩුව

හැටපස් වසක් නොව සිය වසරක් ගෙවුන
දින සිහි කරන විට හෙළසිනමාවේ ගුණ
ඒ පරපුරේ අයටත් මතකයේ රැඳෙන
රුක්මණී දේවි නාමය වෙයි සදාතන

**ලක්ෂමන් රණසිංහ**
හේකිත්ත

## නැගෙන්නට හෙට දිනේ

දරුවනි වසරකට ඔබ එක් දිනක් සොයා
සමරණ මළාවූවන් ගැන මතක තියා
එළියයි සුසානය මල් පැල ඉවත ගියා
කඳුළක් වැටේ ජීවිතයක අරුත ලියා

නෙක වැකි රුදේ සිහිවටනය මත හොඳට
මොහොතින් මොහොත එය දෙදරා යයි වළට
වැකියද මැකී අව්වට වැස්සට බයට
දිරන විලස සිරුරද පෙරලුනි පසට

මලක් තබා ඉටි පහනක් දල්වාලා
අදින් පසුව ඔබ නොයාද වෙන්වීලා
යළිත් වසක් එනතුරු මෙහි තනිවීලා
ඉන්න අපට හිරු සඳු නෑ පිටුපාලා

කළ හොඳ නොහොඳ විමසන තැන මරණයද
මරණය මරා ඉපදෙන මග ධර්මයද
ඒ මග කියා දුන් ජේසුනි වඩිනවද
හැර මුළු දිවිය හිමි පසු පස දුවනවද

**පිටිපන මා. ජයවීර**

## සුරතල් මිනිපිරිය

ගමනක් ගොසින් එනවිට මා නිවස බලා
සීයේ සීයෙ කියමින් එන මග බලලා
පොඩි මිනිපිරිය දිව එයි පා පොඩි තබලා
පෙන්වන්නට සතුට නටනව උඩ පැනලා

දුක් වේදනා ඇඟ පත ඇති මහන්සිය
සැමදුක් පහව යයි දැක සුරතල් ගතිය
සීයා කෙනෙකු වීමෙන් මා ලද සවිය
දුන්නේ ගතට මගෙ පොඩි සුදු මිනිපිරිය

චිල්ලමලේ කියමින් ඔන්චිලි පද්දා
කියනව කතන්දර මගෙ බඩ උඩ ඉන්දා
දොයි දොයි බබෝ කියමින් නිදි දුව කැන්දා
තොටිලයෙ තබ නලවමි ගී පද බන්දා

දිවියේ සැඳෑ සමයයි මගෙ ගතවෙන්නේ
මගේ පන්හිඳට කවි පදවැල් මුසුවන්නේ
සුන්දර දිවියකට පෙරමග දිස්වන්නේ
මිනිපිරියන් නිසයි අපෑ දිවි ඔප්වන්නේ

**එම්. ජෝ පාරිස්**
වැලිවිට

## එළ දැරීම

මනස් දසුනින් නොරැවටී
නගමි පිය හිත් මලට
සම වැදිමි.....
රාව නැංවූ සිතුවිල්ලකට
දෙනෙත් යුග විහිදා බලනු
මැන
ඔබ ආ ගමන් මග
යස ඉසුරු තනතුරු නොව
ආදරය උතුරා ගලන
ජීවිතය බෙදන්නට.....
කැඳ වූ බව සමිඳුන්...... ම
දිරි ගන්න දියණියනි,
ඔබ සිටින තැන එළ දරන්නට
මාද ඔබ සමඟ බව
මතකයේ රඳවන්න.......

**රුවන්මලී මැන්දිස්**
කඩලාන

## එළඹ ඇත කාලය

ගින්නෙහි තතු නොදැන
දිය කෙළියේ යෙදෙන
කකුලුවන් විලසින
ඉඳුරන් පිනවමින
සුපිරි මාවතක ඇවිදින

රැකුමට කෙතෙක් වෙහෙසෙන
නිසරු කය දිරායන
අයුරු සිහිකරමින
කුංකුම තිලකයෙන් සරසන
නළල මැද අලු තැවරින

වෙතට යන පාපය
පුහුදුන් ස්වභාවය
තුළින් මර්දනය
යැදුම් හා උපවාසය
කෙලෙසුන් තවන මාර්ගය

**ඊ. ආනන්ද සිල්වා**

## ආයාචනා

පිපෙන්න දඟලන කැකුළු
හැඩට රුවට පිපුනු කුසුම්
ලෝකය ලස්සන කරන්නට
එබී බැලුවත් ලෝකෙට
පාප අඳුර තවරාගත්
ඇතට දෙපයට තැලී පොඩිවී
කෙඳිරිල්ල පමණක් ඉතිරිවී
ළමා ප්‍රඥප්තිය සරුවට
තිබුනත් නීති ගත කර
ළමා ලෝකය විනාශ කරන නරුමයන්ට කොහේද
ආදරයේ නෙත්
ලෝක ළමා දිනය දිනයක් විතරක් වුණේ ඇයි
පාලකයිනේ
ළමා දිනය හැමදිනම වී
ලොව බබළන්ට සුවඳ කරන්නට
නරුමයන් සිඳ බිඳ දමව්
තව තව කැකුළු පුදන්නට

**ටෙක්ලා කල්දේරා**
දන්කොටුව

## සවිය

වයසට
ගිය දා
සිතට
සවියකි
හැරමිටිය

**ඇම්. ඩබ්. අනුර ශාන්ත පීරිස්**
හලාවත



## මළවුන්දා අම්මාගෙන්

අවුරුද්දක් ගතවෙලාද
මා බලන්න
ආවෙ පුතේ........

ඔය මල්ටික
ඉටිපන්දම්
විතරද මට
ගෙන ආවේ......

උඹේ කඳුළු මට පෙනෙනව
මුහුණ පුරා වැගිරෙනවා
සමිඳුන් හට තුති පුදන්න
අම්මා අද ස්වර්ගයේ......

**ටයිටස් සපරමාදු**
බෝපිටිය

## නැගෙන්නම් සුවඳ විද.....

මඩ ගොහුරෙ උපන්නද
ගොහුරු මඩ පරයමින්
නැගෙන්නම් සුවඳ විද
මේ ලොවේ දුගඳ පිස
සුවඳ අතුරනු පිණිස
එතෙක් මා සෙවනැල්ල
දිවි මගේ පහන් ටැඹ
දෙව් සමිඳ අසිරි මැද
රැක දෙන්න සැමදාම
මපෙම්බර දෙගුරුන්ව.....

**ක්‍රිෂාන්ති ඔගස්ටා ගුණවර්ධන**
ශ්‍රී ජයවර්ධනපුර
විශ්වවිද්‍යාලය

## පුංචි සුරංගනාවි

කුස තුළ හොවා බිහිකරනට නොහැකි විද
ඔබ සෙනෙහස මට හිමිකම් ලද නිබද
අම්මෙ කියා ඔබ ඇමතූ විට වින්ද
සිත්සුව නොමැත අද ජීවිතෙ යනු මේද

ඔබ ගැන නොමැත දුක දැනුනේ ඔබට
ඔබෙ දුක දැකත් අප සිටියා නොදැ නෙන්ට
දහසක් වටී ඇවිදින පය පෙන්වන්ට
හොඳ නිදසුනකි ඔබ සත්තයි ලොවට

**ඇම්. ඩී. ජෙනට් ඩල්සි**
කළාන




## ඇගේ ඇඟ මස් කපා දී...!

තමන් වකුගඩු පුදා ලක්බිම
හෙළයකුට දිවි දී සදා
රුවන් මඟ එකමුතුව! පැතූ ඔබ
දෙමළ මිතු සොහොවුර, මෙදා
'දෙමළ - සිංහල කියා බේද වැ
නොමැත කිසි ඉඳුරන් අපේ' කියන ඔබගේ තියුණු දසුනින්
දෙනෙත පෑදිය යුතු රටේ

'ශාන්ති ශිව කුමර' සොහොවුර
සිංහලුන් අතරේ උපන්
වැදී වෙඩි සැර සිදුරු වූ ලක්
මවට ඔබ සැනසුම් පවන්!
ඇගේ ඇඟ මස් කපා දී ඔබ
පිරූ දම් දන් පාරමී
බෙලෙන් හෙළ දෙරණේ නිවනක්
මැවේ වා සමගිය පිරී!

**කිවිසුරු පුෂ්පානන්ද පීරිස්**
පල්ලන්සේන

## දෙව් මවුනි !



දෙව් වදන් සේ පින්බරයි
මරි මව් හද සේ සිසිලසයි
කුරුසියේ ගමන සේ දුක්බරයි
මවුනි ඔබ විශ්වයේ නිමැවුමයි

දෙව් විමන සේ නුඹේ හදගැබ
රසඳුනක් සේ මගේ නෙත් ලඟ
සුමුදු නිර්මල නුඹේ වදනින්
දිවියේ සරුමග පහන් කරවයි

**සුනීතා මාලනි විජේසිංහ**
මතුගම

## පින් පොත

දුන්නෙමි සතයක් නැති බැරි අයෙකුට
ලීවෙමි පිටුවක පොතක් රැගෙන මම
පින් පොත කියලා තැබුවෙමි එහි නම

එදා පටන් කරනා හැම පින් පෙත්
ලීවෙමි පින් පොත පුරාවටම මම
ඇත දහසක් හිස් පිටු දහසක් එහි
කිමදෝ මගේ පින් මදිදෝ
මගේ පින් මදිදෝ

හිතලම කරනා - නොහිතම කෙරෙනා
පව් ලීවොත් අප - එවැනි පොතක් ගෙන
නිසැකයි එහි පිටු හනික පිරෙන බව
(ඒකයි කවුරුත් පව් පොත් නොලියන්නේ)

එහෙම වුණෝතින් පරාද වන්නට බැරි හින්දාවත්
පින් පොත තරග කරයි! පින් පොත තරඟ කරයි !!
එතකොට ලෝකෙට පින් වැඩි වෙයි
ලෝකෙම පින් බර වෙයි

**නැතලි හේරත් නන්හිමි ආරච්චි**
මාරවිල

## වැඩ වර්ජන ජය මාවත....

පාසල් යාමට උදෙන්ම පාරට ගිය විට එදිනේ
බස් මාමල වැඩ වරලා පඩි මදි බව පවසමිනේ
හති ඇර ඇර පයින් ගියා ගුරුතුමාට බයෙන් අනේ
ගුරු හවතුන් වැඩ වරලා පාසලෙ දොර නැහැ ඇරුනේ

ගුරු හවතුන් අතන මෙතන ටියුෂන් කඩ විවර කලා
මුදල් ගෙවා මමත් ඉතින් විභාග ටික පාස් කලා
සරසවියත් ජය අරගෙන සතුටු සිතින් ඇතුළු වෙලා
නවක වදෙන් ගුටි කෑවා, මහාචාරියො වැඩ වරලා

බෙහෙත් ටිකක් අරගන්නට රෝහල වෙත ගියෙ දුවලා
දොස්තරලා හෙද හෙදියෝ ඔක්කොම ටික වැඩ වරලා
පුද්ගලික රෝහල්වල සේවෙට උන් වහ වැටිලා
සල්ලි ටික්ක දුන්න නිසා අපුසෑවට බෙහෙත් කලා

නිතියේ පිළි සරණ පතා ගොඩ වැදුනා උසාවියට
විනිසුරුවෝ වැඩ වරලා ගරු කටයුතු විලාසයට
බාවිතෙ නැති තරාදි පඩි පරිහරණය කළ වරදට
නීතියෙ අග දෙවගනවත් ගෙනැවිල්ලා උසාවියට

**බී. සී. රුදිගු**
නුගපේ



විශ්ව සභාව

බැසිල් ෆොන්සේකා විසිනි

# නව ධර්මදාන සක්‍රමේන්තුව පාපොච්චාරණයයි



“බෞතිස්මය, අභිවෘද්ධි ආලේපය සහ දිව්‍ය සත්ප්‍රසාදය යන සක්‍රමේන්තු විසින් ධර්මදාන සේවක සේවිකාවන් ජීවිත වෙනසකට පාත්‍ර කරමින් අභියෝගයට මුහුණදීම සඳහා ඔවුන් සවිමත් කරමින් ඉදිරියට ගෙන යන බැව් සැබෑය. එහෙත් පාපොච්චාරණයේ සක්‍රමේන්තුව, ධර්මදායකයින් ධර්මදානය බවටම පත් කරනු ලබනවා. තවද පාපොච්චාරණයේ සක්‍රමේන්තුව මගින් ක්‍රිස්තුන් වහන්සේගේ කැඳවීම ප්‍රකාරව හදවත් වෙනස් කරමින් පාපොච්චාරණය කරා මෙහෙය වනු ඇත.

එබැවින් නව ධර්මදානයේ ප්‍රමුඛතම සක්‍රමේන්තුව වන්නේ පාපොච්චාරණයේ සක්‍රමේන්තුවයි.”

නිව්යෝර්ක් හී කාදිනල් තිමති දෝලාන් විසින් එලෙස පැවැසුවේ ශුද්ධාසනයේ පැවැත්වෙන රදගුරු සමුළුවේ රැස්වීම් වාරයේ තුන්වන දිනයේදීය. රදගුරු හිමිවරුන් 250 දෙනෙක් සහභාගි වූ මෙම සමුළුව ඔක්තෝබර් මස 07 සිට 28 දක්වා පැවැත්වීමට නියමිත වී XVI වැනි බෙනඩික්ට් සුදොතුම් පියාණන් විසින් කැඳවනු ලැබ ඇති මෙම සමුළුවේ මුඛ්‍ය තේමාව වී ඇත්තේ ‘කිතුනු ඇදැහිල්ල පතුරුවාලීමේ නව ධර්මදානය යන්නයි. කාදිනල් දෝලාන් හිමිපාණන් විසින්, තවදුරටත් ප්‍රකාශ කරනු ලැබුවේ, නව ධර්මදානයන් ක්‍රියාත්මක කිරීම සඳහා ධර්මදානයේ නියැළී ධර්මදායකයින්මැ ධර්මදානයට ලක්කළ යුතු බවත් එය කළ හැක්කේ පාපොච්චාරණයේ සක්‍රමේන්තුව මගින් පමණක් බවත්ය.

‘දෙවෙනි වතිකාන සම්මන්ත්‍රණයේ 50 වැනි සංවත්සරය සමරණ මේ අවධියේදී මතකයට සිහි ගැන්වෙන කරුණක් නම් පාපොච්චාරණයේ සක්‍රමේන්තුව යළි ප්‍රබෝධනය කළ යුතු බවට කැරුණු ඉල්ලීමයි. එහෙත් අප හොඳින් දන්නා කරුණ නම් බොහො 'තන්හී පාපොච්චාරණය අතුරුදහන් වී ඇති බවයි.’ මෙලෙසින් ද කාදිනල් දෝලාන් හිමිපාණෝ සැමගේ සිත් සතන් අවදි කළෝය. තවද එතුමා විසින් ප්‍රශ්නයක් ඉදිරිපත් කරනු ලැබීය. ලෝකය පුරා දකින්නේ කිනම් වරදක් ද? ඒ වරද කාගේද? වරදට හේතුන් දේශපාලනය ද, ආර්ථික රටාව ද, ගෝලීය උෂ්ණත්වය ද, පරිසර දූෂණය ද? ලෞකිකත්වය ද? නැත නැත ලෝකය පුරා පවත්නා වරදට හේතුව ජී. කේ. ජේස්වර්ටන් දුන් වචන දෙකේ උත්තරය වේ. ‘මමයි හේතුව’ යන්නයි.

“සිත් සතන් හැරවීම සිදුවන්නේ සැබෑ මනස්ථාපනයක් සහිත පාපොච්චාරණය තුළින් පමණයි. එම නිසා පාපොච්චාරණය නව ධර්මදානයේ සක්‍රමේන්තුවයි.” කාදිනල් දෝලාන් හිමිපාණෝ එසේ පවසද්දී රැස්ව සිටි රදගුරු හිමිවරුද. දේව ධර්ම විශේෂඥවරු ද, නිරීක්ෂකයෝ ද ඔල්වරසන් දුන්හ.

## චීන කතෝලික රදගුරු හිමිට කුමක් වුනාදෝ?



මෑතදී අති උතුම් **XVI** වැනි බෙනඩික්ට සුදොතුම් පියාණන්ගේ අනුමැතියෙන් චීනයේ කතෝලික රදගුරු හිමිවරයකු ලෙසින් අභිෂේක ලත් තද්දේවුස් මා ඩාකුයින් හිමිපාණන් ගැන කිසිදු ආරංචියක් නැති වීමෙන් චීන කතෝලික සංඝය මෙන්ම ලෝකවාසි කතෝලිකයෝ ද සංතාපයට පත්ව සිටිති. මේ වසරේ ජූලි මාසයේදී එතුමා විසින් චීන රාජ්‍ය අනුග්‍රහය යටතේ පවත්නා කතෝලික දේශප්‍රේමී සංවිධානය හා කිසිදු සම්බන්ධතාවයක් ඇතිකර නොගන්නා බැව් ප්‍රකාශ කිරීමත් සමඟ එතුමා එදිනැම චීන බලධාරීන් විසින් පැහැරගෙන ගොස් ඇතැයි වාර්තා වේ.

එතුමා කොහේදැයි කිසිවෙක් නොදනිති. මේ නිසාවෙන් ඉතාලියේ ප්‍රසිද්ධ කරනු ලබන ජාත්‍යන්තර සඟරාවක් විසින් ඩාකුයින් රදගුරු තුමා පිළිබඳ තොරතුරු හෙළි කරන්නැයි චීන රජයෙන් ඉල්ලා ඇත. එම ඉල්ලීම අන්තර් ජාලය ඔස්සේ ද පතුරුවා හැර ඇති අතර, ඊට ප්‍රතිචාර දක්වමින් ආයාචනා කර සිටින්නේ ඩාකුයින් රදගුරු චීන කතෝලික සංඝය වෙත බාරදෙන ලෙසටයි.

එම ඉල්ලීමට ප්‍රතිචාරය දක්වමින් යුරෝපා හා අප්‍රිකාන දේශයේ විශාල රටවල් සංඛ්‍යාවක් චීන බළධාරීන්ගෙන් ඉල්ලා සිටින්නේ එතුමන් කොහේදැයි අනාවරනය කරනා ලෙසයි. “ලෝපුරා කතෝලික ජනතාව විසින් ඩාකයින් රදගුරු තුමා නිදහස් කරනා ලෙසට ඉල්ලීමෙන් ද හුවා දැක්වෙන්නේ ජගත් කතෝලික සභාවේ පොදු සහෝදරත්වයයි.

එලෙසින් ප්‍රකාශ කරනු ලබන්නේ මෙම ජගත් ආයතනය දියත් කරන ලද සඟරා කතෘවර ජෙරලාමෝ ලේඛකයාය.

## ලූර්දු හී 68 වෙනි ප්‍රාතිහාර්යය ප්‍රකාශ කැරේ

ඔක්තෝබර් මස 11 වෙනි දිනැ, ඇදැහිල්ලේ වර්ෂය ප්‍රකාශ කරනු ලැබීමට ආනුසංගිකව ලූර්දුවේ 68 වෙනි ප්‍රාතිහාර්ය ද නිළ වශයෙන් ප්‍රකාශ කර ඇති බැව් කිතුනු පුවත් විසින් වාර්තා කරත. ඉතාලි ජාතික සැලේසියානු කන්‍යා සොහොයුරියක් වන ලුවිජිනා ට්‍රාවර්සෝ සුව කළ නොහැකි යැයි ප්‍රකාශ කර තුබු රෝගයෙන් පූර්ණ සුවය ලබා ඇති බැව් ලූර්දු හී ජාත්‍යන්තර වෛද්‍ය නිරීක්ෂණ කමිටුව විසින් ප්‍රකාශ කොට තිබුනේ කලකට ඉහතදීය. ඒ අනුව ඉතාලියේ ඇල්සෙස්තේ කුගොල්ලා රදගුරු තුමන් විසින් එම සුවය ලූර්දු මාතාවන්ගේ මැදහත් කමින් කිසිදු සැකයකින් තොරව ප්‍රාතිහාර්ය ජනකව සිදුව ඇතැයි ලොවට ප්‍රකාශ කරනු ලැබ ඇත්තේද ඔක්තෝබර් 11 වෙනිදාය.

ලූර්දුවේ මෙම 68 වෙනි ප්‍රාතිහාර්ය ජනක සුවයට ආනුසංගික තවත් සුවයක් මේ වකවානුවේදීම ලූර්දුවේ ජාත්‍යන්තර වෛද්‍ය සමුළුව විසින් පිළිගෙන ඇත. එම ආශ්චර්යමත් සුවය අත්දැක ඇත්තේ ප්‍රංශ ජාතික සර්ජ් පැන්කෝසන් නැමැත්තාය. තමා අත්විඳි අංශභාග රෝගයෙන් පූර්ණ සුවය අත්දැක ඇත්තේ වර්ෂ 2002 අප්‍රේල් මස 02 දා ලූර්දු වන්දනා ස්ථානයට පැමිණි අවස්ථාවේදීය. එහෙත් එම සුවය ප්‍රාතිහාර්යයක් ලෙස ප්‍රකාශ කෙරුමට දිගුකල් ගතවූයේ තව තවත් අභියෝග යන්ට ලක් කැරුණු නිසාය. ප්‍රංශය හා ස්පාඤ්ඤය හරහා සැතපුම් 1000 ක දෙපයින් ගිය වන්දනා ගමනේ වුවද කිසිදු ආකාරයේ අංශභාග රෝගී ලක්ෂණයක් ඉස්මතු වී නොමැත. පදවි රදගුරු ජෝශප් ට්‍රේනාඩ් හිමිපාණන් විසින් ස්ථිර කරනු ලැබ ඇත්තේ ඔහු ලබා ඇති සුවය ප්‍රාතිහාර්යයක් හෙයින්, එය සභාව විසින් පිළි ගැනීමේ කාලය එළඹ ඇති බවයි.

## සාම නොබෙල් ත්‍යාගය යුරෝපා සංගමයට දීම මතභේද දනවයි

පසුගිය 60 වසර තුළ යුරෝපා මහද්වීපය පුරා සාමය හා සංහිඳියාව පවත්වාගෙන යාම වෙනුවෙන් යුරෝපා සංගමය කළ සේවාව අගයමින් 2012 සාම ත්‍යාගය එම සංගමයට ප්‍රදානය කළ බැව් නොබෙල් සාම කමිටුවේ ප්‍රධානි තොබෝරින් ජග්ලාන් විසින් මාධ්‍යයට පවසා තිබේ. එහෙත් සාම ත්‍යාගය යුරෝපා සංගමයට දීම පිළිබඳව පක්ෂ හා විපක්ෂ අදහස් පහළ වන්නට පටන්ගෙන ඇත.

යුරෝපය පුරා පැවැත්වෙන ආර්ථික බිඳවැටීම පවත්නා මෙම අවධියේදී එම ත්‍යාගය යුරෝපා සංගමයට පිරි නැමීම කෙරෙහි යුරෝපීය ජනතාවන්ගේ එතරම් සතුටක් ප්‍රකාශ නොවේ යයි ද වාර්තා වේ. බොස්නියාව වැනි රටවලැ සිදුවූ අරගලවලදී යුරෝපා සංගමය ක්‍රියා කළ ආකාරය ද යළිත් විවේචනයට භාජනය කැරෙන අවස්ථාවක් උදාවී ඇත. තවද කතෝලික සභාව විසින් ප්‍රත්‍ය උත්පාදනය හා ගබ්සාව වැනි කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කරති මිනිස් අයිතිවාසිකම් කෙරෙහි ද යුරෝපා සංගමය විසින් අල්ප අවධානය යොමුකර තිබීම ද කෙරෙහි විවිධ කතෝලික කොටස් විරෝධි මතයන් ද දක්වති.

තවද චීනයේ පවත්නා ආගමික නිදහස හා මිනිස් අයිතිවාසිකම් බිඳ දැමීම ගැන යුරෝපා සංගමය විසින් දක්වනු ලබන අල්ප ආකල්පයන් ද දැඩි විවේචනයට භාජනය කිරීම් ද මේ අවස්ථාවේදී උග්‍ර වී ඇත. වසර තුනකට ඉහතදී නොබෙල් සාම ත්‍යාගය ඇමෙරිකාන ජනාධිපති බැරක් ඔබාමාට පුද දුන් අවස්ථාවේදී සිදු වූවාක් මෙන් මෙවර ද යම් යම් මතභේදයන් රාශියක් ඉදිරිපත් වී ඇත.

## කරච්චියේ සා. ප්‍රැන්සිස් සේවියර් දෙව් මැදුරට ප්‍රහාර

ඔක්තෝබර් මස 12 වෙනි සිකුරාදා සන්ධ්‍යා කාලයේ පාකිස්තානයේ කරච්චි නගරයේ ඇති සා. ප්‍රැන්සිස් සේවියර් දෙව් මැඳුරේ විවාහ මංගල මෙහෙයක් පැවැත්වෙමින් තිබිණි. දෙව් මැඳුරු භූමියෙහි වාහන සමූහයක් ද නවතා තිබුණේය. එම මංගල මෙහෙය අවසාන වෙද්දී, සිය සැන්දෑ යාච්ඤාවට සහභාගි වූ 600 ක් පමණ මුස්ලිම් පිරිසක් දේවස්ථාන පරිසරයට කඩා වැදුණෝය.

ඇතිවූ සිද්ධිය දේවස්ථානය භාර මොහාන් වික්ටර් පියතුමා විස්තර කළේ මෙලෙසය. ‘විවාහ මංගල මෙහෙයට 300 ක පමණ පිරිසක් දේවස්ථානයේ සිටියා. කැති පොලු රැගත් මුස්ලිම් පිරිස කෑ කෝ ගසමින් ගල්පහර එල්ල කරන්නට පටන් ගත්තා. ඇඳිරි වැටී තිබුණ හෙයින් විදුලිය දල්වා තිබුණත් කවුරුන් විසින් හෝ එවේලේ විදුලිය විසන්ධි කර තිබුණා. පැමිණි ත්‍රස්ත කණ්ඩායමේ සමහරු නවතා තුබූ වාහන වලට දිගින් දිගට පහර දුන්නා. තවද දෙව් මැඳුරට ඇතුළු වූ පිරිසක් එකිනෙකාට පහර දෙමින් දේවස්ථානයේ ජනෙල් දොරවල් බිඳ දමන්නට වූවා. ඔවුන් අත තුබූ පොලු වලින් සැදැහැවතුන්ට ද පහර දුන්නා. අම්මලා හා තාත්තලා දරු පැටියන් උස්සාගෙන ආරක්ෂක ස්ථාන කරා හඬා වැළපෙමින් දුව ගියා. දෙව් මැඳුරට ඇතුළු වූ පිරිස ගල් මුල් හා පොලු වලින් අල්තාරයට ද ප්‍රතිමා වලටද පූජා බඩු භාණ්ඩාදියට ද පහර දුන්නා. මේ ආකාරයෙන් සැහෙන වේලාවක් කෑ කෝ ගසමින් හා එහා මෙහා දුවමින් ඇතැමුන්ට පහර දුන්නත් බොහෝදෙනා තුවාල ලබා සිටි නමුත් මරණ හානි කිසිවක් සිදුවූයේ නැත. පහරදීම් ආරම්භ වූ අවස්ථාවේදිම මගේ මිතුරකු අමතමින් සිද්ධිය වහා පොලීසියට දන්වන ලෙසට මා ඉල්ලා සිටියා. ඔහු පොලිසිය වෙත ගොස් ආරක්ෂක භටයන් සමඟ එතැනට පැමිණෙන විටත් මුස්ලිම් ත්‍රස්තයන් දේවස්ථාන භූමියේ රැඳී සිටියා. පොලීසියෙන් උඩ වෙඩි තබමින් ත්‍රස්ත කණ්ඩායම එළවා දමනු ලැබුවා. එවේලේ වුවද පොලීසිය නොඑන්නට මරණ හානි පවා සිදුවන්නට අවකාශ තිබුණා.”

පසුදිනැ සෙනසුරාදා සුළුතර ආගමික ජනතාව වීථි බැස සුවිසල් විරෝධතාවයක් දැක්වූවෝය. සමාජ ක්‍රියාකරුවන් හා ආගමික නායකයින් පිරිසක් ප්‍රාදේශීය බලධාරීන් හමුවී බලකර සිටියේ එවන් ත්‍රස්ත ක්‍රියාවන් තවදුරටත් ඇති නොවීම සඳහා පියවර ගන්නා ලෙසටයි; නොඑසේනම් දිගින් දිගටම විරෝධතාවයන් දක්වන බවට අවධාරණය කරන ලදී.

## මැදපෙරදිගින් කිතුනුවන් පැන්නීමේ තැත දරුණුයි

“සිරියාවේ හොම්ස් ප්‍රදේශයෙන් පමණක් 80,000 කට වැඩි පිරිසක් දැනටමත් පන්නා දමා ඇත. සිරියාවේ වසර සිය ගණනක් පැරණි ආරාමයක අනුග්‍රහයෙන්, වසර 19 යකට ඉහතදී ගොඩනගන ලද සා. ජේම්ස් දේව මැඳුර ගිනිබත් කොට තිබේ. තවද හොම්ස් ප්‍රදේශයේ කල්දියා ගම්මානයේ එක් ගොඩනැගිල්ලක් තුළ සරණාගතයින් පිරිසක් සිරකොට ගිනිබත් කොට තිබුණා.

මෙවන් සිද්ධීන් තුළින් මැනැවින් ප්‍රකාශ කැරෙන්නේ සිරියාවෙන් කිතුනුවන් තුරන් කිරීමේ සැළසුම් සහගත කුමන්ත්‍රණයක් පවත්නා බවයි.” මෙලෙස ප්‍රකාශ කරනු ලැබුවේ, මෙවන් සත්‍ය කරුණු කීපයක් අන්තර් ජාලය ඔස්සේ ප්‍රකාශ කළායයි චෝදනා ලැබ මරණ තර්ජනයට ලක් කැරුනු සිරියාවේ පැරණිතම කන්‍යාරාමයේ ශ්‍රේෂ්ඨ මව් තුමිය ලෙසින් දිගුකලක් සේවය කර ඇති ඇග්නස් මරිආම් දලා ක්‍රොයික්ස් මව් තුමියයි. ඇට එල්ල වූ මරණ තර්ජන හමුවේ ඈ රටින් පිටව ඊයේ පෙරේදා ඔස්ත්‍රේලියාවට පැමිණ සිටී. ඔස්ට්‍රේලියාවේ වෙසෙන සිරියාන ජාතිකයන් හා අනෙකුත් පිරිස් සමඟ ඈ විසින් ‘සිරියාවට අත නොතබනු’ යන සංවිධානය බිහිකරගෙන ඇත. එමගින් සිරියාවේ කිතුනුවන් පිළිබඳ සැබෑ තත්ත්වය ලොවට හෙළි කරමින් හඬ නගනා බැව් ඈ පවසයි.

තවද එතුමිය විසින් හෙළි කරනු ලැබ ඇත්තේ, කිතුනු විරෝධි ඉස්ලාම් ත්‍රස්තවාදී පිරිස් ඉරාකය පකිස්තානය උතුරු අප්‍රිකාව සහ ඇෆ්ගනිස්ථානය යන දේශයන් ගෙන් පමණක් නොව ඇතැම් බටහිර රටවලින් ද සිරියාවට පැමිණි කිතුනු සංහාරයක් ඇති කිරීම සඳහා ආධාර උපකාර කරනා බවයි. ‘සිරියානු කැරැල්ල මුලින් ඒකාධිපති වාදයට විරුද්ධ ප්‍රජාතන්ත්‍රවාදි නැගිටීමක් ලෙස හුවා දක්වනු ලැබුවත්, වර්තමානයේදී එමගින් දැක්වෙන්නේ, ආගමික නිදහස ඇතුළු සියළු මිනිස් අයිතිවාසිකම් විනාශ මුඛයට ගෙන යනු ලබන ත්‍රස්ත ක්‍රියාදාමයක් බවයි. සිරියාවේ කිතුනුවන් ඇතුළු සුළුතර ජාතීන් තුවක්කු අභිමුව තබා ඇත. ඔවුන් සමුල ඝාතනය කිරීමේ රහස් ව්‍යාපාරයක් පවතින බැව් ලෝකය විසින් අවබෝධ කරගත යුතුය. මෙම 21 වෙනි ශත වර්ෂයේදී එවන් අමානුෂික ක්‍රියාදාමයකට ඉඩහැර බලාසිටිය හැකිද?’ මෙම අදීන කන්‍යා සොහොයුරිය එලෙස ප්‍රශ්න කරන්නේ සකල ලෝක ජනතාවගෙනි.

## ලෝක රදගුරු සංසදයේ දී චීන රදගුරු හඬක් හෝ නොඇසිනි

“මෙම ඓතිහාසික රදගුරු සමුළුවේදී, චීන කතෝලික සභාවේ හඬක් හෝ ඔබ සැමදෙනාට ඇසෙන්නට නොහැකි වීම ගැන මා අතිශය දුක්වෙනවා.” චීන රදගුරු ජීන් ෆෙන්ග් උතුමාණන් විසින් **II** වතිකාන සමුළුව වෙත එවා තුබූ ලිඛිත පණිවුඩය ඇරඹුනේ එලෙසයි. රෝමයේ පැවැති එම සමුළුවට පැමිණීම සඳහා අවසරය නොලද හෙයින් එම ලිඛිත පණිවුඩය එවා තිබුණි. ඔක්තෝබර් මස 16 වැනිදා එම පණිවුඩය සමුළුව හමුවේ කියවනු ලැබුවේ, සමුළු මහා ලේකම් අගරදගුරු නිකොලා එතොරෝවික් හිමිපාණන් විසිනි. වසර පනහකට අධික කාලයක් පුරා චීනයේ පවත්නා කතෝලික පීඩනය පිළිබඳව ජීන් ෆෙන්ග් රදගුරු තුමා සිය ජීවිතයෙන්ම සාක්ෂි දරයි. එතුමාගේ වයස අවුරුදු 90 කි. එම කාල පරාසය තුළ පූජක වරයෙක් හා රදගුරු තුමෙක් වශයෙන් එතුමා විසි වසරක කාලයක් හිරබත් වළඳා ඇත.

“චීන කතෝලික සභාව වර්තමානයේදී වුවද පීඩිත සභාවකි. එහෙත් විශේෂයෙන් චීන කතෝලික සභාවේ ගිහියෝ මුල් කිතුනුවන් මෙන් සිය ස්ථිරසාර ඇදැහිල්ල බැතියෙන් ද සක්‍රීයව ද සහෝදරත්වයෙන් ද පවත්වාගෙන යති. ගිහි කතෝලිකයන්ගේ ජීවිත පැවැත්ම එකිනෙකාට ආදර්ශමත්ය. ශුද්ධෝත්තම පියතුමා මෙන්ම ලෝක කතෝලික සභාව ද චීන කතෝලික සභාව කෙරෙහි ඉමහත් සහෝදරත්වයෙන් පිළිගන්නා බැව් අපි දනිමු. මා මෙහිදී ආණ්ඩු ක්‍රමයන් හා කතෝලික පීඩාවන් ගැන කතා කරන්නේ නැහැ. අපි දේව හස්තය තුළ ඇදැහිල්ලේ ගමනක් ප්‍රීතියෙන් යන්නෙමු. තවද මෙම ඇදැහිල්ලේ වර්ෂය තුළදී සියළු පීඩනයන් හමුවේ චීන කතෝලික සභාව නොසැළී යන ගමන කෙරෙහි ෂෂ වතිකාන සම්මේලන වාරයන් හිදී සහෝදරත්වයෙන් සාකච්ඡාවන්ට භාජනය කරනා මෙන්ද ඉල්ලා සිටිමි.” චීන රදගුරු ජීන් ෆෙන්ග් උතුමාණෝ එලෙසින්ද අවධාරණය කළෝය.

## විශ්වාසයේ වර්ෂය සඳහා තේමා ගීතිකාව




සමිඳුන් වෙනුවෙන් දිවි දුන් මිනිසුන්ගේ
පා සටහන් මත පියවර තබමින්
නිති ඇදහිල්ලෙන් දිවිය ගෙවන්නට
අදිටන් කරනෙමි නොබියව නිරන්තරේ

පුන ගැයුම :
ඇදහිල්ලේ උල්පත වන දෙවිඳේ
ඔබ ගැන පමණක් අදහා ඉන්නට
අදහන දේ නිති ජීවත් වන්නට
දිරිගන්වා මා සවිමත් කරනු මැනේ

සෝ දුක් කඳුලැලි දළරළ සේ එසැවී
ඔබගෙන් ඈතට මා ගෙන යද්දී
ජෝබ් තුමන් මෙන් අදහා ඉන්නට
අදිටන් කරනෙමි නොබියව නිරන්තරේ

මා සන්තක සැමදේ දූවිලි වෙද්දී
මිත්‍යා ඇදහිලි මා රවටද්දි
ආබ්‍රහමුන් සේ ඔබ අදහන්නට
අදිටන් කරනෙමි නොබියව නිරන්තරේ

| | |
|---|---|
| ගේය පද | - අතිගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා |
| තනුව | - ගරු සිසිල් කුමාර පියතුමා |
| සංගීත සංයෝජනය | - රෝහණ වීරසිංහ |
| ගායනය | - නිරෝෂා විරාජිණී |

# ආධ්‍යාත්මික සුවය යනු කුමක්ද?

**නිරෝගීතාව හෙවත් සුවය මෙලොව වෙසෙන සැම දෙනෙකුටම අත්‍යවශ්‍ය වේ. මෙය ශාක හා සත්ත්ව යන කොටස්වලට ද අත්‍යවශ්‍ය වූවකි. සුවය, ධනයක් ලෙසටද කියමනක් ඇත. මෙහිදී අපගේ සිත් සතන් වලට එන සිතුවිල්ලක් තිබේ. එනම් ශාරීරික හා මානසික සුවතාවයි. නිරෝගීභාවයයි. මෙය අපගේ මෙලොව ජීවිතය කෙරෙහි ඉතා දැඩි ලෙස බලපෑම් කරයි. එහෙත් සත්‍ය වශයෙන්ම කායික, මානසික සුවය පමණක් කිතුනුවන්ට ප්‍රමාණවත් ද? යන්න විමසා බැලිය යුත්තකි.**

ආධ්‍යාත්මික සුවය නම් වූ නිධානයෙන් වෑහෙන, රන්, මිණි, මුතු මෙන් ශාරීරික, මානසික සුවය සඳහන් කිරීමට පුළුවන. මෙය සත්‍යයක් පමණක් නොව යථාර්ථයක් ද වන්නේ ය. ආධ්‍යාත්මික සුවය ඕනෑම ධර්මයක්, දර්ශනයක් මත සිටින සැමට පොදු වූවකි. මෙය අපට ප්‍රත්‍යක්ෂ නොවේ. ඊට හේතු වනුයේ ආධ්‍යාත්මික සුව සහනයේ පහසින් එතරම් පිබිදීමට අපට නොහැකි නිසාය.

ආහාර, ඇඳුම් පැළඳුම්, වාසස්ථාන, බෙහෙත් යනාදිය මූලික මිනිස් අවශ්‍යතා ගණයට අයත්ය. මේවා සිව්පසය ලෙස බෞද්ධ දර්ශනයෙහි දක්වා ඇත. එසේ වුවද ආධ්‍යාත්මික නිරෝගිතාව අප ජීවිත කෙරෙහි සෘජුව බද්ධ වේ.

එකිනෙකා කෙරෙහි වෛරය, පළි ගැනීමේ චේතනා, සමාව නොදෙන්නට අකමැති බවක් හදවත තුළ තිබේ නම්, දෙවිඳුන් කෙරෙහි අවිශ්වාසයක් තිබේ නම් ශුද්ධවූ බයිබලය බැතිබරව කියවීමට යොමු නොවේ නම් සක්සුදක් සේ පෙනෙන දෙයක් ඇත. එනම් ආධ්‍යාත්මික සුවය අපට නොමැති බවයි.

දෙවිඳුන් අපට ප්‍රකාශවන මාර්ග කෙරෙහි සංවේදී නොවීම, පෞද්ගලික ශුද්ධවන්තභාවය කෙරෙහි පමණක් යොමු වීම, දෙවිඳුන්ට අප ජීවිත ගැටලු, අසනීප, වේදනා භාර නොදීම සහ ඒවා එතුමාණන්ගේ ශ්‍රී හස්තවලට බාර දී උන්වහන්සේ දෙස නොබලා ප්‍රශ්න, දුක් කරදර, අසනීප දෙස බලා දුර්මුඛවීම ආධ්‍යාත්මික සුවය අපට නොලැබෙන මාර්ග අතර ප්‍රමුඛ වේ.

එපමණක් නොව අප මුළු ජීවිත පැවැත්ම, සිතුම් පැතුම්, දක්ෂතා අරමුණු දෙවි සමිඳුන්ට නතු කළ යුතුවේ. මෙහිලා අපට සාධාරණ සැකයක් මතුවේ. එමගින් අපගේ සැප සම්පත්, දක්ෂතා, අයිතිවාසිකම්, ආශාවන්, මිල මුදල් අපට අහිමිවේද යන්නයි.

එහෙත් එය අර්ථශූන්‍ය හැඟුම්වලියකි. දෙවි පියා අබමල් රේණුවක තරමින් වුවද අප හිමිකම් අත්කර ගැනුමට වෑයම් නොකරති. මිනිසාගේ නිදහස් කැමැත්තට බාධා කිරීමට උන්වහන්සේ කිසිදු විටෙක උත්සාහ නොකරති. දෙවියන් වහන්සේ සිය දූ දරුවන් නිරෝගී සම්පතින් වැජඹීම සිය පරමානන්දය ලෙස සලකන සේක. මෙලොව ඇතැම් විට අප ලබන කායික, මානසික සුවය උන්වහන්සේ අපට උරුම කර දෙන ආධ්‍යාත්මික සුව සහනයේ සේයාවක් වැන්න. දෙවිඳුන් අපට දෙන සුවය, දේව රාජ්‍යයේ ලක්ෂණයකි. උන්වහන්සේ අපට සුවය ලබා දී නිමවන්නේ නැත. ඉන් ඔබ්බට යන්නට ද ක්‍රියා කරන සේක. තවද ආධ්‍යාත්මික සහනයට ඒකාබද්ධ වන්නට නිතර උත්සුක විය යුතුය. ඊට පිපාසයක් ඇතිවන්නට යාච්ඤා කළ යුතුය.

✍ **මලින්ත බෝපෙආරච්චි**
දළුගම - කැලණිය

# තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරය (Y.C.S.) ආසියාතික සමුළුව



තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයේ 12 වන ආසියාතික සමුළුව සහ කවුන්සලය මෙවර දකුණු කොරියාවේ සියොල් නගරයේ කතෝලික විශ්ව විද්‍යාලයේ අගෝ. 06 සිට 15 දා දක්වා පවත්වන ලදි. මෙයට ආසියාවේ රටවල් 13 න් සජීවක සජීවිකාවන් සහ ශිෂ්‍ය ශිෂ්‍යයන් 75 ට අධික පිරිසක් සහභාගි වූහ.

ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ගරු ගිහාන් ගුණතිලක පියතුමා (පදවි උපාධ්‍ය), නිලූෂි ප්‍රසංගිකා (ආඬිඅම්බලම), කෝසල ධනංජය (බදුල්ල පදවිය), දුෂාන් උදයංග (සා.සෙබස්තියන් - කඳාන), ශේන් පීරිස් (සභාපති - සා. ජෝශප් මරදාන), තිහාරා බර්නඩෙත් (ලේකම් - කොළඹ පදවිය) සහභාගි වූහ. "ආසියාවේ ආලෝකය වනු පිණිස කැඳවනු ලැබූ සිසුන් විශ්වාසයේ ඉදිරි ගමනක් තුළින් ආසියාවේ නවෝදයක් කරා" යන තේමාව ඔස්සේ මෙම සමුළුව පවත්වන ලදි. එහිදී වැඩමුළු සහ ගවේෂණාත්මක විමර්ශන සඳහා ද අප කණ්ඩායම සහභාගි වන ලදි.

එහිදී දකුණු කොරියාවේ සෝල් නුවර අගරදගුරු හිමිපාණන් (මැද) සහ ආසියාතික ත.ක්‍රි.ශිෂ්‍ය ව්‍යාපාරයේ ප්‍රධාන පියතුමා (දකුණේ) සමඟින් ශ්‍රී ලංකාව නියෝජනය කළ කණ්ඩායම සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු....

**(පදවි ලේකම් - තිහාරා බර්නදෙත්)**

# අගරදගුරු පදවි වාර්ෂික තරුණ ධර්ම විවේකය

**දේව තාත්තාගේ ආදරයේ හදවතට තරුණ ජීවිත ළඟා කිරීමේ අරමුණ ඇතිව ක්‍රි.ව. 2000 දී ගරු ජූඩ් බර්නාඩ් පියතුමාගේ අදහසකට අනුව තෙදිනක ධර්මවිවේකයක් වල්පොල පුබුදු ප්‍රශංසාරාමයේ දී ගරු ඩැරල් පියතුමා, ගරු ප්‍රියන්ත පියතුමා, චාල්ස් සොයුරු, ලලිත් පෙරේරා සොයුරු යන අයගේ සහභාගිත්වයෙන් පළමු ධර්ම විවේකය ආරම්භ කෙරුණි.**

2003 වසරේ සිට එය තේවත්ත ලංකා අප ස්වාමිදූගේ පුදබිමේ ගරු අමිල ගෝමස් පියතුමාගේ මඟ පෙන්වීම මත පැවැත්විය. එවක් පටන් 2011 වසර දක්වාම තේවත්ත පුදබිමේ පැවැත්වූ අතර, 2008 වසරේ දී යුදමය වාතාවරණය හේතුවෙන් නොපැවැත්විය. 2010 වසරේ සිට ගරු අනුර පියතුමා එය සංවිධානය කරනු ලබයි.

මෙතෙක් ධර්ම විවේකය පදවියක් ලෙස සංවිධානය වුවද මේ වසරේ සිට එය කලාප මට්ටමින් සංවිධානය කර ඇත. මෙමගින් වැඩි පිරිසකට අවස්ථාව උදාවන අතර වැඩි අවධානයක් ලබාදීමට ද අවස්ථාව උදා වී ඇත. ඒ අනුව මෙවර කලාප මට්ටමින් එක් දින ධර්මවිවේකය සීදුව සුපුවත් අරණ මධ්‍යස්ථානයේදී පැවැත්වේ. නොවැ. 04 ජා-ඇල කලාපය, 10 - කොළඹ නැගෙනහිර කලාපය (ගම්පහ, ගුරුබැවිල දිසා), 17 - මීගමු කලාපය, 24 - මොරටුව කලාපයයි. එම සෑම දිනකම පෙ.ව. 8.00 සිට ප.ව. 6.00 දක්වා පැවැත්වේ.

මෙතෙක් පැවති අගරදගුරු පදවි තරුණ ධර්ම විවේකය බොහෝ තරුණ තරුණියන්ගේ මතකයේ සටහන් වී ඇති සුමිහිරි මතක සටහන් අතරින් නොමැකෙනම මතක සටහන වී ඇති බව නොරහසකි. ගිය වසර තෙක්ම තේවත්ත ජාතික බැසිලිකා පුදබිමේ දී චතාරික සමය තුළ තෙදිනක් පැවැති ධර්ම විවේකය අවසන්කොට නිවෙස බලා පිටත්වන සෑම තරුණ හදවතකම ආශාව වූයේ එළඹෙන වසරේදී ද පැමිණීමයි. සිකුරාදා සැඳෑ යාමයේ පුදබිමට පය නගන තරුණ හදවත් දුක, වේදනාව, කලකිරීම, තනිකම, ඇබ්බැහිකම් හා සමඟ පා නැගුවද ඉරුදින පුදබිමෙන් සමුගන්නේ කිසිදා අත්නුදුටු මහත් වූ සතුටකින්, නිදහසකින් හා ඇබ්බැහිවීම්වලින් නිදහස් වීමෙන් ය. එපමණක් ද නොව ජේසු සමිඳුන්ව තම ජීවිතයේ මහා අත්දැකීම කරගනිමිනි. ඔවුන් කිතු සමිඳුන් සමඟ නව ජීවිතයකට ඇතුළු වෙයි. මන්ද ධර්ම විවේකයේ දී ඔවුන් තුළ ශු. පාවුළු තුමා පවසන ලෙසම ඉටුවෙයි. "යමෙක් ක්‍රිස්තුන් වහන්සේ තුළ සිටී නම්, එතැන ඇත්තේ නව මැවිල්ලකි. පැරැණි දේ පහව ගොස් ඇත. දැන් සියල්ලම අලුත් වී තිබේ." (2 කොරින්ති 5:17).

### ධර්ම විවේකය තරුණ ඔබට වැදගත් වන්නේ ඇයි?

අද බොහෝ තරුණ ජීවිත කලකිරීමෙන්, තනිකමින්, වේදනාවෙන්, ඇබ්බැහිවීම්වලින් පිරී ඇත. තමන්ට තමන් නිසාත්, අන් අය නිසාත් ජීවිතය කලකිරීමෙන් හා තනිකමින් ගත කරන තරුණ තරුණියන් අද සමාජයේ නැතිවා නොවේ. එපමණක් ද නොව හදවතේ තරහව, වෛරය පොදි බැඳගෙන වේදනාවෙන් කල් ගෙවන තරුණ ජීවිත ඇත. එම ජීවිත අද ආදරය අයදින විවිධ අය හා විවිධ දේවල් පසුපස ගමන් කරමින් සිටී. විටෙක එම ජීවිත වලට ආදරය, සතුට ලැබුනද එය කලකට පමණක් සීමාවෙයි. එම නිසා ජීවිතය විනාශ කරගැනීමේ තැනට ද පත්වෙයි. එවැනි තත්ත්වයක සිටින තරුණ ඔබට සදාකාලික ආදරයත් සදාතනික සතුටත් අත්කර දීමට අයෙකු බලා සිටී. ඔබ සූදානම් ද එය ලබාගැනීමට තරුණ ජීවිතයට ඔබව තේරුම් ගන්නාවූ, පිළිගන්නාවූ සදාතනික මිතුරාණන් වන ජේසු සමිඳුන් තම සදාතනික ආදරයත් සතුටත් ධර්ම විවේකය තුළ ලබාදීමට මඟ බලා සිටියි.

### ධර්ම විවේකය තුළ සිදුවන්නේ කුමක්ද?

ධර්ම විවේකය ආරම්භ කරනුයේ ශුද්ධාත්මයාණන් වහන්සේට සියලු ජීවිත භාර කරමිනි. එහෙයින් එම දවස පුරාවටම සියලු දෙනා මෙහෙයවනු ලබන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේය. "එලෙසම ශුද්ධාත්මයාණන් වහන්සේත් අපගේ දුර්වලකමේදී අපට ආධාර දෙන සේක." (රෝම 7:26). ඉහත ශු. පාවුළු තුමා පවසන ආකාරයට ශුද්ධාත්මයාණන් වහන්සේ "අපගේ දුර්වලකමේදී අපට ආදර දෙනු" ලබයි. සැබවින්ම අපි දුර්වල මනුෂ්‍යයෝ වෙමු. එහෙයින් ආත්මයාණන් වහන්සේට නතුවන විට එහි අපවිත්‍ර කිසිවක් ඉතුරු නොවේ. මන්ද උන්වහන්සේ වතුරෙන් බෞතිස්මය ලබා සිටින අපව ගින් නෙන් පවිත්‍ර කරනු ලබන හෙයිනි.

"නිසි ලෙස යාච්ඤා කළ යුත්තේ කෙසේදැයි අපි නොදනිමු. එහෙත් ශුද්ධාත්මයාණන් වහන්සේම වචන වලින් කිය නොහැකි අපේ සුසුම්ලෑම් වලදී දෙවියන් වහන්සේ වෙත අප වෙනුවෙන් අයදින සේක." (රෝම 7:26). ඉන් අනතුරුව අපිට නොදැනීම ගැඹුරු යාච්ඤාවකට අපව මෙහෙයවයි. එහිදී අපට අපගේ නියම ස්ථානය අපට උගන්වන ආත්මයාණන් වහන්සේ මනස්ථාපනය පිලිවෙත තුළ සැබෑ ඇතුළාන්ත මනස්ථාපනයකට අපව මෙහෙයවයි. "මනස්ථාපනය වීමට වුවමනා නැතැයි සිතන සිල්වතුන් අනූ නව දෙනකුට වඩා මනස්ථාපනය වන එක පව්කාරයකු ගැන ස්වර්ගයෙහි ප්‍රීතිය ඇතිවන්නේ ය. " (ලූක් 15:7). එම ප්‍රීතිය හේතුවෙන් බහුල වූ ආශිර්වාදයන් ගලාගෙන එනු ලබයි. සියලු ප්‍රශ්නවලට පිළිතුරු ලබාදෙනු ලබයි. සියලු ඇබ්බැහිවීම්වලින් නිදහස් වෙයි.

එසේම ප්‍රශංසාව තුළ ජීවමාන වන දෙවියන් වහන්සේ මහා බලයක් අප තුළ ඇති කරයි. උන්වහන්සේගේ පුත්‍රභාවයට අපව වඩ වඩා ඇතුල්කර ගනිමින් මහා අනාවරණයන් ගෙන එන අවස්ථාවක් ද වෙයි. එම පුත්‍රභාවයේ උරුමය තුළ ජීවත් වීමට දිව්‍ය සත්ප්‍රසාදීය කිතු සමිඳාණන්ගේ බලය දිව්‍ය පූජාව තුළ අප එකිනෙකා හට දානය කරනු ලබයි.

ආදරණීය තරුණ තරුණියෙනි, එම උතුම් වූ පුත්‍රභාවයේ උරුමය තුළ මෙලොව සතුටින් ආදරයෙන් ජීවත්වීමට ආශිර්වාදය ලබා ගැනීමට කාලය පැමිණ ඇත. ඔබගේ කලාපයේ ධර්ම විවේකය පවතින දින දී දෙවිඳු ආදරය ලබන්නට අප හා එක්වන්න. සාතන්ට ඉඩ නොදෙන්න. එම දින දී ඔබව වළක්වාලන්නට රැකියාව, අමතර පන්ති බාධාවක් කර නොග න්න. දෙවියන් වහන්සේට සියල්ල කළ හැකිය. "ඇරියුමයි ඔබ හට දෙවිඳු පහස ලබනට"!

✍ **ටෙරන්ස් ශානක**
කොළඹ අගරදගුරු පදවි කතෝලික තරුණ සංගමය

# "සභා මාතාව තුළ ආදරය වෙමි මම"

## මහා මෙරක් වූ කුඩා මල සහ මහා මෙහෙවර - 12

**සා. තෙරීස් තුමිය තුළ තිබූ, වර්තමාන ලෝකයට ඉතා අත්‍යවශ්‍ය වූ ගුණාංගයක් නම්, එතුමියගේ ඇදහිල්ලේ ඒකාග්‍රතාවයයි ඒකීය භාවයයි. එනම් ක්‍රිස්තුස් වහන්සේගේ මහිමය උදෙසා පමණක් ක්‍රියා කිරිම සහ ජීවත් වීමය. එතුමියට වෙනත් කිසිදු අරමුණක් හෝ චේතනාවක් කිසිම අවස්ථාවක තිබුණේ නැත. එතුමිය ඉපදුනේ, ජීවත් වුනේ සහ මිය ගියේ ක්‍රිස්තුස් වහන්සේ උදෙසා සහ උන්වහන්සේ සඳහා පමණි.**

එම චේතනාව මුදුන් පමුණුවා ගැනීම සඳහා එතුමිය තුළ නොසැලෙන, නොබිඳිය හැකි, වානේ මෙන් වූ අධිෂ්ඨානයක් තිබුණි. එතුමිය තම ස්වයං චරිතාපදානය (Autobiography) වන "ආත්මයක කතාව" (Histoire d'une ame : manuscrits autobigraphoques) ආරම්භ කරන ආකාරයෙන්ම ඒ බව මොනවට පැහැදිලි වේ.

"මාගේ ජීවිතයේ කතාන්දරය ලියා ඔප්පු කරන්නට යන්නේ ඔබටය (එනම් ප්‍රධාන කන්‍යා මවු තුමියටය) මෙය කිරීමට ඔබතුමිය මට නියම කළ විට මසිත මුලාවීමට මෙය හේතු වේ යයි සිතුවෙමි. නමුත් අවංක ලෙස කීකරුවීම තමන් වහන්සේට ප්‍රසන්න බව ජේසු ස්වාමි දරුවෝ මට ඉගැන්වූ සේක. එමනිසා මට සදාකාලයටම ගායනා කරන්නට තිබෙන ස්වාමින් වහන්සේගේ කරුණාවන්තභාවය මෙහිදීම ගායනාකරන්නට මෙහිදීම පටන් ගනිමි.

ලිවීමට පෑන අතට ගන්නට පෙර මෝක්ෂ රාජේශ්වරියගේ ප්‍රතිමාව ඉදිරියේ දණින් වැටී එතුමියට අප්‍රසන්න වූ එක වචනයක්වත් නොලියන පිණිස මට උදව් වෙන මෙන් ඉල්ලා යාච්ඤා කළෙමි. මෙම ප්‍රතිමාව සමීපයෙහි එක්රැස්ව යාච්ඤා කිරීමෙන් කන්‍යා මරිය තුමියගෙන් අපි අපේ පවුලට මාතෘක උපකාර රාශියක් ලබා ගත්තෙමු.

යාච්ඤාවට ඉක්බිතිව මම සුවිශේෂ පොත විවෘත කර බැලූ කල්හි "ජේසුස් වහන්සේ කන්දකට නැග තමන්වහන්සේ කැමති වූවන් තමන් ලඟට කැඳවූ සේක" යන වචන එහි දුටුවෙමි.

මෙන්න! මගේ කැඳවීමේ, මගේ මුලු ජීවිතයේ අභිරහස! ජේසු ස්වාමිදරුවන් මගේ ආත්මය පිට විශේෂ වරප්‍රසාදයන් වැස්වීමේ අභිරහස! උන්වහන්සේ අඬ ගසා වදාළේ සුදුස්සන් නොව, තමන් වහන්සේ කැමති වූවන්ය. ශුද්ධවූ පාවුලු තුමා කියා ඇති පරිදි "දෙවියන් වහන්සේ දයානුකම්පා වෙන්නට කැමති තැනැත්තා වෙත දයානුකම්පා වෙන සේක. කරුණා කරන්නට කැමති තැනැත්තා වෙත කරුණා කරන සේක. එහෙයින් කැමති තැනැත්තා විසින්වත්. දුවන තැනැත්තා විසින් වත් නොව, දයානුකම්පාව පෙන්වන දෙවියන් වහන්සේ විසින්ම එසේ සිදුවේ.

ශුද්ධවන්තයන්ගේ ජීවිත කතාන්දර කියවන විට එක් කලෙක, මහත් පව්කාරයන්ව සිට පසුව උසස් අධ්‍යාත්මික සම්පූර්ණකමට පැමුණුන ශුද්ධ වූ පාවුලු, ශුද්ධ වූ අගුස්තීනු, ශුද්ධ වු මරිය මග්දලේනාදී හු, මරණය දක්වා කිසිවිටක තමන්ගේ පිරිසිදුකම නැතිකර නොගත් නිර්දෝෂ ආත්මයෝද අපට සම්භවෙති. එක් ආත්මයක ශුද්ධවන්තකම, වෙන ආත්මයක ශුද්ධවන්තකමට වෙනස්ව තිබේ. එය මෙසේව තිබෙන්නේ මන්දැයි දැන ගැනීමට මම බොහෝ කාලයක සිට ආශාවෙන් උන්නෙමි.

ජේසු ස්වාමිදරුවෝ මගේම ආශාව සන්සිඳෙව් සේක. ඒ මෙසේය. උන්වහන්සේ මැවිල්ල නමැති මහා පොත කියවීමට මට සැලැස් වූ සේක. මමද උන්වහන්සේ විසින් මවන ලද මල් සියල්ලම කදිම බවද, ඒවා පාටින්ද, සුවඳින්ද, ප්‍රමාණයෙන්ද, අගයෙන්ද එකිනෙකට වෙනස් බවද, රෝස මලෙහි මනා දැකුමවත්, ලිලී මලෙහි ධවලත්වයවත්, වයලට් නම් මලෙහි සුගන්ධයවත්, පාකරෙට් නම් මලෙහි ප්‍රීතිය ගෙන දෙන චාම් පෙනීමවත් නැති නොකරන බවද එයින් ඉගෙන ගතිමි. සියලුම මල් රෝසමල් වී නම් මැවිල්ලේ අලංකාරය නැතිවී යන්නේය. මල් වතු සිත් කලු කුඩා මල් වලින් තවත් සරසනු නොලැබෙන්නේය.

මෙලෙසම ස්වාමීන් වහන්සේගේ ජීවමාන උද්‍යානය වූ ශුද්ධවූ සභාවේ ශාන්තුවරයන් නැමති පුෂ්පයන් ගැනද කිය හැකි බව මට අවබෝධ විය. මෙහි උන්වහන්සේ රෝස සහ ලිලී මල් වලට සමාන කළ හැකි ලෝක පූජිත මහත් ශුද්ධවන්තයන් තමන්ගේ වරප්‍රසාද බලයෙන් සෑදු සේක. "වයලට්" සහ "පාකරව්" ආදී අගයෙන් අඩු මල්වලට සමාන කළ හැකි වැඩි කිනිතියක් නැති ආත්මයන්ද මවන්ට උන්වහන්සේ කරුණා කළ සේක. මෙම පසු කී ආත්මයෝ වනාහි උන්වහන්සේගේ ශ්‍රී පාද දක්වා පහත් කරනු ලැබුවත් උන්වහන්සේගේ දයාබර බැල්ම භුක්ති විඳීමට වාසනාවන්තයන් බවට පත්වී සිටිති. ආත්ම නැමති මෙම පුෂ්පයෝ දේව කැමැත්ත ප්‍රීතියෙන් ඉෂ්ට කරන පමණට අධ්‍යාත්මික සම්පූර්ණකමෙහි වර්ධනය වෙන්නෝය."

සා. තෙරීස් තුමිය තුළ තිබූ අයෝමය අධ්‍යාත්මික අධිෂ්ඨානය දේව වරප්‍රසාදයේ ඍජු ප්‍රතිඵලයකි. කිසිම දුෂ්කරතාවයකින් එතුමිය අධෛර්යයට පත් නොවූවාය. සෑම දුෂ්කරතාවයක්ම එතුමියට අධ්‍යාත්මික අභියෝගයක් විය.

කුඩා කල සිටම එතුමියට ශාන්තුවරියක් වීමට උවමනා විය. අපගේ ජීවිතයේ ශුද්ධවන්තභාවය අපගේ අධිෂ්ඨානයට සමානුපාතික වේ. ශුද්ධවන්තයෙක් වීම මනුෂ්‍ය අධිෂ්ඨානයේ ප්‍රතිඵලයක් පමණක් බව මෙයින් අදහස් නොවේ. නමුත් ඒ සඳහා අප තුළ පවතින උනන්දුව, උවමනාව සහ උද්‍යෝගය වැඩිවන තරමට දේව වරප්‍රසාද අප වෙත ගලාගෙන ඒමට අප විවෘත කරන දොර කවුළු තව තවත් පුළුල් වේ. දේව වරප්‍රසාද සෑම පුද්ගලයකුටම නොමිළේ එක හා සමානව ලැබෙන දෙයකි. නමුත් එයට අප දක්වන ප්‍රතිචාරය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ. ඒ අනුව අපගේ පෞද්ගලික ජීවිතයේ ශුද්ධවන්ත භාවයේ ගුණාත්මකභාවයද පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.

ශුද්ධවන්තයන් දෙදෙනෙක් එක සමාන නොවෙති. සෑම ශුද්ධවන්තයෙක් තුළම ඔහුට හෝ ඇයටම ආවේනික වූ. අනන්‍ය වූ සුවිශේෂත්වයක් ඇත, සලකුණක් ඇත. සෑම අතින්ම එක හා සමාන වූ ශුද්ධවන්තයන් දෙදෙනෙකු ලෝකයට අවශ්‍ය නැත. දෙවියන් වහන්සේගේ වරප්‍රසාදවල ක්‍රියාකාරීත්වයේ විවිධත්වය සහ නිර්මාණශීලිත්වය එයයි.

සාන්තුවරයන් අතර පවතින විවිධත්වය තුළින්ම දෙවියන් වහන්සේගේ නිර්මාණශීලීත්වයේ පොහොසත් බව සහ සශ්‍රීකත්වය කදිමට පිළිබිඹුවේ. දේව වරප්‍රසාද සෑම තත්පරයකදීම අරුම පුදුම දේවල් ඉටුකරයි. නමුත් එය සිදුවන්නේ ඉතා නිසලවය, අපට එකවරම ග්‍රහනය නොවන ආකාරයටය. අපගේ දෛනික ජීවිතයේ ඒකාකාරී, අතිශයින් සාමාන්‍ය සිදුවීම් දේව වරප්‍රසාදයේ රඟ මඬලය.

තේරීස් තුමිය, අතිශායින්ම සාමාන්‍ය දේවල්, ඒකාකාරී යැයි සළකන දේවල්, අතිශයින්ම අසාමාන්‍ය උනන්දුවකින්, උද්‍යෝගයකින් ඉටුකරන ලදී. එතුමියගේ සමස්ත ජීවිතයම ඊට සාක්ෂි දරයි. දෙවියන් වහන්සේ ක්‍රියා කරන්නේ අප කිසිසේත්ම නොසිතන ආකාරයටය. එතුමිය එම කාරණය අත්දකින ආකාරය ගැන මෙසේ ලියා තිබේ.

"මම තවත් දෙයක් ගැන ඉගෙන ගතිමි. එනම් මනුෂ්‍ය ආත්මයන්ට ස්වාමින් වහන්සේ කොපමණ ප්‍රේමකරන සේක්ද කියාය. මෙම ප්‍රේමය බොහෝ විට බැහැපත් ආත්මයන් තුළ, ලෝක ප්‍රසිද්ධ ආත්මයන් තුළ බබලනවාට වඩා දීප්තිමත් ලෙස බබලයි. මහෝත්තම වූ දෙවියන් වහන්සේ අප වෙත වැඩම කිරීමට පහත්වීම සැබැවින්ම ප්‍රේමයේ ලකුණක් වන්නේය. අපගේ නිසරුකම වැඩිවන ප්‍රමාණයට උන්වහන්සේගේ පහත්වීමද වැඩි වන්නේය. එබැවින් ආත්මයක නිසරුකමේ ප්‍රමාණයට ඒ වෙත පැමිණෙන දෙවියන් වහන්සේගේ ප්‍රේමය මහත්වන බවට කිසිම සංකාවක් නොමැත්තේය. හැඬීම විනා අන් කිසිවක් කරන්නට නොදන්නා බෙලහීන ළදරුවන්ද, යම් සාර්ථක වෘත්තියක් කරන්නට අපොහොසත් වූ අසරණ බල රහිත මනුෂ්‍යයන්ද උන්වහන්සේ මවා ඔවුන්ගේ හෘදයන් වලට පවා වැඩම කිරීමට තරම් පහත් වූ සේක.

තමන්ගේ නිසරුකමින් උන්වහන්සේගේ සිත ඇද ගත්තාවූ "කෙතෙහි මල්" වනාහි මෙම ආත්මයෝ වෙති. මෙපමණ පහත බැසීමට කරුණාවන්ත වීමෙන් දෙවියන් වහන්සේ, තමන්වහන්සේගේ අනන්ත අප්‍රමාණ මහිමතාවය ප්‍රකාශ කරන සේක. සූර්යයා එකවිටම කිහිරි ගසට සහ කුඩා මලටත් එළිය දෙන්නේ යම් සේද, එසේම දිව්‍ය සූර්යයාණෝ සෑම ලොකු කුඩා ආත්මයන්ට දිව්‍යාලෝකය දෙවා වදාරමින් සියල්ලන්ටම තමන්ගේ යහපත් දේ බෙදා දෙන සේක. අගයෙන් ඉතා කුඩා වූ 'පා කරෙට්' නම් මලටද අනිකුදු මල්වලට මෙන්ම ප්‍රබෝධමත් වීමට කාලයක් ස්වභාව ධර්මයෙන් නියම කොට තිබේ."

**(නිමි)**

**(මීළඟට "ඔබ යක්ෂයාගේ මිතුරෙක්ද?" යන්න බලාපොරොත්තුවන්න).**



මහාචාර්ය **ඇන්ටන් මීමන**



# මානව ජීවිතය අධ්‍යාත්මික චාරිකාවකි - 4

## විශ්වාසය - 1

ක්‍රිස්තියානි ඇදහිල්ල හෝ විශ්වාසය (Christian faith) කිසිසේත්ම අන්ධ වු යථාර්ථයක් නොවේ. අන්ධ විශ්වාසය (Blind faith) යන සංකල්පය ක්‍රිස්තියානි සංකල්පයක් නොවේ. ක්‍රිස්තියානි දහම එවැන්නක් කිසිදාක උගන්වා නැත. ක්‍රිස්තියානි විශ්වාසයේ මූලික ස්වරූපය ගැන කිසිදු අත්දැකීමක් නැති පුද්ගලයන් විශ්වාසය අන්ධ බව ප්‍රකාශ කරති. ඔවුන් එසේ ප්‍රකාශ කරන්නේ කරුණු ගැඹුරට හදාරන්නේ නොමැතිව ඉතා මතු පිට දැනුමක් මඟින්ය.

යම් පමණක විශ්වාසයක් නොමැතිව මේ ලෝකය තුළ එක තත්පරයක් වත් ජීවත් විය නොහැකිය. අප ආපන ශාලාවකට ගොස් ආහාර ගැනීම විශ්වාසයේ ක්‍රියාවකි. (An act of trust) හේතුව එම ආහාරපාන වලට වස විස දමා නොමැති බවට අප විශ්වාස කර ඒවා අනුභව කිරීමයි. එම ආහාරපාන වල පිරිසිදු භාවය කෙරෙහි අප තුළ විශ්වාසයක් නැත්නම් ඒවා අනුභව කිරීමට අපි සාමාන්‍යයෙන් අදි මදි කරමු.

එමෙන්ම පොදු බස් රථයක ගමන් කිරීමේදී එම රියදුරු මහතාගේ ලයිසන් බලපත්‍රය අපි පරීක්ෂා නොකරමු. එයට හේතුව ඔහුට වාහනයක් පැදවීමට නීතිමය අවසරය සහ සුදුසු කමක් ඇති බවට අප තුළ විශ්වාසයක් පැවතීමයි. අප අසල් වැසි නිවසකට ගොඩ වැදුණු අවස්ථාවක අපට තේ කෝප්පයක් පිළිගැන් වූ විට අපි එය විශ්වාසයෙන් පානය කරන්නෙමු. එම තේ කෝප්පයට කෙළ, හොටු. සෙම් හා කැහි දමා පිළියෙල කර නොමැති බව අපි විශ්වාස කරමු. අප එම තේ කෝප්පය පානය කිරීමට පෙළඹෙන්නේ එවැනි විශ්වාසයක්, සැක නැති බවක්, ශ්‍රද්ධාවක් අප තුළ සුළු වශයෙන් හෝ පවතින නිසයි. එසේම අප දිනපතාම උදේට පාසලට, කාර්යාලයට, කර්මාන්ත ශාලාවට, වැඩ බිමට සහ කඩ මණ්ඩියට යන්නේ නැවතත් නිරුපද්‍රිතව හවසට ගෙදර පැමිණිය හැකිය යන විශ්වාසය නිසයි. මද වශයෙන් හෝ එවැනි විශ්වාසයක් නොමැති නම් කිසිම පුද්ගලයෙක් කිසිම දිනයක කිසිම හේතුවක් නිසා එළියට පහළට නොබසිනු ඇත. අප එළියට පහළට බසින්නේ අවට ලෝකය පිළිබඳව. අපගේ අසල්වැසියන් පිළිබඳව අප තුළ යම් ප්‍රමාණයක හෝ විශ්වාසයක් තිබෙන නිසයි.

අපගේ එදිනෙදා ජීවිතයෙන් මෙවැනි උදාහරණ දහස් ගණනක් පෙන්වා දිය හැකිය. ඒ හැම දෙයක් දෙසම බලා ගැඹුරට මෙනෙහි කිරීමේදී අපට අවබෝධ වන්නේ විශ්වාසය යන ගුණාංගය නොමැතිව මෙලොව තුළ ජීවත්වීම කිසිසේත්ම කළ නොහැකි බවය. විශ්වාසය නොමැතිව අප ජීවත් වීමට උත්සාහ කළහොත් අප අසාමාන්‍ය ලෙස මානසික අසහනයට පත් වේ. මානසික රෝගීන් බවට පත් වේ.

අපගේ දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම් වලදී සහ අනෙකුත් පුද්ගලයන් සමඟ කටයුතු කිරීමේදී අපගේ විශ්වාසය අධිකවීම යනු අනවශ්‍ය ලෙස කරදර වන ප්‍රමාණය, මැසිවිලි නගන ප්‍රමාණය, නාහෙන් අඬන ප්‍රමාණය අඩු වීමයි. එමෙන්ම අපගේ විශ්වාසය අඩුවූ විට, පළුදු වු විට, අප මැසිවිලි නගන ප්‍රමාණය අධික වේ. විශ්වාසයට වෙනත් සහතිකයක්, ඇපයක් හෝ ගැරන්ටි එකක් නොමැත. විශ්වාසයේ එකම සහතිකය, ගැරන්ටිය විශ්වාසයම මිස වෙනත් කිසිවක් නොවේ. අපට විශ්වාස කිරීමට නොහැකි පුද්ගලයකුට ආදරය කිරීම ඉතාමත් දුෂ්කර කාර්යයක් වන්නේ ඒ නිසයි. යම්කිසි පුද්ගලයකු කෙරෙහි අපගේ විශ්වාසය වැඩි වර්ධනය වන විට එම පුද්ගලයාට ආදරය කිරීම පහසු වන්නේ එම හේතුව නිසාවෙනි. එවිට එම පුද්ගලයා කෙරෙහි අප තුළ ඇති ප්‍රසන්නතාවය, අගය කිරීම සහ කැමැත්ත තව තවත් අධික වේ.

ඉහත සඳහන් උදාහරණ මඟින් අපට දෙවියන් වහන්සේ කෙරෙහි ඇති විශ්වාසය ගැන නිවැරදි අවබෝධයක් ලැබිය හැකිය. අපගේ සර්ව සම්පූර්ණ නොවූ, දුර්වලකම් සහිත අසල්වැසි පුද්ගලයන්ව අපට යම් තරමක් දුරට හෝ විශ්වාස කළ හැකි නම්, ආපන ශාලාවකට ගොස් සැකයක් නොමැතිව ආහාර වේලක් අනුභව කළ හැකි නම්. තේ කෝප්පයක් වස විස දමා නොමැති බවට සැකයක් නොමැතිව එය පානය කළ හැකි නම්, රියදුරු මහතා කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තබා බසයක හෝ දුම්රියක ගමන් කළ හැකි නම්, උදයෙන් ගෙදරින් පිටවී නැවතත් සුරක්ෂිතව ගෙදරට පැමිණෙන විශ්වාසය අප තුළ පවතී නම්, සමස්ත විශ්වයම මවන ලද, මිනිස් අප ඇතුළු අනෙකුත් සියලු ජීවීන් දෛනිකව පෝෂනය කරන, සමස්ත මානව සංහතියටම කොන්දේසි විරහිතව ආදරය කරන, අපගේ පාපකාරී සිතුවිලි සහ ක්‍රියාවන් වලට නැවත නැවතත් සමාව දෙන දෙවියන් වහන්සේ කෙරෙහි කොතරම් අචල, ගැඹුරු, ශක්තිමත් විශ්වාසයක් අප විසින් දියුණු කර ගත යුතුද?

අපට දෛනිකව හමුවන පුද්ගලයන් කෙරෙහි ඇති විශ්වාසයත්, දෙවියන් වහන්සේ කෙරෙහි ඇති විශ්වාසයත් එකම කාසියේ පැති දෙකය. මට රියදුරු මහතෙක්ව විශ්වාස කළ හැකි නම්, තේ කෝප්පයක් කෙරෙහි පූර්ණ විශ්වාසය තැබිය හැකි නම්, සර්ව සාධාරණ වූ, යහපත් වූ, කරුණා සාගරයක් වූ, සාමකාමී වූ, සියළු දෙයක්ම තේරුම් ගත හැකි වූ, සැබෑ ආදරයේ උල්පත වූ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසයක් ඇති කර ගැනීමට නොහැකි ඇයි?

දෙවියන් වහන්සේ කෙරෙහි තබන විශ්වාසය නිසා, මා වඩා කාරුණික, වඩා දයා හරිත, වඩා සාමකාමී, වඩා සංවේදී, වඩා අවංක, වඩා නිහතමානී, වඩා ප්‍රඥාවන්ත, වඩා ඉවසිලිවන්ත, වඩා ධෛර්යමත්, වඩා විනය ගරුක, වඩා ආත්ම දමනය සහිත සහ මාගේ සතුරාටත් කොන්දේසි විරහිතව ආදරය කළ හැකි සහ සේවය කළ හැකි පුද්ගලයෙක් බවට පත් වේ නම් දෙවියන් වහන්සේ කෙරෙහි තබන විශ්වාසය අන්ධයයි කියන්නේ කෙසේද?

ඉදිරි කලාපයට... »

දැල්වෙන පහන්

# පඬිවත්ත කුරුසියේ සොහොයුරින්ගේ 50 වසරක මතක සටහනින් බිඳක්!

මහවැලි නදියේ පහස ලබමින් මනරම් සුන්දර පරිසරයක පිහිටි පඬිවත්ත නම් වූ ග්‍රාමයේ පනස් වසරක සේවා කාලය සනිටුහන් කරන කුරුසියේ සොහොයුරියන් විසින් දෙව්ඳු ආදරය ජනතාව අතර මාංශගත කරවමින් ආ ගමනේ සුන්දර මඟ පිළිබඳ කෙරෙන ආවර්ජනයකි මේ.

ඇමරිකාවේ සිට අප ලක් දෙරණට සපැමිණි මෙරිනෝල් නම් නිකායේ සොයුරියෝ වර්ෂ 1949 සිට 1959 සැප්තැම්බර් මාසය දක්වා මහනුවර රෝහල තුළ තම සේවාවන් සිදුකරනු ලැබූහ. එම වකවානුව තුළ සෞඛ්‍ය අමාත්‍යාංශයේ බලධාරින් විසින් රෝහල් සේවාවෙන් ඉවත්ව යන ලෙසට එම සොයුරියන් දැනුවත් කරන ලදී. එය දැනගත් මහනුවර රදගුරු ලෙස එවක සේවා කටයුතු කළ බෙනදිකාන නිකායේ අතිඋතුම් ලියෝ නානායක්කාර හිමිපාණෝ පඬිවත්ත ග්‍රාමය තුළ අඛණ්ඩව ඔවුනගේ සේවාවන් පවත්වාගෙන යන ලෙසට ඔවුනට ඇරයුම් කරනු ලැබූහ. එම කාරුණික ඇරියුම පිළිගත් මෙරිනෝල් නිකායේ සියලුම සොයුරියන් මහත් උද්යෝගයකින් යුතුව 1960 වර්ෂයේ දී මාතෘ නිවහනක් ආරම්භ කර එයට 'සාන්ත බර්නාඞ් මාතෘ නිවහන' යනුවෙන් නම් තැබූහ. එහෙත් ඉහත සඳහන් නිකායේ සියලුම සොයුරියන් විදේශිකයන් වීම මත ඔවුනට ශ්‍රී ලංකාව තුළ විසීමට 'වීසා' බලපත්‍ර ලබා ගැනීම අවශ්‍යවූයෙන් ඒ සඳහා විශාල පිරිවැයක් දැරීමට ඔවුනට සිදුවූහ. මෙම තත්ත්වය මෙරටට සමුදීමට මෙරිනෝල් නිකායට හේතුවක් විය.

එසේ වුවද මෙම සේවයේ යථාර්ථය තේරුම් ගත් අතිඋතුම් ලියෝ නානායක්කාර හිමිපාණෝ එම සේවාව අගයමින් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා එවක පේරාදෙණිය නම් වූ ග්‍රාමයේ සේවා කටයුතු කළ කුරුසියේ සොයුරියන්ගේ නිකාය වෙත ඇරියුමක් කරනු ලැබීය. එම ඇරියුම සම්බන්ධව ශ්‍රේෂ්ඨ සොයුරියන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව මෙරිනෝල් සොයුරියන් ආරම්භ කළ එම සේවාව අප නිකාය තුළින් තවදුරටත් දියත් කිරීමට තීරණය කෙරිණි. පසුව පඬිවත්ත තුරුසියේ හවුලේ ආරම්භක සොයුරියන් ලෙස මාරි සෙසිල්. ක්‍රිස්ටබල් සෙබස්තියන්, සෙලින් ජෝර්ජ් සහ එස්තර් රාජපක්ෂ යන සොයුරියෝ සේවය ආරම්භ කළහ. මෙරිනෝල් සොයුරියන් විසින් මෙතෙක් පවත්වාගෙන එන ලද මාතෘ නිවාසය සහ බෙහෙත් ශාලාව ඉතාමත් ත්‍යාගශීලිව හදපිරි සතුටින් කුරුසියේ සොයුරියන්ට භාරදෙන ලදි.

මෙම සේවාව පවත්වාගෙන යාම සඳහා ඇති ඉඩකඩ පිළිබඳව අවධානය යොමු කළ අතිඋතුම් ලියෝ නානායක්කාර හිමිපාණෝ එවක සිටි එම්. වී. බෙලවේන්ද්‍රන් නම් වු පරිත්‍යාග ශීලින් විසින් තිළිණකරන ලද පණඩිවත්ත පාතිමා දේවස්ථානය ආශ්‍රිතව පිහිටි ඉඩමක් අප හට වෙන්කර දීමට තීරණය කරනු ලැබීය. පසුව මහනුවර පදවියේ සහ ප්‍රංශයේ අපගේ මූලස්ථානයෙන් ලද ආධාර හා උපකාර වලින් මෙම භූමිභාගයේ මාතෘ නිවාසය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට හැකි විය. එම අලංකාර ගොඩනැගිල්ල ඉදිකිරීම ගරු මාරි සෙසිල් සොයුරියගේ අධීක්ෂණය යටතේ සිදු වූවක් බව ඉතිහාසය අනාවරණය කරයි. එලෙසම ග්‍රාමයේ දුප්පතුන් සඳහාම ආරම්භ කරන ලද මෙම සේවාව කර ගෙන යාම සඳහා අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය සහ අනෙකුත් අවශ්‍යතා මෙරිනෝලි සොයුරියන්ගේ හඳුන්වාදීම තුළ 'මැඩෝනා පදනම් අයතනයෙන්' (MADONA FOUNDATION) සපයා ගැනීමට හැකිවිය.

ආරම්භයේ දී අපගේ මෙම සේවාව සාර්ථකව කර ගෙන යාම සඳහා අප සොයුරියන්ට දැඩි කැපවීමකින් හා මහත් පරිශ්‍රමයකින් සේවය කළ නෙවිල් ප්‍රනාන්දු, අබේසිංහ, නොයෙල් අල්විස්, සෝමසුන්දරම් සහ සෙසිල් ගොඩමුන්නේ යන වෛද්‍යවරුන්ගේ නාමයන් මෙම මොහොතේ අප සිහිපත් කරනුයේ හද පිරි සතුටිනි.

> තම නිවෙස් වලින් නිසි රැකවරණයක් නොලබන ජීවිතයේ සැඳෑ සමයට පියමං කරන මවුවරුනට මෙන්ම මහලු වියට පත්වූවනට ද පඬිවත්ත අප සොයුරියන්ගේ නිවහන තෝතැන්නක් වී ඇත. ඔවුනට සෙත සලසමින් ඔවුනගේ අවසාන ජීවිත කාල පරිච්ඡේදය තුළ සතුටින් නිදහසේ භුක්ති විඳින්නට අප සොයුරියන්ගේ නිවහන ඔවුන් වෙනුවෙන් විවෘතව පවතිනු ඇත.

ඉන්දියාවේ ට්‍රිචිනාපලි වල අප නිකායේ ප්‍රාදේශීය නිකාය නායිකාව ලෙස ගරු මාරි සෙසිල් පැවදි සොයුරිය තේරී පත්වීමත් සමගම එතුමියට අප ලක් දෙරණින් සමුගැනීමට සිදු විය. අනතුරුව එම තනතුරට තේරී පත්වූ අයිරින් මෝතා පැවදි සොයුරිය පඬිවත්ත කන්‍යාරාමයේ ප්‍රධාන සොයුරිය ලෙසටත්, ශ්‍රී ලංකාද්වීපයේ මිෂනාරී සේවයේ ප්‍රධාන සොයුරිය ලෙසටත් හිමිකම් ලැබුවාය.

සාත්තු සේවයේ නියැලී සිටින සොයුරියන්ට තම සේවාවේ අවැසිතාව පිළිබඳ තවදුරටත් සිතා බලන්නට සිදුවූයේ රජයේ රෝහල් වල ආරම්භයත් සමගම ය. සාන්ත බර්නාඩ් මාතෘ නිවාසයෙන් මෙතෙක් කර ගෙන ආ සේවාව තව දුරටත් අත්‍යවශ්‍ය සේවාවක් නොවන බව විශේෂඥ වෛද්‍ය සේවාවන්හි ආරම්භයත් සමඟ අප සොයුරියන්ට අවබෝධ විනි. මෙම සේවාවන්ට සමුදෙනවාත් සමගම අතවරවලට ලක් වූ මව්වරුන්ගේ දරුවන්ට රැකවරණය සලසමින් පසුව ඔවුන්ව පරිවාසය මගින් දරුකමට දෙන ලදී.

එහෙත් මෙම සේවාව කරගෙන යාමේදී උද්ගත වේ යයි සැලකූ යම් යම් කරුණු කාරණා පිළිබඳ ව ලද උපදෙස් පරිදි එම සේවාවට ද සමුදීමට අප සොයුරියන්ට සිදුවිය. නිකායෙන් ගමට සේවාවක් සිදුවිය යුතුය යන සංකල්පය මත මහනුවර රදඋතුම් පෝල් පෙරේරා හිමිපාණන් සහ එවකට අනුනායක පියතුමන් හා සෙඩෙක් ආයතනයේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ වර්තමානයේ මහනුවර පදවි එඩේරාණන් වන අති උතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන් සමඟ සාකච්ඡා කරන ලදුව මෙතෙක් කරගෙන ආ සේවාවන් වෙනත් මගකට යොමු කරමින් 'ග්‍රාමීය පූර්ණ කාන්තා අධ්‍යාපන' වැඩසටහන දියත් කරන ලදී. මෙහි පෙරමුණගෙන කටයුතු කිරීමට බර්නඩෙත් ප්‍රනාන්දු පැවදි සොයුරිය සමත් වූවාය.

වතුකරයේ වෙසෙන ජනතාවගේ ජීවිත නගා සිටුවීමේ අරමුණින් අප සොයුරියන් විසින් පල්ලෙකැලේ, දිගන, මාබෙරිතැන්න, තෙල්දෙණිය, දොඩන්ගොල්ල, රංගල යන ප්‍රදේශවල දිවිගෙවන ජනතාව බැහැදැකිමින් ඔවුන්ගේ ජීවිත ප්‍රශ්න හා අධ්‍යාත්මික ප්‍රශ්න හමුවේ සංවේදී විය. මෙම කාර්යයේ නියැලීම සඳහා ආරම්භයේ දී අප සොයුරියන්ට බොහෝ දුක් කරදර වලට මුහුණ පාන්නට සිදුවිය. කඳු හෙල් නගිමින් දෙපා වීර්යයෙන් බොහෝ දුර කතර ගෙවා ජනතාව අතර මාංශගත වූයේ දෙව්ඳු ආදරයෙන් ඔවුන් පොහොණි කිරිම සඳහාම ය. එම අවස්ථාවේදී වතුකර ජනතාවගේ දූ දරුවන්ගේ අධ්‍යාපනයේ මූලික අඩිතාලම ගැන අවධානය යොමු කළ අප සොයුරියන් පෙර පාසල් ආරම්භ කරමින් එම පෙර පාසල් පවත්වාගෙන යාම සඳහා එම ප්‍රදේශයන්හි ම තරුණියන් පුහුණු කිරීමටත් දැරූ ප්‍රයත්නය දරුවන්ගේ ජීවිත වලට අධ්‍යාපනයේ මූලික මං පෙත් විවර වූ බව සැබෑ කරුණක් විය.

පඬිවත්ත ග්‍රාමයේ ජනතාවගේ හා ඒ අවට ජනතාව වෙනුවෙන් පෙර පාසල් අධ්‍යාපනයත්. දහම් පාසල තුළ සේවයේ නියැලෙමින් දරුවන් දහමින් පෝෂණය කරන්නට පෙරමුණ ගෙන කටයුතු කරන ලදී. මෙම සේවාවන් සොයුරියන් විසින් අද දක්වාම පවත්වාගෙන එනු ලැබේ. තම නිවෙස් වලින් නිසි රැකවරණයක් නොලබන ජීවිතයේ සැඳෑ සමයට පියමං කරන මවුවරුනට මෙන්ම මහලු වියට පත්වූවනට ද පඬිවත්ත අප සොයුරියන්ගේ නිවහන තෝතැන්නක් වී ඇත. ඔවුනට සෙත සලසමින් ඔවුනගේ අවසාන ජීවිත කාල පරිච්ඡේදය තුළ සතුටින් නිදහසේ භුක්ති විඳින්නට අප සොයුරියන්ගේ නිවහන ඔවුන් වෙනුවෙන් විවෘතව පවතිනු ඇත.

අප නිකාය තුළ ආධුනික සොයුරියන් පුහුණු කිරීමේ ප්‍රථම අවධිය පඬිවත්ත කන්‍යාරාමයට අනුබද්ධිතව පවත්වාගෙන යනු ඇත. එලෙසම අසරණ සරණ පතා වර්තමාන අවශ්‍යතාව තුළ අවදිවන අප නිවහන යුද්ධයෙන් අවතැන්වූ දරුවන්ගේ හිසට සෙවනක් ද වී ඇත. ජාති කුලමල ආගම් භේද දුරලන අප සියලුම සොයුරියන්ගේ ආදරයට එම දරුවන් ග්‍රහනයකර ගැනීමට සමත්වීම දරුවන් තුළ පවතින සාංකාව නැතිකර ලීමට හේතුවක් වී ඇත.

මෙවන් වූ උදාර සේවාවන් රැසක නියැලෙමින් නිරන්තරයෙන් ම කාලයේ සලකුණු වලට සංවේදී ව තම සේවාවන් නිසිමං ගන්වන්නට වැරදරන අප සොයුරියන්. නිරන්තරයෙන් දෙව්ඳුන් හා සමීපව කටයුතු කරයි. කිතු සමිඳුන්ගේ දූත කාර්යයේ නියැලෙමින් උන්වහන්සේව තම ජීවිතයෙන් සහ තම සේවාවෙන් ජනතාව අතර මාංශගත කරවන්නට උත්සුක වෙති.

මෙවන් සේවාවන්හි නියැලෙන්නට ඔවුන් මෙහෙයවනු ලැබූ දෙවි මහෝත්තමයාණන් ට අපගේ ප්‍රශංසාවත් හදපිරි බැතියත් පුදකරමු. 50 වන සංවත්සරය සමරන මෙම උතුම් මොහොතේ මෙවන් වූ සේවාවන් වල නියැලෙමින් දෙව්ඳු ආදරය මාංශගත කරවන්නට උත්සුක වන පඬිවත්ත අප නිවහනේ සියලුම සොයුරියන්ට ඔවුනගේ සේවාවන් වඩාත් ඵල බරිතව ඉදිරියටම ගෙනයන්නට දෙව්ඳු වරම් ප්‍රාර්ථනා කරමු

**ගරු ශිරාණි ෆොන්සේකා**
**පැවිදි සොයුරිය**
කැළණිය

# කිතුනු සමාජසේවියාගේ දිගු මෙහෙවරින් බිඳක් !

දලුගම මීසමට අයත් දිප්පිටිගොඩ පාතිමාවේ අප ස්වාමිඳුවගේ සභාවේ ජීවත්වන ජෝශප් කැලීස්ටස් සමරතුංග ළමාවියේ සිටම කැපී පෙනෙන චරිතයක් විය. පනහේ දසකයේ අග භාගයේදි දිප්පිටිගොඩ දරුවන්ගේ කියවීමේ රුචිය වඩන අදහසින් 'එක්සත්' ළමා පුස්තකාලයක් ආරම්භ කර ඉතා හොඳින් පවත්වාගෙන ගියේ ගමේ සැම දරුවකු තුළම සමඟිය සමාදානය පවතින අයුරින්ය.

පාතිමා දෙව්මැඳුරේ ළමා සමිතියක් ද තරුණ සමිතියක් හාපුරා ඇති කළේද මොහුය. එසේම දිප්පිටිගොඩ දෙව්මැඳුරේ සැම ඉරුදිනකම දිව්‍ය පූජාවන් පැවැත්වීමට මොහු ලේකම්ධූරය දැරූ තරුණ සමිතිය මෙහෙය වීය. එය ඉතා සාර්ථක විය. ගම්පහ ඉදිගොල්ල දෙව්මැඳුරෙන් පූජකවරුන් කැඳවාගෙන විත් එම දේව මෙහෙය පැවැත්වීය. එසේම කලාගුරි මර්සලින් ජයකොඩි පියතුමාගේ ප්‍රධානත්වයෙන් දෙව්මැඳුරට ආධාර පිණිස එළිමහන් නත්තල් කැරොල් ගී ප්‍රසංගයන් පැවැත්වීමටද මොහු මුල් විය.

දලුගම රෝමානු කතෝලික පිරිමි විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හැදෑරූ මොහු මරදාන මධ්‍ය මහ විද්‍යාලයෙන් උසස් පෙළ අධ්‍යාපනය හැදෑරීය. උපාධිධාරියකු වන මොහු සංඛ්‍යා ලේඛන හා තර්ක ශාස්ත්‍රයෙනුත් දේශපාලන විද්‍යාවෙනුත් විශ්ව විද්‍යාල පශ්චාත් උපාධි හදාරා ඩිප්ලෝමා සහතික ලබා තිබේ. වෘත්තියෙන් ගුරුවරයකු වූ මොහු අනුරාදපුරයේදී කෘෂිකර්ම ඩිප්ලෝමාවක්ද ලබා ඇත. වත්තල සා. අන්තෝනි විද්‍යාලයේ දිගුකලක් නියෝජ්‍ය විදුහල්පති ධූරය හොබවා විශ්‍රාම ගියද ඔහු තවමත් කඳාන මැසනද් විද්‍යාලයේ ශිල්ප බෙදාදෙන ගුරුවරයෙකි. ස්වෙච්ඡා කැඩෙට් භටයකු වූ මොහු එහිදි සෙකම් ලෙප්ටිකල් තනතුරක් ද දැරීය.

සා. ජෝන් ගිලන් රථ හමුදාවේ මූලස්ථාන සහකාර කොමසාරිස්වරයකු ලෙසද බාලදක්ෂ ව්‍යාපාරයේ ලී පදක්කම් ලභියකු ලෙස තවමත් සේවය කරයි.

මොහු කැළණිය ප්‍රදේශයේ පොදු ජනතාවගේ හිත්දිනා ගත් සමාජ සේවකයෙකි. විවිධාකාරයෙන් අඩු ආදායම් ලබන ජනතාවට සේවය කර ඇති. මොහු කැළණිය ගම්සභාවේ හා කැළණිය උප නගර සභාවේ දිප්පිටිගොඩ ආසනයේ අපරාජිත නියෝජිතයා ලෙස කැලණිය පුරා නම්දරා සිටි ශ්‍රී ලංකා නිදහස් පක්ෂ, කැලණියේ ආරම්භක සාමාජිකයාවු මක්ෂිමියානු මැම්බර් මහතාගේ පවුලේ ජ්‍යෙෂ්ඨතම පුත්‍රයාද වේ.

සමථ මණ්ඩල සාමාජිකත්වය දිගුකලක සිට දරණ මොහුගේ සේවය අගයා රජය විසින් දිවයිනපුරා සාමදාන විනිශ්චයකාර පදවියක්ද ලබා දී තිබේ.

**ඡායාරූප සටහන:**
**හැඳල තිඹිරිගස්යාය ජූලියන් ගුණවර්ධන**

# සිනමාව වෙනුවෙන් කැපවූ මීගමුවේ අසහාය කලාකරුවා


**ලොව වැඩිම චිත්‍රපට ගණනක සහාය අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරමින් වාර්තාවක් පිහිටුවා ඇත්තේ බ්‍රිතාන්‍ය ජාතිකයකුවූ ගස් අගස්ටස්ය. 1985 වනවිට ඔහු සහාය අධ්‍යක්ෂ වරයා ලෙස චිත්‍රපට 20 ක වැඩකර තිබුණි.**

එම වාර්තාව බිඳ හෙළුවේ පුංචි රෝමය නමින් හඳුන්වන මීගමුවේ උපත ලැබූ හෙළ කලාකරුවෙකි. කිතුනුවකුවූ ඔහු ඇන්ටන් ග්‍රෙගරිය. ඔහු 1985 වන විට චිත්‍රපට 42 ක සහාය අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කර ඇත.

23 වන ජුවාම් පාවුළු පාප්තුමා ලංකාවට පැමිණි අවස්ථාවේ උන්වහන්සේගේ ලංකා ගමන වාර්තා චිත්‍රපටය අධ්‍යක්ෂණය හා සංස්කරණය කළේ ඇන්ටන් ග්‍රෙගරිය. ඒ දිසානායක චිත්‍රපට වෙනුවෙනි.

පාසල් සමයේ දී චිත්‍රපට නරඹමින්, එහි අවස්ථා ප්‍රතිරූපණය කරමින්. අධ්‍යයනය කරමින් සිටින අවධියේ 'ධීවරයෝ' චිත්‍රපටයේ දර්ශන ගැනීමට අධ්‍යක්ෂ එම්. මස්ථාන් ඇතුළු කාර්මීක ශිල්පීන් සහ නළු නිළියන් මීගමුවට පැමිණියෝය. එම්. මස්ථාන් ළඟට ගොස් චිත්‍රපට කර්මාන්තයට ඇතුළු වීමට ඇති ආශාව පැහැදිලි කළ ඇන්ටන් ගැන පැහැදුන මස්ථාන් ඔහුට සිනමා කර්මාන්තයට ඇතුළු වීමේ දොරටුව විවෘතකර දුන්නේය.

එම්. මස්ථාන් අධ්‍යක්ෂණය කළ සිනමාස් සමාගම නිපදවූ 'අල්ලපු ගෙදර' චිත්‍රපටයේ ප්‍රධාන සහාය අධ්‍යක්ෂ ලෙසින් කටයුතු කරමින් සිනමාවට පිවිසි ඇන්ටන් ග්‍රෙගරි 'යළි පිපුන මලක්', 'සංඛපාලි', 'කිරි සුවඳ', 'පාරමිතා', සහ 'සූර සරදියෙල්' ඔහු අධ්‍යක්ෂණය කළ චිත්‍රපටය. එඩී ජයමාන්න සහ රුක්මණි දේවි 'ජයරුක්' නිවස උකස් කර හැදූ 'සිරියලතා' චිත්‍රපටය පසුකලෙක පැත්තකට විසිකර තිබියදී ඔහුගේ කාර්මික ඥාණයෙන් නැවත ප්‍රදර්ශනය කිරීමට සැලැස්වූයේ ඇන්ටන් ග්‍රෙගරිය. ඔහු ඒ සඳහා රුක්මණි දේවි, එඩී ජයමාන්න ඇතුලත් වන ලෙස අලුත් දර්ශණ රූගත කර



ප්‍රතිසංස්කරණය කර තිබුනේ ප්‍රේක්ෂකයන් පමණක් නොව විචාරකයන්ද පුදුමයට පත් කරමිනි. සිවාජි ගනේෂන් හා මාලිනි ෆොන්සේකා රඟපෑ පයිලට් ප්‍රේමනාත්, ජෙය සංකර්, රාධිකා, නාගේෂ්, ගීතා කුමාරසිංහ හා අනෝජා වීරසිංහ රඟ පෑ 'රත්තතින් රත්තමේ' යන චිත්‍රපටවල සහාය අධ්‍යක්ෂවරයා වූයේ ද ඇන්ටන් ග්‍රෙගරිය. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනම දැන සිටීම නිසා ග්‍රෙගරිට සිනමාවේ දීර්ඝ ගමනක් ඒමට හැකි වූ බව මගේ අදහසය.

මස්ථාන් යටතේ විජය චිත්‍රාගාරයේදී කැමරා අංශය, ශබ්ද පරිපාලනය, රසායනාග ාර කටයුතු, සංස්කරණය, තිරනාටක ලිවීම අධ්‍යක්ෂණය ඉගෙන ගැනීමේ වාසනාව ලද ඇන්ටන්ට තම දක්ෂකම් පෙන්වීමට අවස්ථාව, සලසා දුන්නේද මස්ථාන්ය. මස්ථාන් රට හැර යද්දි සිනමා සහාය අධ්‍යක්ෂවරයෙක් ලෙසින් ඇන්ටන් ග්‍රෙගරිව හඳුන්වා දුන්නේය. ඔහු සිනමාව තුළ කළා වූ විශිෂ්ට සේවාව වෙනුවෙන් 1987 දී ඕ. සී. අයි. සී සම්මානය, 2006 'කලා භූෂණ' සම්මානය, 2007 මීගමුව පුරපති නිමල් ලාන්සා සම්මානයද හිමිකර ගනිමින් ගෞරවයට පාත්‍ර විය.

සිනමාව වෙනුවෙන්ම තම ජීවිතය කැප කළ ඇන්ටන් මේ වනවිට සැඳෑ සමය ගෙවමින් තම උපන් ග්‍රාමයේම පදිංචිව සිටියි. 1983 ජාතිවාදි කෝලහලයේදි ද්‍රවිඩ කලාකරුවන් පිරිසකගේ ජීවිත රැක දුන් සිද්ධිය සිහිකර දෙමින් මෙම ලිපිය නිම කරන්නට සිතුවෙමි.

'වැල්ලවත්තේ බ්‍රයිට්නි ෆිල්ම්ස්' වෙනුවෙන් 'උයර්න්ද උරවුගල්' දෙමළ චිත්‍රපටය විජය චිත්‍රාගාරයේ කැමරා ගත කරමින් සිටියදී ජාතිවාදි කෝලහලය ඇවිලීගෙන විජය චිත්‍රාගාරය දෙසටද පැමිණියේය. ඒ වනවිට එහි රඟ පෑමට පැමිණ සිටි ද්‍රවිඩ නළු නිළියන් වන සරත් බාබා, විජය කුමාර්, මංජුලා නාගෙස් කරගත හැකි කිසිවක් නොමැතිව බයේ ගැහෙමින් සිටියදි, තවත් පසෙකින් ඇඳිරි නීතිය පනවා තිබියදි දෙවියන් වහන්සේගේ ආශිර්වාද ඉල්ලා සිටි ඇන්ටන් වාහනයක (සීට්) ආසන යටට නළු නිළියන් රිංගෙව්වේය. ඒ උඩ කොට්ට, මෙට්ට, ඇඳ ඇතිරිලි දමා වසා ඇන්ටන් වාහනයේ ඉදිරිපස පිටස්තර අයට පෙනෙන ලෙස වාඩි විය. රියැදුරු වාහනයේ එළියට ගනිද්දි කෑ ගැසූ පිරිසක් 'ඒ ඇන්ටන් ග්‍රෙගරි මහත්මයානේ' යන්න දීපල්ලායි කීවෝය. විශේෂ අවසරයක් පොලිස් පතිගෙන් ලබාගත් ඇන්ටන් ඇඳිරි නීතිය පනවා තිබියදීම කටුනායකට ගොස් ඔවුන්ව ඉන්දියාවට යැවීමට කටයුතු කර ආපසු ආවේ 'දෙවියන්ට ස්තූති' වේවායි කියමිනි.

**හෙන්රි ප්‍රියශාන්ත මෙන්දිස්**

## මීගමුවට ... 1 පිටුවෙන්

අගරදගුරු හිමිපාණන් මෙලෙසින් ප්‍රකාශ කළේ, මීගමුව ප්‍රදේශයේ දරුවන් හා තරුණයන් ඉලක්ක කරගෙන පැතිරයන මත්කුඩු ඇතුළු විවිධාකාර අපචාරයන්ට විරුද්ධව මීගමුව දිසාවේ පියතුමන්ගේ මූලිකත්වයෙන් සංවිධානය කරන ලද විරෝධතා රැළිය අවසානයේ රැස්ව සිටි මහා ජනකාය අමතමිනි. විශේෂයෙන් මීගමුව ප්‍රදේශයෙන් බිහිවූ පක්ෂ විපක්ෂ දේශපාලකයන්ගෙන් එතුමා ඉල්ලා සිටියේ මෙවන් අපචාරයන්ට රුකුල් නොදී ඒවාට විරුද්ධවන ලෙසය. දේශපාලකයන්ගේ කැඳවීම හා වගකීම වනුයේ සේවය කිරීමය. තවද අප හැමගේ වගකීම මෙවන් අපචාරයන්ට විරුද්ධ වීම යැයි කාදිනල් හිමිපාණෝ වැඩිදුරටත් පැවසූහ.

මහවීදිය සා. මරියා දේවස්ථානයෙන් ආරම්භ කළ මේ රැළිය දිසාවේ සියලු පියතුමන් සහ පැවිදි සොයුරියන් පෙරටු කරගෙන මහා වැසි නොතකා වැල්ලවීදිය මීසම හරහා පළඟතුරය දේවස්ථානයේ දී කාදිනල් හිමිපාණන්ගේ මූලිකත්වයෙන් පැවැත්වුණු දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදයෙන් අවසන් විය.

## සහභාගිශීලි ... 1 පිටුවෙන්

මෙවර සමුළුවට විදේශීය ගිහි පැවිදි 90 ක් ද, ලාංකික ගිහි පැවිදි 50 ක් ද සහභාගි වූහ. දකුණු අප්‍රිකාව, ජර්මනිය, බංග්ලාදේශය, ඉන්දුනීසියාව, ඉන්දියාව, දකුණු කොරියාව, මියන්මාරය, මොන්ගෝලියාව, මලයාසියාව, පිලිපීනය, පාකිස්ථානය, සිංගප්පූරුව, තායිලන්තය, තායිවානය, ස්විට්සර්ලන්තය හා ශ්‍රී ලංකාව මෙවර සමුළු වාරයට එක්විය.

අති උතුම් කිංස්ලි ස්වාමිපිල්ලේ රදගුරු හිමිපාණන්ගේ මග පෙන්වීම මත අසිපා ජාතික අධ්‍යක්ෂ ගරු එරික් ප්‍රනාන්දු පියතුමා හා අසිපා කාර්ය මඩුල්ලේ නිමල් පෙරේරා ඇතුළු පිරිස කටයුතු සංවිධානය කළහ.

## ලෝක රදගුරු ... 1 පිටුවෙන්

ඓහිකවාදය, දෙවන වතිකාන කතිකාවේ මඟ මානව හිමිකම්, ආගමික නිදහස, සංක්‍රමණය, කතෝලික සමාජ දර්ශනය, ධර්මෝපදේශකයන්, දේව ධර්මය, දරිද්‍රතාවය, ජනතාව මුදවාලීම, නව ව්‍යාපාරයන්ගේ ගමන් මඟ, විද්‍යාව හා තාක්ෂණය, කිතුනු සභා එකමුතුව සහ ඉස්ලාම් දහම සමග සංවාදය යන මූලික තේමාවන් ඔස්සේ මේ යෝජනා සැකසී ඇත. දික්කසාද වූවන් යළි විවාහ වීම හා අසාමාන්‍ය පවුල් වෙත අවධානය යොමු කර ඇති අතර විවාහ නොවී එකට දිවි ගෙවන යුවළ, දික්කසාද වූ අය යළි විවාහ වීම ආදී ගැටලු ගැන ද අවධානය යොමු වී ඇත.

## මඩු පුදබිමට ... 1 පිටුවෙන්

එමෙන්ම ප්‍රාතිහාර්යයේ පුදබිමක් වන මරුද මඩු කඳවුර වන්දනාවේ ස්ථානයක් මිස විනෝද ගමන් සඳහා ස්ථානයක් නොවන බවද ගරු පියතුමා අවධාරණය කරයි.

## ක්‍රිස්තියානි ... 3 පිටුවෙන්

ඔසොවාලන්නට දැනටත් වඩා උත්සුක විය යුතුමය. සැබැවක් ම කියන්නේ නම් සභා එඬේරුන් තම බැටළුවන් සොයමින්, ඔවුන් පිළිබඳ විපරමේ යෙදෙමින් දයාන්විත සිතින්, සැබෑ ම කැපවීමෙන් කෙටියෙන් ම කියන්නේ නම් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් ඔවුන් අතරට යා යුතු ම හෝරාවයි, මේ.

මෙය තවත් ප්‍රමාද කරන්නට බැරිය, කිසිසේත් ම බැරිය.

මේ කියන තරම් පහසු කටයුත්තක් නො වන්නේය. අපහසුයි කියා පසෙකින් තැබිය හැකි ද නො වන්නේ ය. කතෝලික සභාවේ ප්‍රමාදය. උදාසීනත්වය, මන්දෝත්සාහය මූලධර්මවාදීන්ගේ කුමන්ත්‍රණකාරී, ප්‍රයෝගකාරී ප්‍රයත්නයකට සවි බල දෙන දිරි උත්තේජනයක් ම වනු සිකුරු ය. අප සභාව මෙතෙක් ආ සාම්ප්‍රදායික ගමන් මඟ තුළ ක්‍රිස්තු දර්ශනයේ හරයාත්මක වටිනාකම්, ඉහළ නංවන්නට ගත් ක්‍රියා මාර්ගයන් ප්‍රමාණවත් තරම් එල දරා තිබේ ද? මෙය ද මැදහත්ව විමසා බැලිය යුතු ප්‍රශ්නයකැයි හඟිමි. ඒ ගමන් මඟ කිසිදු ප්‍රතිඵලයක් ලබා දී නැතැයි කියන්නට තරම් ඉක්මන් නොවෙමි, අකෘතඥ ද නො වෙමි. එහෙත් ප්‍රතිඵලයෙහි ප්‍රමාණාත්මක බව නම් ප්‍රශ්නයකි.පිය දෙවිඳුන් වඩිනට, වෙසෙනට කැමතිම මන්දිර වන්නේ අපගේ සුපිවිතුරු සිත් මැඳුරු ම යි. අපගේ සිත් එතැනට ඔසොවා ගන්නට අපට ඇත්තේ එක ම මඟයි. ඒ ක්‍රිස්තු දර්ශනයයි. සැබෑ ම ගැලවීමේ, සැබෑ ම මඟ එයයි. ක්‍රිස්තුතුමන්ගේ මාංශය හා රුධිරය වන්නේ එතුමන්ගේ දර්ශනය මැයි. ඒ හා මාංශගතවීම. ඒකාත්මිකවීම තුළ සැබෑ ගැලවීම යි. මේ සැබෑ තැනට කතෝලිකයාගේ භක්තිය දිසාගත කරමින්, ඔවුන් කතෝලික සැදැහැවතුන් කිරීම සභාව ඉදිරියේ ඇති බරපතළ අභියෝගයයි.

අන්න ඒ අභියෝගය ජය ගන්නට හැකි වන අන්දමින් පරිසරය සකස් කරන්නේ නම් මූලධර්මවාදීන්ගේ සියලු ප්‍රයත්නයන් නිස්සාර, ඵලරහිත, පුස්සක් වනු නියතය.

දැනට බොහෝ මීසම්වල ක්‍රියාත්මක වන කුඩා කිතුනු සංඝ වඩාත් සංවිධානාත්මක තත්ත්වයකට පෙළ ගස්වාලීම ද, ඒවා ක්‍රියාත්මක නොවන මීසම්වල කඩිනමින් ආරම්භ කර කාර්යක්ෂම ව හා අරුත්බර ලෙස ගරු පියතුමන්ලාගේ නිරීක්ෂණයන් තුළ සක්‍රිය කිරිම ද යහපතක් වනු ඇත.ක්‍රිස්තියානි මූලධර්මවාදීන්ගේ ප්‍රයත්නයන්ගෙන් අපි අවදි වෙමු. අප සිටිනා තැන, අප යන මඟ නිවැරදි දැයි සිතමු. අඩු තැන්. වැරැදි තැන් විමසා දැන ගනිමු. ඒවා පිරිපුන් කර ගැනුමට, නිවැරැදි කර ගන්නට නිසිම නිසි පිළියම් සොයා ක්‍රියාත්මක කරමු.

කතෝලික සභා නවෝදයක් සඳහා කතිකාවත් පවත්වමින්, නොයෙකුත් ව්‍යාපෘතීන් සකස් කරනට වෙහෙසෙන මෙවන් වකවානුවක පෙර සඳහන් පරිදි කාලෝචිත වූ ද, කල්පවත්නා වූ ද මල් බර, ඵල බර ක්‍රියා මාර්ගයනට අවතීර්ණ වන්නට සභා නායක කාරකාදීනට සුදතුම් එළියෙන් පැණසර සවි බල නො අඩුව ම ලැබේවා!යි ආදරණීය ව ප්‍රාර්ථනා කරමු.අප කතෝලික ජනතාව ක්‍රිස්තු දර්ශනය තුළ නිසි තැන් ගැන්වීමේ අභියෝගය ජයගනිමු.

අප අනුව එන්නට ක්‍රිස්තියානි මූලධර්මවාදීනට ද ක්‍රිස්තු ප්‍රේමයේ ආරාධනා පිළිගන්වමින් වෛරයෙන් ද, ද්වේශයෙන් ද තොරව සැබෑ සහෘදත්වයේ දැත් දිගු කරනට කතෝලික අපි ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් අදිටන් බරව ද, අරුත් බරව ද පෙළ ගැසෙමු.

# "එකෝස් ඔෆ් හෙවන් II - 2012

**නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රංග ශාලාවේ තිරය විවෘත වනුයේ මොරටුව ශා. සෙබස්තියන් විදුහලේ කන්තාරු කණ්ඩායමේ මියුරු ගී රාවය හමුවේය.**

එය විවෘත වනුයේ එම විදුහලේ "93 ආදි සිසු කණ්ඩායමේ" අඛණ්ඩ වෙහෙස නිසාවෙන්මය. සාන්ත සෙබස්තියන් කන්තාරු කණ්ඩායම, ශාන්ත ජෝසප් විදුහල, කොළඹ 10, සා. පීතර විදුහල කොළඹ 04, ශු. පවුලේ කන්‍යාරාමය, කොළඹ 04 හා මොරටුව ජයලත් අප ස්වාමිදුවගේ කන්‍යාරාමය සමඟ 2012 නොවැම්බර් 04 ඉරුදින සවස 6.30 ට එකමුතුව ගයන්නේය. මෙම අති දක්ෂ කන්තාරු කණ්ඩායම් ඉතා මියුරු වූ ජනප්‍රිය හා සම්භාව්‍ය ගීත හා ගීතිකා එකතුවක් ඔබ වෙත ඉදිරිපත් කිරීමට සැරසී සිටී.

සා. සෙබස්තියන් විදුහල් කන්තාරු කණ්ඩායම එම විදුහලේ ආදි සිසුවකු වූත්, උප විදුහල්පතිවූත් ගරු නිරන්ජන් ප්‍රනාන්දු පියතුමාගේ නිර්මාණයකි. එතුමා විශිෂ්ට සංගීත කතුවරයකු, සංගීතඥයකු හා රදගුරු පදවි කන්තාරු කණ්ඩායමේ සංගීත ගුරුවරයකු ද වන්නේ ය. මෙතුමාගේ ප්‍රමුඛත්වය හා නොමඳ කැපවීම ශා. සෙබස්තියන් කන්තාරු කණ්ඩායමේ විශිෂ්ටභාවයට හේතුවී ඇත. එම විශිෂ්ටත්වය සංගීතයට ප්‍රිය කරන්නාවූ සියලු දෙනාගේ සිත් ඇද ගැනීමට සමත්ව ඇත.

ශා. සෙබස්තියන් විදුහලේ තවත් ශ්‍රේෂ්ඨ ආදි සිසුවකු හා ප්‍රවීණ පියානෝ වාදකයකු වන ශිහාන් චම්බා මහතා මෙම කන්තාරු කණ්ඩායමේ නිරතුරු පුහුණු කිරීම් කටයුතුවල නියැලී සිටී.

මෙම අති උතුම් කාර්යභාර්ය ඉතා වගකීමෙන් හා කැපවීමෙන් යුක්තව ඉටු කරන්නේ ය. මෙම තරුණ මහතා තම විදුහල වෙනුවෙන් අනාගතයේ දී ත් කැපව සිටී යයි විදුහලේ සැමගේ පැතුම වේ.

මෙම අපූරු ගීත ඉදිරිපත් කිරීම් පුහුණු කටයුතුවල යෙදෙන ඔන්ඩ්‍රේ ඩේවිඩ් මහතා විදුහලේ කන්තාරු කණ්ඩායම සමඟ 2008 වසර සිටම එක්ව කටයුතු කරන්නෙකි. මෙතුමාගේ සහයෝගිතාවය දිරිගැන්වීම හා ශක්තිය විදුහලේ තරුණ කන්තාරු කණ්ඩායමේ ආත්ම විශ්වාසය වැඩි දියුණු කිරීමට හේතු වී ඇත. මෙතුමා වසර 12 සිට කන්තාරු කණ්ඩායම්වල පුහුණු කිරීමේ කටයුතු, සංගීත විනිශ්චය කටයුතුවල නියැලී සිටින ප්‍රමුඛයෙකි. ඩේවිඩ් මහතා "කලම්බෝ මියුසික් ෆෙස්ටිවල්" හි කලා අධ්‍යක්ෂ වරයකු ද, "ඩේවිඩ් ඇකඩමි ඔෆ් පර්ෆෝමින් ආර්ට්ස්" හි අධ්‍යක්ෂ ද ආදී කර්තෘ හා සුප්‍රකට සංගීත අධ්‍යක්ෂ මේරි ඈන් ඩේවිඩ් මහත්මියගේ පුතනුවන් ද වේ.

"එකෝස් ඔෆ් හෙවන් - II 2012" සංගීතමය පිරිනැමුව චන්න හා උපුලී රංගායතනයේ රංගනයෙන් තව තවත් ඔප නැංවේ.

අති තාර, ස්වර තාර, ස්වර හා මධ්‍ය ස්වරයෙන් යුක්ත වූ සා. සෙබස්තියන් කන්තාරු කණ්ඩායම පරිපූර්ණ කණ්ඩායමක් වේ. මෙම සංගීත කණ්ඩායමේ ප්‍රමිතිය උද්යෝගීතාවය හා ජවය කලා නගරයක් වන මොරටුවෙන් හට ගන්නා සලකුණු යයි නොඅනුමානය. පුහුණුකරුවන් හා පුහුණු වන්නන්ගේ නොමඳ උත්සාහය හා විධිමත් පුහුණුව මෙම කන්තාරු කණ්ඩායමේ සාර්ථකත්වයට හේතු වී ඇත. සියලු දෙනාගේත් ඔවුන්ගේ දෙමාපියන්ගේත් කැපවීම අගය කළ යුතුමය. මෙම කණ්ඩායම පිහිටවූ පළමු දිනයේ සිටම ඔවුන්ගේ උපරිම සහය මෙම කණ්ඩායම නගා සිටුවීමේ ලා ප්‍රධාන රුකුලක් විය.

මෙම සංගීත උලෙළෙන් උත්පාදනය වන සියලු මුදල් යෝජිත සා. සෙබස්තියන් ක්‍රීඩා සංකීර්ණයේ වැඩකටයුතු සඳහා යොදා ගන්නා බවත්, පසුගිය ගායනා උලෙළේ උත්පාදනය ශා. සෙබස්තියන් විදුහල් දෙව්මැඳුරේ ඉදිකිරීම් කටයුතු සඳහා යොදාගත් බවත් දැනුම් දිය යුතුවේ. "93 ආදි සිසුන් තනි ආදි සිසු කාණ්ඩයක් ලෙස ඉහළම පරිත්‍යාගය වන රු. මිලියන 1.5 ක මුදලක් දේවස්ථානය ඉදි කිරීම වෙනුවෙන් පිරි නැමුවේය.

සංගීතයේ මියුරුබව අත්විඳීමට කැමැත්ත දක්වන සියලු දෙනා වෙනුවෙන් නොවැම්බර් 04 වන ඉරුදින සවස 6.30 නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ ශාලාවේ පැවැත්වෙන සමූහ ගායනා උලෙළට සහභාගි වීමට සතුටින් ආරාධනය කරමු.

ප්‍රවේශ පත්‍ර සා. සෙබස්තියන් විදුහල් දොරකඩ, සරසවි පොත්හල නුගේගොඩ, ජයලත් අප ස්වාමිදුවගේ කන්‍යාරාමය මොරටුව, කොළඹ ක්‍රෙස්කැට් හි "කැඩපත", කේ - සෝන් මොරටුවෙන් ලබාගත හැකි අතර අන්තර්ජාලය ඔස්සේ www.tickets.lk මඟින්ද ලබා ගත හැකිය.

ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම පිළිබඳව විමසීම් සඳහා 0771237733 යන ක්ෂණික ඇමතුම් අංකය විවෘතව ඇත. ප්‍රවේශ පත්‍ර සීමිත බැවින් ඔබගේ ටිකට් පත නොපමාව ලබා ගන්න.

# ගොඩැල්ල මීසමේ විශේෂ පෝෂණ වැඩමුළු රැසක්



**ගොඩැල්ල මීසමේ අභිවෘද්ධිආලේපය සක්‍රමේන්තුව ලබා ගැනීම සඳහා සූදානම් කරන දරුවන් සඳහා විශේෂ පෝෂණ වැඩමුළු රැසක් මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමාගේ සංවිධානයෙන් විවිධ තේමාවන් ඔස්සේ දක්ෂ වෘත්තිකයන් මඟින් සිදුකරන ලදි.**

එම පෝෂණ වැඩසටහනේ අවසාන වැඩසටහන ඥානාර්ථ ප්‍රදීපයේ සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසින් සිදුකරන ලදි. ගොඩැල්ල සා. සෙබස්තියන් මුනි දෙව්මැඳුරේ දී පැවැත්වූ මෙම සම්මන්ත්‍රණය "නූතන ජනමාධ්‍ය භාවිතය හා තාරුණ්‍යය" යන මැයෙන් පැවැත්විණ.

ගොඩැල්ල මීසමේ තඹරවිල, මෝරුක්කුලිය, දන්කොටුව, ගොඩැල්ල දෙව්මැඳුරු වලට අයත් සුදතුම් වරම් අපේක්ෂා කරන සියළුම දූ දරුවන් මෙම අවස්ථාවට සහභාගි වූහ. **(එච්. ඒ. සිරිල් පෙරේරා - ගොඩැල්ල)**



**බස්නාහිර පළාත් සභාවේ ප්‍රතිපාදන යටතේ පමුණුගම මහ විදුහලේ ප්‍රාථමික අංශයට ඉදිවෙන දෙමහල් ගොඩනැගිල්ලට මුල්ගල තැබීමේ උත්සවයක් ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහිදී මුල්ගල ආසිරි ගැන්වීම බෝපිටිය මීසම් සේවක ගරු එරින්ටන් ද සිල්වා පියතුමන් අතින් සිදුවිය. මෙයට පූජ්‍ය කිරින්දේ ධම්මකුසල හිමි, පළාත් සභා මන්ත්‍රී මෙරිල් පෙරේරා සහ විදුහල්පති අනුර ගුණවර්ධන මහතුන් ද එක්වූහ. (බෙන්ජමින් කිරිහෙට්ටි)**

# ඔබේ දේව කැඳවීම නැති බැරි අයට අතහිත දීමයි

**හිංසාව, අසහනය, නැතිබැරිකම, නූගත්කම, කොන්වීම හා විවිධ අපචාරයන් ආදී ජීවන පීඩනයන්ට මැදිවූ අප සහෝදර ජනතාව අතරට යන්න. ඔවුන් වෙනුවෙන් ඇපවී, කැපවී සේවාවක් අතදීමක් කරන්න. ඔබේ සහෝදරත්වයේ දේව කැඳවීම එයයි. "සිත් සෙවන" සහයෝගිතා සංසදයට මාරිස්ට් සහෝදරයන්ගේ ද අතහිත දෙන්න අප තීරණය කළේ ඒ නිසයි.**

මාරිස්ට් සහෝදර පැවිදි නිකායේ දකුණු ආසියානු කලාපීය ප්‍රාදේශාධිපති ශාන්ති ලියනගේ සහෝදරතුමා එසේ ප්‍රකාශ කළේ මීගොමුව මාරිස්ටෙල්ලා විද්‍යාලයේ අංක 01 නිවහනේ පැවැති කටාන මූලස්ථානය කරගෙන පවත්වාගෙන යන "සිත් සෙවන" දයා සේවා සංසදයේ මීගමුව ශාඛාව පිහිටුවීමේ සමාරම්භක උත්සව සභාව අමතා විශේෂ දේශනයක් පවත්වමිනි.


"සිත්සෙවන" නිර්මාතෘ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය , කැඳවුම්කරු සෙල්ස් ප්‍රනාන්දු සහෝදරතුමා හා ශාන්ති මදුරාවල මහතුන්ද මෙහිදී දෙසුම් පැවැත්වූහ.

උත්සව සභාවට මාරිස්ටෙලා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති ගරු රංජිත්, ක්ලින්ටන්, සහෝදරතුමන්, ගරු ජෝන් ක්ලිපඩ් පියතුමා ඇතුළු මාරිස්ටෙලා ආදි සිසුන්, මීගමු පොලිස් බල ප්‍රදේශයේ සිවිල් ආරක්ෂක කමිටු නිලධාරින්, මාරිස්ටෙලා විදුහලේ ආචාර්ය ප්‍රදීප මාධ්‍යවේදී හැඩ්ලි පෙරේරා හා විවිධ ක්ෂේත්‍රවල විද්වතුන් හා ආරාධිත අමුත්තන් රාශියක් මෙයට සහභාගි වී සිටියහ. **(ජෝ. සංගපාලආරච්චි)**



**පහල මාබුල පැරකුම් අවමංගල්‍යාධාර හා සමාජ සුභ සාධන සමිතියේ මෙහෙයවීමෙන් ලේ දන්දීමේ කඳවුරක් නෙළුවත්තුඩුව ශා. අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථාන මීසම් ගෘහයේදී පැවැත්විණ. වග මීසම් සේවක ගරු ප්‍රසන්න සංජීව පියතුමා ලේ ලබා දෙන අයුරු සේයාරුවෙන් දැක්වේ.**

**(ජූඩ් රෝෂන් කස්තුරිආරච්චි)**



**මොරටුව ජයලත් අප ස්වාමිදූගේ කන්‍යාරාම විදුහලේ දැරියන්ගේ සහභාගිත්වයෙන් පසුගිය දා "විශ්වාසයේ වසර" ප්‍රකාශ කරමින් ගරු සුජීවා නෝනිස් පැවිදි සොයුරිය, නව නියෝජ්‍ය විදුහල්පතිනි ගරු චමිලා ප්‍රනාන්දු පැවිදි සොයුරිය සමඟ විශේෂිත පහන දල්වා ප්‍රකාශන පත්‍රය කියවන ලදි. පාසල තුළ විශ්වාසයේ වසර සඳහා ආධ්‍යාත්මික වැඩසටහන් කීපයක්ම ක්‍රියාත්මක කිරීමට වැඩකටයුතු දැනටමත් අරඹා ඇත. (අර්මා ප්‍රනාන්දු)**